# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# නවවැනි පාර්ලිමේන්තුව
**(තුන්වැනි සභාවාරය)**

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 59

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ තුන්වැනි වාර්තාව**
**(2022.09.07 සිට 2023.01.20 දක්වා)**

**නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති**
**ගරු අජිත් රාජපක්ෂ මහතා**
**විසින්**
**2024 ක් වූ මැයි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලදී.**

අනුමැතිය ලැබීම මත වාර්තාවට ඇතුළත් කරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| **අනු අංකය** | **අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම** | **දිනය** |
|---|---|---|
| 01. | ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.16 |
| 02. | ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.21 |
| 03. | වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.10.21 |
| 04. | කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.16 |
| 05. | වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.25 |

මේ වන තෙක් අනුමැතිය නොලැබීම හේතුවෙන් වාර්තාවට ඇතුළත් නොකරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| අනු අංකය | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම | දිනය |
|---|---|---|
| 01. | කම්කරු සහ විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.07 |
| 02. | ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.16 |
| 03. | වරාය, නාවික හා ගුවන් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.20 |
| 04. | කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.20 |
| 05. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.22 |
| 06. | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.09.23 |
| 07. | විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.10.04 |
| 08. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.10.04 |
| 09. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.10.18 |
| 10. | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.10.20 |
| 11. | මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.10.20 |
| 12. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.08 |
| 13. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.08 |
| 14. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.08 |
| 15. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.10 |
| 16. | විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.10 |

| | | |
|---|---|---|
| 17. | ආයෝජන ප්‍රවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.15 |
| 18. | වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.15 |
| 19. | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.16 |
| 20. | ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.17 |
| 21. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.21 |
| 22. | නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.22 |
| 23. | ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.22 |
| 24. | වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.23 |
| 25. | සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.23 |
| 26. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.24 |
| 27. | ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.29 |
| 28. | සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.30 |
| 29. | තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.11.30 |
| 30. | වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.12.05 |
| 31. | පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.12.06 |
| 32. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2022.12.13 |
| 33. | ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2023.01.05 |
| 34. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2023.01.17 |
| 35. | වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2023.01.19 |
| 36. | කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2023.01.20 |

### අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්ය මණ්ඩලය

- සුදත් පෙරේරා මහතා, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කාරක සභාවේ ලේකම්
- ශාන්ත ප්‍රනාන්දු මහතා, ප්‍රධාන නිලධාරී
- ශ්‍යාමා අල්විස් මහත්මිය, නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී
- ඕෂිලා වීරකෝන් මහත්මිය, නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී
- කෝසලා ප්‍රියදර්ශනී මෙනෙවිය, සහකාර ප්‍රධාන නිලධාරී
- උදේශිකා තත්සරණී වීරසිරි මෙනෙවිය, පාර්ලිමේන්තු නිලධාරී
- එස්.ඒ. උත්පලා රන්මිණී මුතුකුමාර මහත්මිය, පාර්ලිමේන්තු නිලධාරී
- රුක්මණී දේවි මහත්මිය, ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තක

### අමාත්‍යාංශ ලේකම්වරුන්

- ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා - ආරක්ෂක අමාත්‍යාංශය
- කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
- මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන මහතා - තාක්ෂණ අමාත්‍යාංශය
- නීල් බණ්ඩාර හපුහින්න මහතා - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
- කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා - වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය
- කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
- එම්.එම්.පී.කේ. මායාදුන්නේ මහතා - රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
- ආර්.එම්.අයි. රත්නායක මහත්මිය - ධීවර අමාත්‍යාංශය
- එම්. එන්. රණසිංහ මහතා - අධ්‍යාපන අමාත්‍යාංශය
- ඩබ්ලිව්.ආර්.ඩබ්ලිව්. ජේමසිරි මහතා - ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
- වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා - ජනමාධ්‍ය අමාත්‍යාංශය
- ජනක එස්. චන්ද්‍රගුප්ත මහතා - සෞඛ්‍ය අමාත්‍යාංශය
- එන්.බී.එම්.රණතුංග මහතා - ජල සම්පාදන අමාත්‍යාංශය
- එම්.බී.ආර්. පුෂ්ප කුමාර මහතා - කෘෂිකර්ම අමාත්‍යාංශය
- ආර්.එම්.සී.එම්. හේරත් මහත්මිය - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
- වසන්තා පෙරේරා මහත්මිය - අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
- ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා මහතා - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
- ජානක ධර්මකීර්ති මහතා - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- ජේ.එම්.ටී. ජයසුන්දර මහත්මිය - කර්මාන්ත අමාත්‍යාංශය
- ඩබ්ලිව්.එස්.සත්‍යානන්ද මහතා - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
- ඒ.වයි. විජේවර්ධන මහත්මිය - විදේශ කටයුතු අමාත්‍යාංශය
- සෝමරත්න විදානපතිරණ මහතා - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ මහතා - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
- වෛද්‍ය අනිල් ජාසිංහ මහතා - පරිසර අමාත්‍යාංශය
- වි. වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතා - ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
- යූ.ඩී.සී.ජයලාල් මහතා - වාරිමාර්ග අමාත්‍යාංශය
- ආර්.පී.ඒ. විමලවීර මහතා - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
- එස්. හෙට්ටිආරච්චි මහතා - මහජන ආරක්ෂක අමාත්‍යාංශය
- එස්.ටී.කොඩිකාර මහතා - වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

**ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2022 සැප්තැම්බර් 16**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (සභාපති)
ගරු ලසන්ත අලගියවන්න මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු සිරිපාල ගම්ලත් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු දිලුම් අමුණුගම මහතා
ගරු කනක හේරත් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු නීතිඥ මධුර විතානගේ මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා

**1. නියෝග සහ වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1 නියෝග සලකා බැලීම**

**(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 මාර්තු 31 දිනැති අංක 2273/76 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග** (2022.08.29 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලදි.)

2022 වසරේ අප්‍රේල් මාසය වනවිට රටේ පැවති තත්ත්වය ගමනාගමන කටයුතු සඳහා ඇති කරන ලද බලපෑම හේතුවෙන් රියදුරු බලපත්‍රවල වලංගු කාලසීමාව දීර්ඝ කිරීම අරමුණු කරගෙන මෙම ගැසට් පත්‍රය පළ කරන ලද බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය කාඩ්පත් ආනයනය කිරීමේ ගැටලු පැවතීම හේතුවෙන් රියදුරු බලපත්‍රවල වලංගු කාලසීමාව දීර්ඝ කිරීමට කටයුතු කළ බව ගරු දිලුම් අමුණුගම මහතා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව

වෙත යොමු කරන ලද ඉහත සඳහන් නියෝගයන්ට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 1.2 වාර්ෂික වාර්තා සලකා බැලීම

### 1.2.1 2020 වර්ෂය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව

සලකා බැලීමෙන් අනතුරුව, ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

## 2.1 ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වත්මන් තත්ත්වය

### 2.1.1 දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුව සතුව මේ වන විට ධාවනය වන දුම්රිය එන්ජින් වසර ගණනක් පැරණි බැවින් රේල්පීලිවල පවතින දුර්වල තත්ත්වය මත දුම්රිය ධාවන වේග සීමාවන් අඩු කරන ලෙස අනතුරු ඇඟවීම් සිදු කර ඇති බවත් වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් දුම්රිය ධාවනයට අවශ්‍ය ලිහිසි තෙල් සපයා ගැනීමේ ගැටලු පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුවේ සිදුවන අලාභය වළක්වා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිටින බවත් මෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් මීළඟ කාරක සභා රැස්වීමේදී කරුණු ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන පහළ මට්ටමක පැවතීම හේතුවෙන් එහි කටයුතු සිදුකරගෙන යාමේ අපහසුතාවයක් පවතින බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙම දෙපාර්තමේන්තුව සතුව ඇති ප්‍රධාන ආදායම් මාර්ගය දුම්රිය ප්‍රවේශපත් ගාස්තු බවත් ගරු අමාත්‍යතුමාගේ මැදිහත්වීම මත මෑතකදී මෙම ගාස්තු ඉහළ නැංවීමට කටයුතු කළ නමුත් ඒ තුළින් බලාපොරොත්තු වන ඉලක්ක සපුරා ගැනීමට නොහැකි අතර ලිහිසි තෙල්වල අධික මිල ද මේ සඳහා බලපාන බවත් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මීළඟ වසරේ අයවැය තුළින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන මගින් දුම්රිය මාර්ග නඩත්තු කිරීමේ සහ දුම්රිය මාර්ග පුළුල් කිරීමේ කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඉන්දියානු රජයේ ණය ආධාර යටතේ ඇතැම් දුම්රිය මාර්ග කොටස් ඉදිකිරිමේ කටයුතු සිදු කෙරෙන බවත් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ දුම්රිය

කාර්යක්ෂමතාව නංවාලීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ රේල්පීලි 10,000 ක් මිලදී ගැනීම, දුම්රිය සඳහා අමතර කොටස් මිලදී ගැනීම, කොටුව දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීම, දුම්රිය ධාවනය සඳහා අවශ්‍ය වන සන්නිවේදන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම, ප්‍රවේශපත් නිකුත් කිරීම ඉලෙක්ට්‍රොනික ආකාරයට සිදු කිරීම වැනි කටයුතු සිදු කෙරෙන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 2.1.2 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

මෙම ආයතනය විසින් ඉතා පැරණි ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබන බවත් මූල්‍ය කළමනාකරණය නව තාක්ෂණයට යොමු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහි පවතින පැරණි ක්‍රමවේදයන් හේතුවෙන් නිවැරදි සංඛ්‍යාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම අපහසු බැවින් දුම්රිය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදු කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා අමතර කොටස් සහ ටයර් මිලදී ගැනීමේ ගැටලු පවතින බවත් ඉන්දියානු ණය ආධාර යටතේ අලුතින් බස්රථ 500 ක් මිලදී ගැනීම ලබන වසර වනවිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම අලුතින් බස්රථ 80 ක් මිලදී ගෙන පාසල් බස්රථ සේවාවක් ආරම්භ කිරීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මාකුඹුර බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය මෙන් කඩවත බස්නැවතුම්පළ වැඩිදියුණු කරන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් උපදෙස් ලබා දී ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම ලෝක බැංකු ගිවිසුමක් යටතේ මහනුවර බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 2.1.3 ජාතික ගමනාගමන කොමිෂන් සභාව

මාර්ග බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය නැවත සලකා බැලීම සඳහා වැඩපිළවෙළක් සකස් කරන තෙක් දැනට පවතින බලපත්‍ර ලබා දීමේ තරඟකාරී ක්‍රමවේදය අනුගමනය කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 2.1.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් විශාල පැමිණිලි සංඛ්‍යාවක් පැවති බවත් මීට හේතු වූ දීර්ඝකාලීන ගැටලු සඳහා විසඳුම් ලෙස විවිධ ක්‍රියාමාර්ග යෝජනා වී තිබූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු නවීන තාක්ෂණය යොදාගෙන ඩිජිටල්කරණය කිරීම සුදුසු බව පිළිගත් බැවින් ඒ අනුව ඊ මෝටරින් (E-Motoring) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමඟ නාරහේන්පිට පිහිටි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වේරහැර ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු වූ නමුත් වර්තමානයේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම වැළැක්වීම සඳහා රජයේ තක්සේරුකරුගේ කුලී පදනම මත, වඩා පහසු ස්ථානයක මෙම දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන මෙම වසර අවසන් වීමට පෙර ඊ මෝටරින් (E-Motoring) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන විසින් කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

වර්තමානයේ රටෙහි පවතින මූල්‍ය අර්බුදකාරී තත්ත්වය මත වෙනත් ස්ථානවලට යොමු නොවී දැනට දෙපාර්තමේන්තුව තිබෙන ස්ථානයේම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරු කුමාර වෙල්ගම මහතා විසින් විමසීමක් කරන ලදී.

වර්තමානයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන නාරහේන්පිට ගොඩනැගිල්ලේ නවීන තාක්ෂණය යොදා ගැනීමට අවශ්‍ය පහසුකම් නොමැති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වර්ග අඩි 15,000 ක් පමණ ඉඩ ප්‍රමාණයක් නව ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය බවත් එය ලබා දුන් වහාම නව ව්‍යාපෘතිය ආරම්භ කළ හැකි බවත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

දැනට තිබෙන මෝටර් රථ ආඥා පනත අනුව විදුලි මෝටර් රථ ලියාපදිංචි කිරීමට නොහැකි බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දිය හැකි පරිදි පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව, මෙම මස අවසන් වීමට පෙර අදාළ සංශෝධන ඇතුළත් කර පනත සංශෝධනය කිරීමට කටයුතු කරන බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

තව ද, මේ වන විට දේශීය නිෂ්පාදකවරුන් විසින් විදුලියෙන් ක්‍රියාත්මක වන වාහන නිෂ්පාදනය කර ඇති බවත් එම වාහන සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන පිරිවිතරයන් සකස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම වාහන සඳහා අවශ්‍ය විදුලිය ලබා ගැනීම සඳහා සූර්යබල ශක්තිය යොදා ගැනීම මෙන්ම වෙනත් විදුලිජනන උපකරණ යොදා ගැනීමට එම නිෂ්පාදකවරුන් විසින් කටයුතු කරන බවත් ප්‍රාදේශීය වශයෙන් ඇතැම් සමාගම් විසින් ආරෝපණ

මධ්‍යස්ථාන ඇති කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වත්මන් තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව නව කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරමින් සිටින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඉදිරි වසරේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට අපේක්ෂා කරන කටයුතු සම්බන්ධයෙන් වාර්තාවක් මීළඟ කාරක සභා රැස්වීමේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දෙන ලදී.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ඊ මෝටරින් (E-Motoring) ව්‍යාපෘතිය සහ ආර්.එෆ්.අයි.ඩී (Radio Frequency Identification - RFID) තාක්ෂණය යටතේ වාහන අංක තහඩු ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතනවල වත්මන් තත්ත්වය සහ ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව කෙටි වාර්තාවක් මීළඟ කාරක සභා රැස්වීමේදී ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 3. වෙනත් කරුණු

### 3.1 ගරු නීතිඥ මධුර විතානගේ මහතා

#### 3.1.1 දේශීය මෝටර් රථ නිෂ්පාදනය දිරිමත් කිරීම

මේ සම්බන්ධයෙන් අවධානය යොමු වීම ඉතා වැදගත් බවත් මීට පෙර මෙවැනි නිෂ්පාදන කටයුතුවල නිරත වූ එක්තරා පෞද්ගලික ආයතනයකට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය සහයෝගය නොලැබුණු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි දේ අනාගතයේදී සිදු නොවීමට දෙපාර්තමේන්තුව තුළම මේ සඳහා වෙනම ඒකකයක් සහ ප්‍රධානියෙක් පත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සම්බන්ධයෙන් අවධානය යොමු කරන බවත් මෙම වසර අවසන් වීමට පෙර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 3.1.2 මාර්ග නඩත්තු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කටයුතු නැවැත්වීම නිසා ඇතිවන බලපෑම

මාර්ග නඩත්තු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කටයුතු මේ වන විට නවත්වා ඇති බැවින් ඒ සඳහා යොදා ගත් යන්ත්‍රෝපකරණ එම ස්ථානවල තිබීම මෙන්ම ඇතැම් ස්ථානවල සංවර්ධන කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් ඇතිව තිබෙන

අනාරක්ෂිත තත්ත්වය මත ජනතාවට අනතුරු සිදු වීමට හැකියාව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සංවර්ධන ව්‍යාපෘතිවල මේ වන විට අවසන් කර ඇති කොටස් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී මිලියන 100 කට වඩා වැඩියෙන් ගෙවීම් කිරීමට ඇති පාර්ශව වෙනුවෙන් පොලී ගෙවීමේ පදනම යටතේ බැඳුම්කරයක් ලබා දීමටත් මිලියන 100 ට වඩා අඩුවෙන් ගෙවීම් කිරීමට ඇති පාර්ශව වෙනුවෙන් මේ වසර තුළදී ගෙවීම් කිරීමටත් බලාපොරොත්තු වන බව මුදල් අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.1.3 පළාත් පාලන ආයතනවලට මාර්ග සංවර්ධනය සඳහා අවස්ථාව ලබා දීම

පළාත් පාලන ආයතන විසින් ඇතැම් මාර්ග සංවර්ධන කටයුතු සිදු කළ හැකි නමුත් මේ වන විට නිකුත් කර ඇති චක්‍රලේඛයක් හේතුවෙන් එම කටයුතු සිදු කිරීමට හැකියාවක් නොමැති බැවින් මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.1.4 එම් 11 එන්ජින් ගෙන්වීමට අදාළ තාක්ෂණික වාර්තාව

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ එම් 11 එන්ජින් ගෙන්වීමට අදාළ තාක්ෂණික වාර්තාව කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.2 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව සතු පරිහරණය නොකරන ඉඩම් ආයෝජන කටයුතු සඳහා යොදා ගැනීම - ගරු අසංක නවරත්න මහතා

ප්‍රධාන මාර්ගවලට යාබදව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව සතුව විශාල ව්‍යාපාරික වටිනාකමක් ඇති ඉඩම් පවතින බැවින් ප්‍රාදේශීය මට්ටමින් මෙම ඉඩම්වල ආයෝජනය කිරීමට ව්‍යාපාරික ප්‍රජාවට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඇතැම් ප්‍රදේශවල දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඇති ඉඩම්වල විවිධ පිරිස් අනවසරයෙන් පදිංචි වී සිටින බවත් මෑතකදී එම ස්ථාන නිරීක්ෂණය කර ඔවුන්ගෙන් අය විය යුතු බදු මුදල් ලබා ගැනීමට කටයුතු කළ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, ඇතැම් ඉඩම් අඩු කුලී මුදලකට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන විශාල මුදලකට අතුරු බදු දීමට කටයුතු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු නීතිඥ මධුර විතානගේ මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

පවතින ක්‍රමවේදය තුළ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම අපහසු බැවින් පොදුවේ මෙවැනි කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බවත් ඒ අනුව ඉඩම් පවරාගෙන වාණිජ වටිනාකමක් ඇති ඉඩම් ව්‍යාපාර කටයුතු සඳහා යෙදවීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සමාගමක් ස්ථාපනය කිරීම සඳහා මෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වලින් බදු අයකර ගැනීම සඳහා ද ගරු සභාපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 2 ක් ඉදිරිපත් කළ බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව වියදම් කළමනාකරණ කමිටුව විසින් ලබා දුන් උපදෙස් පරිදි දුම්රිය දෙපාර්තමේන්තුව සතු සියලුම ඉඩම් හඳුනාගෙන ඒවා කළමනාකරණය කිරීම පිළිබඳව වැඩපිළිවෙළක් සකස් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

තව ද, මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් උපයා ගනු ලබන ආදායම ප්‍රමාණවත් නොවන බැවින් මෙම ආදායම ඉහළ නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.3 ගරු යදාමිණී ගුණවර්ධන මහතා

### 3.3.1 කොස්ගම - එගොඩහ ප්‍රදේශයෙන් දුම්රිය ආරම්භ කිරීම

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පෙරවරු කාලයේදී ධාවනය කරනු ලබන කහහේනෙන් ආරම්භ කරන දුම්රිය, කොස්ගමින් ආරම්භ කිරීමට කටයුතු කිරීමෙන් ඊට ආසන්න ප්‍රදේශවල ජනතාවට විශාල සේවයක් සැලසෙන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කැළණිවැලි දුම්රිය මාර්ගයේ මේ වන විට කොස්ගම සිට හෝමාගම දක්වා දුම්රිය මාර්ගයේ එක් දුම්රියක් ධාවනය වී මිනිත්තු 28 ක් ගත වන තෙක් සංඥාවල ඇති ගැටලු හේතුවෙන් තවත් දුම්රියක් ඇතුල් කිරීමට හැකියාවක් නොමැති බවත් මෙම වසර අවසන් වීමට පෙර මිනිත්තු 8 කට වරක් දුම්රිය ධාවනය විමට හැකි වන පරිදි සංඥා ක්‍රමය වෙනස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දුම්රිය ධාවනයේදී වග සහ පාදුක්ක අතර මිනිත්තු 25 ක ගමන් අන්තරයක් ඇති බවත් මාසයක කාලයක් ඇතුළත එය මිනිත්තු 12 ක තෙක් පරිවර්තනය කළ හැකි බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි) විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම මෙම වසර ඇතුළත එය මිනිත්තු 6 ක සීමාවට අඩු කළ හැකි බවත් ඒ හා සමගාමීව ඊට ඔබ්බෙන් කොළඹ දෙසට ධාවනය වන දුම්රිය ගමන් අන්තරය මිනිත්තු 8 ක් පමණ විය හැකි බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි) විසින් දැනුම් දෙන ලදි.

අවිස්සාවෙල්ල - කොස්ගමින් ආරම්භ වන දුම්රියට අමතරව වග, ලබුගම සහ කලටුවාව සිට පැමිණෙන මගීන් වෙනුවෙන් කාර්යාල දුම්රියක් ආරම්භ කරන ලද බවත් සංඥා ක්‍රමය සකස් කිරීමෙන් පසු ධාවනයට අලුතින් දුම්රියක් ඇතුල් කිරීමට හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එතෙක් දැනට ධාවනය වන දුම්රිය ගමනාන්තය වන කොස්ගමට ධාවනය කර නැවත පැමිණ, වග නතර කර ආරම්භ කිරීමට හැකි බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස උපදෙස් ලබා දුන් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මැත කාලයේදී ගෙන්වන ලද දුම්රිය ධාවනය කිරීමට නොහැකිව ධාවනයෙන් ඉවත් කර තිබීම සම්බන්ධයෙන් ගරු කුමාර වෙල්ගම මහතා විසින් විමසීමක් කරන ලදී.

මෙය සත්‍ය තත්ත්වයක් නොවන බවත් මැතදී ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මැදිරි 160 ක් ගෙන්වා මේ වන විට ඉන් මැදිරි 120 ක් ධාවනයට යොමු කර ඇති බවත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේම එම් 11 ලෙස එන්ජින් 10ක් ගෙන්වා ඉන් 7 ක් ධාවනයට යොදවා ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) විසින් දැනුම් දෙන ලදී.

මැතකදී දුම්රිය දෙපාර්තමේන්තුව විසින් දුම්රිය මාර්ග නවීකරණය කිරීමේ කටයුතු කරන බවත් දුම්රිය එන්ජින් හා මැදිරිවල ප්‍රමිතිය ඉහළ නංවා ඇති බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ වන විට දුම්රිය මාර්ග වැඩිදියුණු කර ඇති බැවින් ඒවාට ගැළපෙන පරිදි දුම්රිය මැදිරි සහ එන්ජින් ගෙන්වන නමුත් දුම්රිය මාර්ගයේ ඇතැම් ස්ථානවල පැරණි තත්ත්වයම පවතින බැවින් එම ස්ථානවල වේග සීමාව අඩු කර දුම්රිය ධාවනයට කටයුතු කරන බව දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ගෙන්වන ලද මැදිරි සහ එම් 11 එන්ජින්, ගෙන්වන ලද දින සිට සම්පූර්ණ වාර්තාවක් මීළඟ කාරක සභා රැස්වීමට ඉදිරිපත් කරන ලෙස ගරු නීතිඥ මධුර විතානගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.3.2 අවිස්සාවේල්ල සහ පුවක්පිටිය අතර ප්‍රදේශය හරහා ඇති දුම්රිය මාර්ගය ස්ථාන හතරකදී මහාමාර්ගය හරහා ගමන් කිරීම

අවිස්සාවේල්ල සහ පුවක්පිටිය අතර ප්‍රදේශය හරහා ඇති දුම්රිය මාර්ගය, ස්ථාන හතරකදී මහාමාර්ගය හරහා ගමන් කරන බැවින් මහාමාර්ගයේ ගමනාගමනය අත්හිටුවන බවත් ඊට අමතරව එම ස්ථානවලදී දුම්රියේ වේගය අඩු කිරීමට සිදු වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

විශේෂයෙන්ම මහාමාර්ගයේ ගමනාගමනය අත්හිටුවීම නිසා මෙම ප්‍රදේශයේ පොදු මෙන්ම වැදගත් ස්ථාන කිහිපයකම ක්‍රියාකාරීත්වයට බාධා ඇති වන බැවින් සහ ඉන්ධන හා කාලය අපතේ යාමක් සිදු වන බැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම තත්ත්වයට විසඳුමක් ලෙස අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාවලියට සම්බන්ධ ඉඩම් පවරා ගැනීමේ කටයුතු පළමුව සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 3.3.3 මහජන අවශ්‍යතා අනුව පහසුකම් සැලසීම සඳහා පළාත් පාලන ආයතන මැදිහත් වීම

කොළඹ නගරයට ඇතුළුවන පොදු ප්‍රවාහන බස්රථ විශේෂයෙන්ම උදය කාලයේදී අධික මගී ප්‍රමාණයක් සමඟ පැමිණීම හේතුවෙන් කොළඹ ප්‍රදේශයේ මගීන්ට එම පොදු ප්‍රවාහනය භාවිතා කිරීමට අවස්ථාවක් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නගරයේ පුරවැසියන්ගේ ප්‍රවාහන පහසුකම් සලසා දීම කොළඹ මහ නගර සභාව සතු වගකීමක් වන අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය පළාත් පාලන ආයතන සතුවන බැවින් මහජන අවශ්‍යතාවය හඳුනාගෙන අවශ්‍ය පහසුකම් සැලසීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.4 ගරු කුමාර වෙල්ගම මහතා

#### 3.4.1 ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම විසින් ගෙන්වන ලද බස් රථ, පාසල් බස් ගමනාගමනය සඳහා යොදා ගැනීම

මීට වසර 5 කට පමණ පෙර ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම විසින් ගෙන්වන ලද බස් රථ පාසල් බස් ගමනාගමනය සඳහා යොදා ගැනීම අදාළ තාක්ෂණික කමිටුව විසින් අනුමත කර නොතිබීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

2017 වසරේදී ගෙන්වන ලද මෙම බස් රථ තමා ඇතුළු නිලධාරීන් විසින් නිරීක්ෂණය කිරීමේදී මෙම බස් රථ ළමයින්ට විශේෂ ආරක්ෂිත ක්‍රමවේද අනුව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති බව නිරීක්ෂණය වූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම සමාගම සමඟ සාකච්ඡා කිරීමේදී එම බස් රථ ගෙන්වන ලද කාලයේදී පැවති විදේශ විනිමය අනුපාතයට බස් රථ ලබා දිය හැකි බවත් ධාවනය කර මාසයකට රු.3000/- බැගින් වසර 4ක් ගෙවිය යුතු බවත්, සමාගම විසින් දැනුම් දුන් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව, මෙම බස් රථ 80 පාසල් බස් ගමනාගමනයට යොදවා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දුන් බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එහෙත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුව විසින් මෙම බස් රථ පිළිගත් සම්මතයන්ට නොමැති බව දක්වමින් මෙම යෝජනාව ප්‍රතික්ෂේප කර ඇති බැවින් වෙනත් සමාගමක් යටතේ ලබාගෙන මෙම බස් රථ ධාවනය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අදාළ තාක්ෂණික කමිටුවේ වාර්තාව ලැබීමට සලස්වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.4.2 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ අතරින් ධාවනය වන බස් රථ සංඛ්‍යාව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ අතරින් එක් දිනකදී ධාවනය වන බස් රථ සංඛ්‍යාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සාමාන්‍යයෙන් බස් රථ 4700 ක් පමණ ධාවනය වන බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් දැනුම් දෙන ලදී.

ටයර් සහ බැටරි නොමැතිව බස් රථ 800 ක් පමණ තිබූ බවත් විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන එම බස් රථ සංඛ්‍යාව ධාවනයට යෙදවූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව ටයර් දාරවල ප්‍රමාණය අඟල් 22.5 ක් ඇති ටියුබ් රහිත ටයර් සහිත බස් රථ සඳහා ටයර් සොයා ගැනීමේ ගැටලුවක් ඇති බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් දැනුම් දෙන ලදී.

## 3.5 කඩුවෙල ආසනයේ පොදු ප්‍රවාහනය දියුණු කිරීම - ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

කඩුවෙල ආසනයේ ග්‍රාමීය මාර්ග කිහිපයක ධාවනය වූ බස් රථ මේ වන විට ධාවනය නොවීම හා සේවකයින්ගේ හිඟය සම්බන්ධයෙන් මීට පෙර දැනුම් දුන් බැවින් ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පැවතිය ද නව බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු බැවින් ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලා ඇති බවත් එය ලද පසු සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මෙවර බඳවා ගැනීම් කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවලින් සිදු කිරීමට තීරණය කර ඇති බව ද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පාසල් බස් රථ ධාවනයට යෙදවීමේදී කඩුවෙල ආසනයට ප්‍රමුඛතාවයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.6 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

### 3.6.1 දාරළුව දුම්රිය නැවතුම් ස්ථානයේ පවතින අනතුරුදායක තත්ත්වය

වේයන්ගොඩ සිට දාරළුව දක්වා ඇති දුම්රිය මාර්ගයේ දාරළුව දුම්රිය නැවතුම් ස්ථානයේදී දුම්රිය ඇළවීමකට ලක්වීම මත දුම්රිය වේදිකාව සහ දුම්රිය අතර විශාල හිඩැසක් ඇති වන බවත් මෙම තත්ත්වය මත මගීන් අනතුරුවලට ද ලක්වූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් මීට පෙර අවස්ථා ගණනාවකදී දැනුම් දුන් නමුත් එම ස්ථානයට පැමිණ නිරීක්ෂණය හෝ නොකළ බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අදාළ නිලධාරීන් විසින් මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තාවක් ඉදිරිපත් කළ බව දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල) විසින් දැනුම් දෙන ලදී.

මීළඟ සතියේදී එම ස්ථානය නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල) වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.6.2 අත්තනගල්ල ප්‍රදේශයේ පොදු ප්‍රවාහනය දියුණු කිරීම

අත්තනගල්ල ප්‍රදේශයේ පොදු ප්‍රවාහනය දුර්වල මට්ටමක පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.6.3 නිට්ටඹුව ඩිපෝව සතු හිස් ඉඩම එලදායී කාර්යයක් සඳහා යෙදවීම

නිට්ටඹුව ඩිපෝව සතු වැඩි වටිනාකමක් සහිත ඉඩම එලදායී කාර්යයක් සඳහා යෙදවීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.6.4 අත්තනගල්ල ආසනය වෙනුවෙන් ජල සැපයුම් ලබා දීමේදී මාර්ග කඩා හානි කිරීම

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් අත්තනගල්ල ආසනය වෙනුවෙන් ජල සැපයුම් ලබා දීමේදී මාර්ග වැඩි ප්‍රමාණයක් කඩා හානි කිරීම හේතුවෙන් ජනතාවට ඒවායේ ගමන් කිරීමට හැකියාවක් නොමැති බවත් ජනතාව අපහසුතාවයන්ට මුහුණ දෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ජල සැපයුම ලබා දීමේදී නැවත මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දී ඇති ඇස්තමේන්තුව පැරණි අනුපාතවලට අනුව සකස් කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් දැනුම් දෙන ලදී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ජල සැපයුම ලබා දීමේදී අනුමැතියක් නොමැතිව මාර්ගවලට හානි කිරීමට නොහැකි බවත් ඒ සඳහා ඔවුන් විසින් තැන්පත් මුදලක් තැන්පත් කළ යුතු බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

එහෙත් ජලයේ අවශ්‍යතාවය පෙන්නුම් කරමින් අනුමැතිය ලබා නොගෙන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මාර්ග කඩන බවත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විධිමත් පරිදි කටයුතු නොකරන බැවින් සියලුම ඇස්තමේන්තු සකස් කර නිට්ටඹුව සිට හංවැල්ල දක්වා ඇති මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු අයිරෝඩ් (iRoad) ව්‍යාපෘතිය මගින් සිදුකිරීම සඳහා අනුමැතිය ලබා ගත් බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට අයිරෝඩ් (iRoad) ව්‍යාපෘතිය අලුතෙන් කොන්ත්‍රාත් ලබා දීම නවත්වා ඇති බව ද අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරිය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරිම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.6.5 අත්තනගල්ල ආසනයේ නැවතී ඇති අයිරෝඩ් (iRoad) ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම

අත්තනගල්ල ආසනයේ මාර්ග 25 ක් පමණ ඉදිකිරීම කිරීම සඳහා ආරම්භ කර නැවතී ඇති iRoad ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දැනට වෙන්කර ඇති ඇස්තමේන්තු පමණක් යොදාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි විෂයපථය සකස් කිරීම සුදුසු බව රාජ්‍ය අමාත්‍ය, ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් දැනුම් දෙන ලදී.

බස්නාහිර පළාත තුළ අයිරෝඩ් (iRoad) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන නමුත් එය මන්දගාමී ලෙස ක්‍රියාත්මක වන බව ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම නිට්ටඹුව සිට ඌරාපොළ දක්වා ඇති මාර්ගය අයිරෝඩ් (iRoad) ව්‍යාපෘතියට ඇතුළත් කරන ලද බවත් ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් අනුමැතියක් නොලැබුණු බවත් ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 3.6.6 කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලදී කොන්ත්‍රාත්කරුවන් විධිමත් පරිදි කටයුතු නොකිරීම

කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලදී ඇතැම් කොන්ත්‍රාත්කරුවන් විධිමත් පරිදි කටයුතු නොකළ බැවින් ඔවුන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

## 3.7 ශ්‍රවනාබාධිත පුද්ගලයන් හට සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර ලබා දීම - රාජ්‍ය අමාත්‍ය, ගරු ලසන්ත අලගියවන්න මහතා

මෙරට ශ්‍රවනාබාධිත පුද්ගලයන් හට සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලියේ වැඩි කොටසක් මේ වන විට සිදු කර අවසන් බවත් ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත්කර වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් දැනුම් දෙන ලදී.

එහි නිර්දේශය වන්නේ පළමුව 50 ක් පමණ වන පිරිසක් වෙනුවෙන් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර එහි ප්‍රතිඵල අනුව නීත්‍යානුකූලව මෙම කාර්යය සිදු

කිරීම බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ශ්‍රවනාබාධිත පුද්ගලයින්ගේ සංගම්වලින් ඉදිරිපත් වූ යෝජනාවක් අනුව ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සභාපති සහ විශේෂඥ වෛද්‍යවරුන්ගේ මැදිහත්වීම සහ වෙනත් රටවල් මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර නිරික්ෂණය කර මෙහි මූලික කටයුතු සිදු කළ බව ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

මෙම ඉල්ලීම ඉතා සාධාරණ ඉල්ලීමක් බැවින් නියමු ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී එය ක්‍රියාත්මක කිරීම සුදුසු බව ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට රිය ධාවනය සිදුකරන ශ්‍රවනාබාධිත පුද්ගලයින් වෙනුවෙන් නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පළාත් පාලන ආයතන හා සම්බන්ධීකරණයෙන් මෙම කටයුතු නියාමනය කළයුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 05.00ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2022 සැප්තැම්බර් 21**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ඩග්ලස් දේවානන්දා මහතා (සභාපති)
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු ඩී. වීරසිංහ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

සජිත් ප්‍රේමදාස මහතා
ගරු සනත් නිශාන්ත මහතා
ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු වීරසුමන වීරසිංහ මහතා

## 1. නියෝග සහ වාර්ෂික වාර්තා සලකා බැලීම

### 1.1 නියෝග සලකා බැලීම

**1.1.1 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 නොවැම්බර් මස 24 දිනැති අංක 2255/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග**
(2022 සැප්තැම්බර් මස 06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.1.2 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 64 වන වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 61 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 පෙබරවාරි මස 07 දිනැති අංක 2266/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග**
(2022 සැප්තැම්බර් මස 06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**1.1.3 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 අප්‍රේල් මස 25 දිනැති අංක 2277/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග**
(2022 සැප්තැම්බර් මස 06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

### 1.2 වාර්ෂික වාර්තා සලකා බැලීම

**1.2.1** 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව

**1.2.2** 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා

**1.2.3** 2016 වර්ෂය සඳහා සීමාසහිත සීනෝර් පදනමේ වාර්ෂික වාර්තාව

**1.2.4** 2019 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

**1.2.5** 2020 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් නියෝග සහ වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම නියෝග සහ වාර්ෂික වාර්තා වලට එකඟ වූ කාරක සභාව ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

# 2. වෙනත් කරුණු

## 2.1 ගරු වීරසුමන වීරසිංහ මහතා

### 2.1.1 රාජ්‍ය ආයතනවල වාර්ෂික වාර්තා ප්‍රමාද වීම

රාජ්‍ය ආයතන බොහෝ ප්‍රමාණයක වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වාර්ෂික වාර්තා අධ්‍යයනය කිරීමට හෝ පසුවිපරමක් සිදු කිරීමට අවස්ථාවක් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

වාර්ෂික වාර්තාව සකසා ඉදිරිපත් කිරීම ආයතනවල ප්‍රධාන කාර්යයක් වියයුතු බැවින් වාර්ෂික වාර්තා නියමිත කාලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉදිරිපත් නොකරන ලද වාර්ෂික වාර්තා යාවත්කාලීන කරගෙන යන බවත් මෙම වර්ෂය අවසාන වීමට පෙර සියලු වර්ෂවල වාර්ෂික වාර්තා සකසා අවසන් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් ධීවර අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

### 2.1.2 ධීවර යාත්‍රා සඳහා ඉන්ධන නිකුත් කිරීම

අපනයනය කිරීම සඳහා මත්ස්‍යයින් රැගෙන එන ධීවර යාත්‍රා සඳහා ඉන්ධන ලබා දීමට ප්‍රමුඛතාවයක් ලබා දී නොමැති බැවින් ඒ සඳහා නිසි වැඩපිළිවෙලක් සකස් කර දෙන ලෙසත් දෛනිකව යතුරුපැදි මඟින් රට තුළ මත්ස්‍ය වෙළෙඳාමේ නිරතවන ජනතාව වෙත නිකුත් කරන සීමිත ඉන්ධන ප්‍රමාණය හේතුවෙන් ඔවුන් ද දැඩි අපහසුතාවයකට පත්ව සිටින බැවින් ඔවුන්ට ප්‍රමුඛතාවයක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දෛනිකව දකුණු පළාතේ ධීවර කර්මාන්තයේ නිරතවන ධීවර යාත්‍රා සඳහා භූමිතෙල් ලබා දීම සම්බන්ධව ගැටලු පවතින බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවර වරාය කිහිපයකට පමණක් ඉන්ධන ලබා දීමේ ප්‍රමාදයක් ඇති වී තිබෙන බවත් මේ වන විට පෙරට වඩා වැඩි ඉන්ධන ප්‍රමාණයක් ධීවර වරායන් වෙත බෙදා හැරීමේ කටයුතු ආරම්භ කර ඇති බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

භූමිතෙල් භාවිත කරන එක්දින ධීවර යාත්‍රා 27000ක් ලියාපදිංචි වී ඇති අතර භූමිතෙල් භාවිත කරන එක්දින ධීවර යාත්‍රා වැඩි වශයෙන් පවතින්නේ යාපනය දිස්ත්‍රික්කයේ බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

දිනපතා අවශ්‍ය භූමිතෙල් ප්‍රමාණය, භූමිතෙල් අවශ්‍ය ඉන්ධන පිරවුම්හල් සහ ඒවාට යැවිය යුතු භූමිතෙල් ප්‍රමාණ දෛනිකව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත දැනුම් දෙන බව ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

මේ වන විට ඉන්ධන නිකුත් කරනු ලබන්නේ ධීවර යාත්‍රා සඳහා පමණක් බවත්

දෛනික මත්ස්‍ය වෙළෙඳාමේ යෙදෙන යතුරුපැදි සඳහා ඉන්ධන නිකුත් නොකරන බවත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ වන විට ඩීසල් සම්බන්ධව ගැටලු පවතින්නේ බේරුවල සහ කුඩාවැල්ල ධීවර වරායන්හි පමණක් බවත් අගෝස්තු මාසයේදී බේරුවල ධීවර වරායේ ඉන්ධන ලබා ගැනීමට පැවති යාත්‍රා 689ක පොරොත්තු ලේඛනයෙන් මේ මාසය වන විට පවතින්නේ යාත්‍රා 61ක් පමණක් බවත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

කුඩාවැල්ල ධීවර වරායේ බෙදාහැරීම් ඒකකය (Dispensing Unit) අක්‍රීය වීම නිසා එය නැවත සාදා ගැනීමට අවශ්‍ය කොටස් ආනයනය කරගැනීමට නොහැකි වී තිබීම හේතුවෙන් ගැටලුවක් පැන නැගී ඇති බව ද ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඉන්ධන ලබා ගැනීමට ධීවරයන් නොපැමිණීම හේතුවෙන් ඉන්ධන ඉතිරි වී පවතින බවත් ඉන්ධන ලබා ගැනීමට නොපැමිණෙන හේතුව මේ වන විට ධීවරයින් මසුන් ඇල්ලීම සඳහා පිටත්ව ගොස් තිබීම බවත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඉන්ධන ගැටලුව පවතින සියලු ධීවර වරායන් සම්බන්ධව පරීක්ෂා කර දැනුවත් කළහොත් මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගතහැකි බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

බෙදාහැරීම් ඒකක (Dispensing Unit) සීමිත සංඛ්‍යාවක් පැවතීම නිසාවෙන් දිනපතාම ඉන්ධන යාත්‍රා 07ක් පමණ පොරොත්තු ලේඛනයේ පවතින බවත් ඒ හැර වෙනත් කිසිඳු ගැටලුවක් නොමැති බවත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 2.1.3 ධීවර සුභසාධනය

ධීවරයින්ගේ සුභසාධනය පිළිබඳව මේ වන විට සාධනීය තත්ත්වයක් නොපවතින බවත් බොහෝ පුද්ගලයින් මත්ද්‍රව්‍ය ලබා ගැනීමට හෝ මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් ලබා ගැනීමට දෛනික සහ බහුදින ධීවර යාත්‍රාවන්හි ධීවර කටයුතුවල නිරත වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එවැනි ධීවරයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට මේ සම්බන්ධව සහ ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය, සුබසාධනය සම්බන්ධව යම් උපදේශන වැඩපිළිවෙලක් ධීවර අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් දියත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු ධීවර අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ධීවර ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සුබසාධනය සඳහා වැඩි අවධානයක් යොමු කරමින් විශේෂ සුබසාධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර එහි පළමු අදියර ඔක්තෝබර් 01 වනදා ලෝක ළමා දිනයත් සමඟ ආරම්භ කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවර සුභසාධන කටයුතු යටතේ අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් නව විශ්‍රාම

වැටුප් ක්‍රමයක් සකස් කිරීමට සැලසුම් කර ඇති බවත් ධීවර පවුල්වල දරුවන් සහ ඔවුන්ගේ අධ්‍යාපනය ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ එක්වී නව රක්ෂණ ක්‍රමවේදයක් සකස් කර කඩිනමින් ක්‍රියාත්මක කරන බවත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

මත්ද්‍රව්‍ය භාවිතකරන්නන්ගේ සහ එච්අයිවී (HIV) ආසාධිතයින්ගේ වැඩිවීමක් සම්බන්ධව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් දැනුම් දී ඇති බවත් ඒ අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සහ කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මංජු වීරසිංහ මහතා සම්බන්ධ කරගනිමින් ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ පළමු වැඩසටහන 2022.09.23 වන සිකුරාදා දින මීගමුව ධීවර වරායෙන් ආරම්භ කෙරෙන බවත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

දැල් ආම්පන්න සහ අනෙකුත් ධීවර ආම්පන්න මිලදී ගැනීම සඳහා අයවැයෙන් මුදල් වෙන් වුව ද, ධීවර සුභසාධනයට වැඩි මුදලක් වෙන් නොවන බවත් මීළඟ අයවැයෙන් ධීවර ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සුභසාධනය වෙනුවෙන් වැඩි ප්‍රතිපාදනයක් වෙන් කිරීමට කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

### 2.1.4 බෝට්ටු නිෂ්පාදනය ආශ්‍රිතව පවතින ගැටලු

ආනයන සීමා හේතුවෙන් ඇණහිට ඇති විදේශ වෙළෙඳපොළ කේන්ද්‍ර කරගත් බෝට්ටු නිෂ්පාදනය යළි ක්‍රමවත් කිරීම උදෙසා බෝට්ටු නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ යම් ආනයන සීමා ලිහිල් කිරීමකට කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ධීවර යාත්‍රා නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ආනයන සීමා ලිහිල් කර ඇති අතර ඒ සඳහා ක්‍රමවේදයක් ද හඳුන්වා දී තිබෙන බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

ඕනෑම යාත්‍රාංගනයකට අවශ්‍ය ආනයනික අමුද්‍රව්‍ය ඇත්නම් එක් එක් දිස්ත්‍රික්කවල පවතින ධීවර කාර්යාලයන්හි සහකාර අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් කළවිට ඔහුගේ නිර්දේශය ද ධීවර අමාත්‍යාංශය වෙත යොමු කළ පසු එම අමුද්‍රව්‍ය ආනයනය කිරීමට කටයුතු කරන ලෙස ධීවර අමාත්‍යාංශය විසින් ආනයන අපනයන පාලක ජනරාල් වෙත නිර්දේශයක් නිකුත් කරන අතර අවසර ලබා ගැනීමෙන් පසු අවශ්‍ය ද්‍රව්‍ය මෙරටට ගෙන්වීමට කටයුතු සලසා ඇති බව ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඒ අනුව ආනයන සීමා කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් ධීවර ක්ෂේත්‍රයට අවශ්‍ය අමුද්‍රව්‍ය සහ උපාංග ආනයනය කිරීමට අවසර ලබා දී ඇති බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 2.2 උතුරු පළාතේ භූමිතෙල් බෙදාහැරීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

උතුරු පළාතේ වැඩිවශයෙන් භාවිත කරන්නේ භූමිතෙල් ධීවර යාත්‍රා වන බවත් මසුන් ඇල්ලීමේ කාලය මේ දිනවල ආරම්භ වන බැවින් එම ප්‍රදේශ සඳහා වැඩිපුර භූමිතෙල් අවශ්‍ය වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මීළඟ දිනට ඉන්ධන අවශ්‍ය ඉන්ධන පිරවුම්හල් ලේඛනය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත යොමු කළ ද ඉන්ධන පිරවුම්හල් විසින් ප්‍රධාන වශයෙන් මුදල් ගෙවා ඇණවුම් කරනු ලබන්නේ පෙට්‍රල් සහ ඩීසල් පමණක් බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින් ඛනිජතෙල් නීතිගත සංස්ථාව මගින් අදාළ ප්‍රාදේශීය කාර්යාලයට දැනුම් දෙන අවස්ථාවේදී අනෙකුත් ඉන්ධන සඳහා මුදල් ගෙවීම නිසා මුදල් නොමැති වීමෙන් භූමිතෙල් ගෙන්වීමට ප්‍රමාද වන බවට ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ලියාපදිංචි වූ ඉන්ධන පිරවුම්හල් වෙත පමණක් ඉන්ධන නිකුත් කරනු ලබන අතර මුදල් ගෙවූ විට පමණක් ඉන්ධන නිකුත් කරන බවත් සෑම දිනකම ප.ව. 04.00ට පෙර මුදල් තැන්පත් කරනු ලබන ඉන්ධන පිරවුම්හල් ලැයිස්තුව පමණක් එදින සවස ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත දැනුම් දෙන බවත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මුදල් ගෙවීම් ප්‍රමාද වූ අවස්ථාවකදී පසු දිනයක භූමිතෙල් ලබා ගැනීමේ හැකියාව, නියමිත දිනට ලබා ගැනීමට නොහැකි වූ අවස්ථාවකදී විකල්ප වැඩපිළිවෙළ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඉල්ලීමක් සිදු කළහොත් එම ඇණවුම ඊළඟ දිනයේදී ලබා දිය හැකි බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

## 2.3 ගරු ඩී. වීරසිංහ මහතා

### 2.3.1 ආරුගම්බේ කලාපය තුළ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම

ආරුගම්බේ සර්ෆින් (surfing) ක්‍රීඩාව සිදුකෙරෙන ප්‍රධානතම ස්ථානයේ ආරුගම්බේ ධීවර වරාය පිහිටා ඇති බවත් ධීවරයින්ගේ යාත්‍රා ගාල් කිරීම සහ දැල් දිගහැර තිබීම වැනි ධීවර කටයුතු හේතුවෙන් සංචාරකයින් බොහෝ සෙයින් අපහසුතාවයට පත්වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ස්ථානයේ සිට කි.මී. 1ක් පමණ දුරින් පිහිටි කුඩාකල්ලි නම් ස්ථානයක් වෙත මෙම ධීවර කටයුතු රැගෙන යන ලෙස ඉල්ලීමක් කරන ලද අතර එය සර්ෆින් (surfing) ක්‍රීඩාවේ නිරතවන සංචාරකයින්ට පහසුවක් වනු ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

අරුගම්බෙ ප්‍රදේශයේ නිරීක්ෂණය කිරීමට නිලධාරීන් ගිය අවස්ථාවේදී ධීවරයින් විසින් ස්ථාන 03ක් පෙන්වූ අතර එම ස්ථාන 03හිම මූලික නිරීක්ෂණයන්ට අනුව ඇතැම් ස්ථාන සඳහා විශාල වියදමක් වැය වන බැවින් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක්

සිදු කළ යුතු බව ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

### 2.3.2 ආරුගම්බේ විස්කි පොයින්ට්හි ධීවර කටයුතු

ආරුගම්බේ සර්ෆින් (surfing) ක්‍රීඩාව සිදුකෙරෙන විස්කි පොයින්ට් ප්‍රදේශයේ ද ධීවර තොටුපළ පිහිටීම නිසා සංචාරකයින් අපහසුතාවයට පත්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඔක්තෝබර් මාසයේදී ක්ෂේත්‍ර නිරීක්ෂණයක් සඳහා ආරුගම්බේ ප්‍රදේශයට පැමිණෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.3.3 එක්ගල් ඔය අභිජනන මධ්‍යස්ථානය

එක්ගල් ඔය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා එම ප්‍රදේශයේ ධීවර සමිතියේ රු. ලක්ෂ 31ක් පමණ මුදලක් වියදම් කර ඇති අතර නැවත එම මුදල ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එක්ගල් ඔය ධීවර සමිතිය සමඟ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ගිවිසුම්ගත වී රු. ලක්ෂ 220ක ව්‍යාපෘතියක් ලෙස මෙම අභිජනන මධ්‍යස්ථානය ඉදි කරන ලද බව ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබුණු බැවින් ගෙවීමට ඉතිරි වී ඇති රු. ලක්ෂ 20ක පමණ මුදල ගෙවීමට නොහැකි වූ බවත් දැනට ලැබී ඇත්තේ මසුන් තැන්පත් කිරීමට ලබා දුන් මුදල පමණක් හේතුවෙන් මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබුණු වහාම ගිවිසුම්ගත පරිදි ගෙවීම් සිදුකරන බවත් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 2.4 වැව් සඳහා මත්ස්‍ය පැටවුන් මුදාහැරීම - ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

මේ වන විට පවතින අධික මාළු මිල සලකා බලා ඌව පළාතේ වැව් සඳහා මත්ස්‍ය පැටවුන් මුදා හැරීමේ ව්‍යාපෘතිය යළි ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අනෙකුත් මාළු වෙළෙඳුන්ගේ සහ ලංකා ධීවර සංස්ථාවේ මාළු මිලෙහි සැලකිය යුතු වෙනසක් නොමැති බවත් මාළු වෙළෙඳුන් තමන්ගේ අභිමතය පරිදි විවිධ අවස්ථාවන්හි විවිධ මිල ගණන් පවසන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට හඳුනාගෙන ඇති මධ්‍යම හා සුළු පරිමාණයේ වැව් 12,000ක් අතුරින් වැව් 1340කට මත්ස්‍ය පැටවුන් මුදා හැර ඇති බවත් මෙම වසරේ තවත් වැව් 4000කට පමණ මත්ස්‍ය පැටවුන් මුදා හැරීමට නියමිතව ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව උපදෙස් ලබා ගැනීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දී ඇති බවත් ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා, අදහස් සහ ප්‍රමුඛතාව ලබා දිය යුතු වැව් ඇත්නම් ඒ සම්බන්ධව ද දන්වන ලෙස ද ගරු සභාපතිතුමා විසින්

ඉල්ලීමක් කරන ලදී.

තව ද, ලංකා ධීවර සංස්ථාව විසින් කඳුකර ප්‍රදේශයේ මත්ස්‍ය වෙළෙඳසැල් විවෘත කිරීමට සැලසුම් කර ඇති අතර එමඟින් රටේ පවතින මත්ස්‍ය හිඟයට ස්ථිරසාර විසඳුමක් ලබාගත හැකි බව ද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මාළු මිල වැඩි වීමට ප්‍රධාන හේතුව ධීවරයින්ට මුහුදු යාමට නොහැකි වීම හේතුවෙන් මත්ස්‍ය අස්වැන්න අඩු වීම සහ මත්ස්‍ය ආනයනය නැවතීම බව ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මාළු මිල වැඩි වන විට ධීවර සංස්ථාව විසින් මාළු ගබඩා කරගෙන මිල පාලනය කිරීමට කටයුතු කරන බවත් අසාමාන්‍ය ලෙස මිල ඉහළ යන විට මෙම ක්‍රමයට ස්ථාවරව පවත්වා ගෙන යාමට අසීරු බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

බදුල්ල ප්‍රදේශයේ තොග මිලට මාළු විකිණීම සඳහා අලෙවිසැලක් විවෘත කිරීමට සුදුසු ස්ථානයක් මේ වන විට සොයමින් පවතින බවත් සුදුසු ස්ථානයක් සොයාගන්නා තෙක් දැනට ධීවර සංස්ථා පරිශ්‍රයේ තොග මිලට මාළු අලෙවි කරන බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 2.5 වෙළෙඳපොළ තුළ මාළු මිල තීරණය කිරීම - ගරු සංජීව එදිරිමාන්න මහතා

වෙළෙඳපොළේ අවසන් මාළු මිල තීරණය කිරීම සම්බන්ධව මැදිහත් වීමට ධීවර අමාත්‍යාංශයට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවට සහනයක් ලෙස ධීවර සංස්ථාව මගින් "බජට් පැක්" හඳුන්වා දුන් අතර එහි ඉතා හොඳ වර්ගයේ මාළු වර්ග ඇතුළු කරවල හෝ උම්බලකඩ ඇතුලත් කර රු. 1350/= ක මුදලකට ලබා දෙන බව ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

සතොස ආයතනයත් සමඟ සාකච්ඡා කොට මාළු, කරවල සහ අධිශීත කරන ලද මාළු යන අංශයන් ද ආරම්භ කර ඇති බවත් වත්මන් වෙළෙඳපොළට සරිලන ආකාරයෙන් 250g, 300g යන ආකාරයෙන් පැකට් කොට වෙළෙඳසැල් වෙත බෙදාහැරීම ආරම්භ කළ බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

## 2.6 ගරු මායාදුන්න චින්තක අමල් මහතා

### 2.6.1 ධීවර වරායක් සඳහා ශීතාගාර ඉදිකිරීම

පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර වරායන්හි මාළු ගබඩා කිරීම සඳහා ශීතාගාර ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් පුත්තලම දිස්ත්‍රික්කයේ ඉදිකර තිබූ ටොන් 05ක් පමණ අයිස් නිෂ්පාදනය කළ හැකි අයිස් නිෂ්පාදනාගාරය ටෙන්ඩර් ක්‍රමයට හෝ වෙනත් පාර්ශවයකට හෝ ලබා දී අලුත්වැඩියා කරදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අයිස් නිෂ්පාදනාගාරය අලුත්වැඩියා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අවසර ලබා ගෙන ඇති බවත් තක්සේරු වාර්තා ලබා ගෙන අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට නියමිත බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 2.6.2 ධීවර සංස්ථා මාළු අලෙවිසැල් ස්ථාපිත කිරීම

පුත්තලම නගරයේ ධීවර සංස්ථාවට අයත් මාළු අලෙවිසැල පෞද්ගලික වෙළෙඳ ස්ථානයක් සඳහා බදු දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවර සංස්ථා මාළු අලෙවිසැල පවතින විට කළු කඩ මිලට මාළු මිලදී ගැනීමෙන් ජනතාවට සිදුවන අපහසුතාව ද මඟහැරී යන බැවින් නගර සභා සහ ප්‍රාදේශීය සභා සමඟ සාකච්ඡා කොට මාළු අලෙවිසැල් ක්‍රමයක් ස්ථාපිත කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ලංකා ධීවර සංස්ථාවට අයත් දේපලක් පුත්තලම නගර සීමාවේ නොමැති බවත් පාලවිය සහ තොඩුවාව යන ප්‍රදේශ 02හි පමණක් අලෙවිසැල් පවතින බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මාළු අලෙවිසැල් ස්ථාපිත කිරීම පිළිබඳව නගර සභා සමඟ සාකච්ඡා කිරීමට කටයුතු සකස් කරන බවත් මාළු අලෙවිසැල් ස්ථාපිත කිරීම අදියර 02කින් ක්‍රියාත්මක කිරීමට නියමිත වන අතර පළමු අදියරේදී සතොස අලෙවිසැල් 445 සමඟ එක් වී අමු මාළු අලෙවි කළ හැකි ස්ථානවල ඒවාද අධිශීත කළ මාළු ගබඩා කළ හැකි ස්ථානවල අධිශීත කල මාළු ද අලෙවිකිරීමට සූදානම් වන බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කොට අලෙවිසැල් පිහිටුවීමට අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව ද ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 2.6.3 ධීවරයින් සඳහා ඉන්ධන ලබා දීම

පුත්තලම දිස්ත්‍රික්කයේ සහ ඒ අවට ඇති බත්තලංගුන්ඩුව, උච්චුමුනි ඇතුළු දූපත්වල ධීවරයින් සඳහා භූමිතෙල් සහ පෙට්‍රල් ලබා දීමේදී ධීවර වරාය හරහා ඉන්ධන ලබා දීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ධීවර සමිති යොදාගනිමින් සිදු කරන ඉන්ධන බෙදාහැරීමේදී එය නිසි ආකාරයෙන් සිදු නොවන බවත් ධීවර සමිතිවල නිලධාරීන් පමණක් ඉන් වාසි ලබාගන්නා බැවින් එසේ සිදු නොකර සමිති සාමාජිකයින්ට ද ඉන්ධන ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කල්පිටිය නගරයේ සිට දූපත් වෙත ඉන්ධන ලබා දීමේදී ධීවර වරායේ ඉන්ධන පිරවුම්හල නොවන අනෙකුත් ඉන්ධන පිරවුම්හල්වලින් ගැටලු ඇති වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පුත්තලම දිස්ත්‍රික්කයටම ධීවරයින් සඳහා ඉන්ධන සැපයීමට ඉන්ධන පිරවුම්හල් 08ක් පමණක් නම් කර ඇති අතර එම සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බවත් වැඩි ඉන්ධන ප්‍රමාණයක් සැපයීමට කටයුතු සලසා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.7 ගරු හේෂා විතානගේ මහතා

### 2.7.1 ධීවර සංස්ථාව හරහා ටින් මාළු කර්මාන්තශාලා ඉදිකිරීම

දේශීයව නිපදවන ටින් මාළු, පාරිභෝගිකයින් විසින් මිලදී නොගැනීමටත් ආනයනය කරන ලද ටින් මාළු මිලදී ගැනීමේ ප්‍රවණතාව වැඩිවීමටත් හේතුව සහ ටින් මාළුවල වර්තමාන මිල ගණන් සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

2020 වනවිට පැවති ටින් මාළු කර්මාන්තශාලා 06 මෙම වර්ෂය වනවිට කර්මාන්තශාලා 10ක් දක්වා වැඩි කරගෙන ඇති බවත් 11 වෙනි කර්මාන්තශාලාව නුදුරේදීම ආරම්භ කිරීමට නියමිත බවත් ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ) විසින් දැනුම් දෙන ලදී.

පෙර වර්ෂවල පැවති ටින් මාළු නිෂ්පාදනයට වඩා 2021 වර්ෂයේදී ටින් මාළු නිෂ්පාදනය වැඩි වූ නමුත් ඉන්ධන ගැටලුව සහ ටින් මාළු නිෂ්පාදනය සඳහා යොදාගන්නා ලින්නා මත්ස්‍ය අස්වැන්න අඩුවීම හේතුවෙන් 2022 වර්ෂයේ ටින් මාළු නිෂ්පාදනය යම්තාක් දුරකට අඩු වූ බව ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ටින් මාළු මිල රු. 750 – 800ක වැනි මුදලක් වන බවත් එයට හේතු ලෙස ලින්නා මාළු මිල වැඩි වීමත් ඉන්ධන ගාස්තු වැඩි වීමත් බලපා ඇති බවත් ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 2.7.2 මාළු මිල ඉහළ යාම

ධීවර වරායන්හි පිහිටි ඉන්ධන පිරවුම්හල් වෙත ඉන්ධන ලබා දීමේදී ප්‍රමුඛතාවයක් ලබා දුනහොත් මාළු මිල පාලනය කළ හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.8 ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

### 2.8.1 චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ මාළු සිටින ස්ථාන හඳුනා ගැනීම

විදෙස් රටවල් මගින් චන්ද්‍රිකා තාක්ෂණය භාවිත කර මාළු සිටින ස්ථාන හඳුනා ගෙන එම ස්ථාන වෙත ගොස් මාළු අස්වැන්න ලබා ගන්නා බවත් දේශීයව ඒ සම්බන්ධව සිදු කරන වැඩපිළිවෙල සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එමෙන්ම චන්ද්‍රිකා තාක්ෂණය කුලී පදනම මත ලබා ගෙන මත්ස්‍යය බිම් සෙවීමට ඇති හැකියාව පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තව ද, ගෙන එන මත්ස්‍ය අස්වැන්න ගබඩා කර තබාගැනීම සඳහා ද පහසුකම්

සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් මත්ස්‍ය අස්වැන්න ඇති ප්‍රදේශ පිළිබඳව දිනපතා පුරෝකතනයක් ලබා දෙන බව ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ) විසින් දැනුම් දෙන ලදී.

චන්ද්‍රිකාවකට ගෙවීම් සිදු කර ගනු ලබන ධීවර අනාවැකි (Fish Ground Forecasting) ක්‍රමවේදයක් කිසිදු දිනයක ලංකාවේ නොතිබුණු බව ද එසේ තිබුණේ නම් මසුන් ඇති ස්ථාන ආදිය පිළිබඳව ධීවරයින්ට දැනුම් දීමට හැකිව තිබූ බව ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බහුදින ධීවර යාත්‍රා ඉලක්ක කරන කෙළවල්ලා මත්ස්‍ය බිම් පිළිබඳව නාවික යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් (Vessel Monitoring System) හරහා අතීත දත්ත එක්රැස් කරගෙන මත්ස්‍ය බිම් පිළිබඳව පුරෝකතනය කරන බව ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම චන්ද්‍රිකා තාක්ෂණය කුලී පදනම මත ගැනීමට විශාල මුදලක් වැය වන බවත් එමඟින් දත්ත ලබා දෙන්නේ ද විශ්ලේෂණ ක්‍රමවේදයකින් බවත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඉදිරි කාලය ඇතුළතදී තවත් ධීවර යාත්‍රා 2000කට නාවික යාත්‍රා නිරීක්ෂණ පද්ධති (Vessel Monitoring System) සවි කිරීමට ද බලාපොරොත්තු වන බවත් එමඟින් දෛනිකව මත්ස්‍ය අස්වැන්න ලැබෙන බිම් පිළිබඳව දත්ත ලබාගෙන එම දත්ත ඉදිරියේදී අනෙකුත් ධීවර යාත්‍රා වෙත ලබා දීමට කටයුතු කරන බවත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ලංකාවේ ඇති බොහෝමයක් කුඩා ධීවර යාත්‍රා මගින් මීටර් 100ක ගැඹුරට පමණක් ඇම දැමීමේ හැකියාව පවතින නිසා මුහුදේ ඉතා දුර ගමන් කරන නමුත් විදෙස් රටවල ධීවර යාත්‍රා මීටර් 300ක පමණ ගැඹුරට ඇම දමන බවත් විශාල මත්ස්‍යයින් වෙසෙන්නේ ගැඹුරු මුහුදේ බවත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සහ ලෝක ආහාර සංවිධානය සමඟ එක්ව ඇම ගැඹුරු මුහුදට දමා මසුන් අල්ලා ගැනීමට පර්යේෂණ මට්ටමේ යාත්‍රාවක් නිෂ්පාදන කිරීම ආරම්භ කර ඇති බව ද තවදුරටත් දැනුම් දෙන ලදී.

එමඟින් ආසන්න මුහුදේ මසුන් ඇල්ලීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට ද හැකියාව පවතින බව ද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් සතියකට තෙවරක් මත්ස්‍යයින් ගැවසෙන ප්‍රදේශ පිළිබඳව විවිධ මාධ්‍ය ඔස්සේ ධීවරයින්ට තොරතුරු ලබාදෙන බවත් එසේ තොරතුරු ලබාදෙන්නේ බහුදින ධීවර යාත්‍රාවලට පමණක් බවත් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 2.8.2 රට තුළ මිරිදිය ධීවර කර්මාන්තයේ නියැලෙන්නන්

රට තුළ මිරිදිය ධීවර කර්මාන්තයේ නියැලෙන්නන් ද මෙම ඉන්ධන ගැටලුවලින් පීඩා විඳින බැවින් ඔවුන් සඳහා ද යම් සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මාස එකහමාරක කාලයක් තුළදී ගැටලුව විසඳීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.8.3 මත්ස්‍ය ක්‍රීඩා (Sports Fishing) සඳහා ස්ථානයක් වෙන් කර ගැනීම

සංචාරකයින්ට ස්පෝර්ට්ස් ෆිෂින්ග් (Sports Fishing) ක්‍රීඩාවේ නිරතවීම සඳහා කොරල්පර සහ වෙරළට හානියක් ඇති නොවන පරිදි සුදුසු ස්ථානයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.8.4 හික්කඩුව ප්‍රදේශයේ වෙරළ ඛාදනය

හික්කඩුව, දොඩන්දූව වැනි වෙරළ තීරයන්හි සිදු කරන නඩත්තු කටයුතු හේතුවෙන් හෝටල් විනාශවීමට ලක්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ජනතාව මෙය වැලි ජාවාරමක් ලෙස අර්ථකතනය කරන බැවින් මේ පිළිබඳව පරීක්ෂා කර විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නඩත්තු කටයුතුවලට අවශ්‍ය පරිදි හැරීම් කටයුතු සිදු කරන අතර තොටුපොළවල වැලි හාරා ඉවත්කර සිදු කරන පිරිසිදු කිරීමේ කටයුතු ද නවත්වා ඇති බව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධව අධීක්ෂණ කටයුතු සිදු කරන අතර ඔවුන්ගේ උපදෙස් පරිදි ඇතැම් ස්ථානවල ඉදිකිරීම් කටයුතු සිදු කළ බවත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 2.8.5 කොග්ගල ඔය සහ මාදු ගඟට ඉස්සන් හෝ මසුන් දැමීම

කොග්ගල ඔයට සහ මාදු ගඟට ඉස්සන් හෝ මිරිදිය මසුන් දැමීමෙන් ඉදිරියේදී පැමිණෙන සංචාරක සමයේදී ආදායම් උපාගත හැකි බැවින් ඒ සම්බන්ධව කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව පරීක්ෂා කර ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට උපදෙස් දෙන ලදී.

## 2.9 ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා

### 2.9.1 ධීවර ප්‍රතිපත්ති, ධීවර ක්‍රම, ධීවර වරායන් සහ ධීවර කොට්ඨාස පිළිබඳව දත්ත ලබා ගැනීම

ධීවර ප්‍රතිපත්ති, ධීවර ක්‍රම, ධීවර වරායන් සහ ධීවර කොට්ඨාස පිළිබඳව දත්ත සහ සංඛ්‍යාන ලබාදෙන ලෙස ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.9.2 ධීවර අස්වැන්න ලබා ගැනීම සඳහා නව තාක්ෂණය භාවිත කිරීම

ධීවර අස්වැන්න ලබා ගැනීම වැඩි කිරීම සඳහා නව තාක්ෂණය පාවිච්චි කරන්නේ කෙසේද යන්න පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

### 2.9.3 මත්ස්‍ය අස්වැන්නෙන් රට ස්වයංපෝෂිත කිරීම සඳහා ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ

මත්ස්‍ය අස්වැන්නෙන් රට ස්වයංපෝෂිත කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

### 2.9.4 ධීවර අංශයේ ආනයන, අපනයන සහ දේශීය පරිභෝජනය

ධීවර අංශයේ ආනයන, අපනයන සහ දේශීය පරිභෝජනය පිළිබඳව දත්ත සහ ධීවර අපනයනය ඉහළ දැමීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

### 2.9.5 ධීවරයින් සඳහා භූමිතෙල් බෙදාහැරීම

ධීවර කර්මාන්තයේ නියැලීම සඳහා භූමිතෙල් නොමැති වීමෙන් සුළු පරිමාණ ධීවරයින් අපහසුතාවයට පත්ව ඇති බැවින් ඒ සඳහා යම් විශේෂ වැඩපිළිවෙලක් සකස් කර තිබෙන්නේද යන්න පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

එමෙන්ම සෑම ධීවර වරායක් සතුව ඉන්ධන පිරවුම්හලක් පවතින්නේද යන්න පිළිබඳව ද ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ඉන්ධන පිරවුම්හල් මෙන්ම පෞද්ගලික අංශයේ දායකත්වය ද ලබා ගෙන මාසයක පමණ කාලයක් ඇතුළත භූමිතෙල් ගැටලුව සඳහා විසඳුම් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවර වරායන් සියල්ලකම පාහේ ඉන්ධන පිරවුම්හලක් පවතින බවත් සමුපකාර ඉන්ධන පිරවුම්හල් මෙන්ම පෞද්ගලික ඉන්ධන පිරවුම්හල්වල දායකත්වය ලබාගෙන මාස එකහමාරක කාලයක් තුළදී ගැටලුව විසඳන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු විපක්ෂ නායකතුමන් විසින් ඉල්ලා සිටි සියලු දත්ත හා තොරතුරු ලබා දෙන බව ධීවර අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 2.9.6 ධීවර පරීක්ෂක කොට්ඨාස

ලංකාවේ පිහිටුවා ඇති ධීවර පරීක්ෂක කොට්ඨාස සංඛ්‍යාව, මෙම ධීවර පරීක්ෂක කොට්ඨාස මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා ස්ථාපිත කර ඇති ආකාරය සහ යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව, දළ දේශීය නිෂ්පාදනය සඳහා ධීවර කර්මාන්තයෙන් සපයනු ලබන දායකත්වය කොපමණද සහ ධීවර අමාත්‍යාංශය සතු ඉලක්ක සහ සැලසුම් පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

### 2.9.7 ධීවර තොටුපොලවල් ඉදිකිරීමේදී ඇතිවන ගැටලු

ධීවර තොටුපොළවල් ඉදිකිරීමේදී, පොතුපිටිය, කිරින්ද වැනි ඇතැම් තොටුපොළවල් අසාර්ථක වී ඇති බැවින් බොහෝ ගැටලු ඇති වී තිබෙන බවත් ඒ සම්බන්ධව පිළියම් යොදන ලෙසත් ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.** කාරක සභාව ප.ව. 12.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

**පළමු රැස්වීම - 2022 ඔක්තෝබර් 21**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු නලින් ප්‍රනාන්දු මහතා (සභාපති)
ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු කාදර් මස්තාන් මහතා (රාජ්‍ය අමාත්‍ය)

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු අනුප පස්කුවල් මහතා
ගරු වජිර අබේවර්ධන මහතා

**1. ගරු සභාපතිතුමාගේ නිවේදන**

රට තුළ පවතින අත්‍යාවශ්‍ය භාණ්ඩ හිඟය පිළිබඳව විමර්ශනය කර ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති බවත් අමාත්‍යාංශය යටතේ පවතින ලලිත් ඇතුළත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හරහා වර්ෂයකට උසස් අධ්‍යාපනය ලබන සිසුන් 16,000කට ආසන්න ප්‍රමාණයකට මහපොළ ශිෂ්‍යත්වය ලබා දෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මහපොළ අරමුදල වර්ධනය කරගැනීමේ අරමුණෙන් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ නිර්මාතෘ, එවකට වෙළෙඳ අමාත්‍ය ලෙස කටයුතු කල දිවංගත ලලිත් ඇතුළත්මුදලි මහතා ආරම්භ කළ මහපොළ අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනය නැවත

දියත් කිරීමට බලාපොරොත්තු වන බව ද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**2. වාර්ෂික වාර්තා සලකා බැලීම**

සලකා බැලීමෙන් අනතුරුව, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ විය.

**2.1** 2018 වර්ෂය සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
**2.2** 2017 වර්ෂය සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
**2.3** 2018 වර්ෂය සඳහා සීමාසහිත ලංකා සතොස සමාගමේ වාර්ෂික වාර්තාව
**2.4** 2020 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව
**2.5** 2016 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව
**2.6** 2016 වර්ෂය සඳහා අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඉහත කී වාර්ෂික වාර්තා පිළිබඳව කාරක සභාවේ වාර්තාව 2022 නොවැම්බර් මස 09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම කාරක සභාව විසින් අනුමත කරන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 වෙළෙඳ ව්‍යාපාරිකයින්ට නව දැනුම ලබා දීම සඳහා ඇති අධ්‍යාපන පාඨමාලා - ගරු අනුප පස්කුවල් මහතා**

වෙළෙඳ ව්‍යාපාරිකයින්ට ව්‍යාපාරයන් පිළිබඳව නව දැනුම ලබා දීමට දැනුම වර්ධනය කරගැනීම සඳහා රට තුළ අධ්‍යාපන පාඨමාලා නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතුව සෑම ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි පාරිභෝගික කමිටු ආරම්භ කර ඒවා ක්‍රියාත්මක වෙමින් පවතින බවත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුදල් හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නොවැම්බර් මාසයේ සිට දිස්ත්‍රික් පදනමින් මෙම කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ වන බවත් ඉන්පසුව එම කමිටු, වෙළෙඳ සංගම් සහ අනුබද්ධිත ආයතන දැනුවත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නිසි ව්‍යාපාර කළමනාකරණය මගින් ව්‍යාපාර දියුණු කර ගැනීම සහ නියමාකාරයෙන් ව්‍යාපාරය සිදු කරගෙන යාම සම්බන්ධයෙන් ද දැනුම ලබා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දේශීය ව්‍යාපාරිකයින්ට සහ දේශීය නිෂ්පාදකයින්ට පවතින මූලික ගැටලුව මූල්‍ය පරිපාලනය බවත් ව්‍යාපාරිකයින් ද සම්බන්ධ කරගනිමින් මෙම වැඩසටහන කඩිනමින් දියත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වගකීම වැටලීම් සිදු කිරීම පමණක් නොව වැටලීම් සිදු කර වැරදි පිළිබඳව වෙළෙන්දන් දැනුවත් කර වැටලීම් සඳහා පවතින හේතු අඩු කිරීම වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වැටලීම් සිදු කිරීම අඩු වන්නේ නම් වෙළෙදාම සාර්ථක බවත් වැටලීම් සංඛ්‍යාව වැඩිවන්නේ නම් වෙළෙඳාම අසාර්ථක බවත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ඉලක්කය විය යුත්තේ වැටලීම් සංඛ්‍යාව අඩු කර ගැනීම බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

විමර්ශන නිලධාරීන් වශයෙන් අලුතින් බඳවා ගත් උපාධිධාරීන් 350ක් දීප ව්‍යාප්තව සේවයේ නිරත වන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඍජුවම වැටලීම් සිදු නොකර, එම ප්‍රදේශයේ වෙළෙන්දන් පිළිබඳව දත්ත ගබඩාවක් (Database) නිර්මාණය කර යම් පැමිණිල්ලක් ලැබුණු විට එය ව්‍යාපාරිකයන්ට ලිඛිතව දැනුම් දී ඔවුන්ව කැඳවා සාකච්ඡා කර ලිඛිතව පළමු අවවාදය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නැවතත් එම වෙළෙන්දාට විරුද්ධව පැමිණිල්ලක් ලැබුණු පසු දත්ත ගබඩාව පිරික්සා නඩු පැවරීමට කටයුතු ආරම්භ කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නීතිගරුක වෙළෙන්දන් ඇගයීමකට ලක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

යම් නිශ්චිත කාලයක් ගතවනතුරු කිසිඳු පැමිණිල්ලක් ලැබී නොමැති නම් එම වෙළෙන්දන් ඇගයීමට ලක් කරමින් සහතික පත්‍රයක් ලබා දීමට හැකි බවත් ඔවුන්ව පිළිගැනීමකට ලක් කරමින් වාර්ෂිකව අලුත් කළ හැකි කාඩ්පතක් ලබා දීමට හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වෙළෙඳ සංගම්වල සභාපතිවරු පාරිභෝගික කමිටුවේ නිත්‍ය සාමාජිකයෙක් වන බවත් එම වෙළෙඳ ප්‍රජාවගේ අවශ්‍යතා සඳහා පාරිභෝගික කමිටුව භාවිත කළ හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

වෙළෙඳාම, පාරිභෝගිකයින්ගේ සිත් දිනාගැනීම සහ මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වෙළෙන්දන්ගේ දැනුම වර්ධනය කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කොවිඩ් වසංගතයට පෙර විශිෂ්ඨ ව්‍යාපාරික භාවිතයන් පිළිබඳ දේශන, ආදර්ශමත් වෙළෙන්දන් තේරීම් කර සම්මාන ප්‍රදානය කිරීම් ද පැවැත්වූ බවත් 2019 වර්ෂයේ මෙම වැඩපිළිවෙළ ආරම්භ කර වැඩසටහන් 50ක් පමණ සිදු කර ඇති බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ (තරගකාරීත්ව ප්‍රවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

විවිධ ආයතන මගින් සිදුකළ ඉල්ලීම්වලට අනුව විවිධ ප්‍රදේශවලට ගොස් එම වැඩසටහන් දියත් කළ බව ද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ (තරගකාරීත්ව ප්‍රවර්ධන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

සැලසුමක් සහ කමිටුවල සහභාගීත්වය ද සහිතව එක් දිස්ත්‍රික්කයක් ආවරණය වන පරිදි වැඩසටහන් 5ක් පමණ සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් දෙන ලදී.

මෙම වෙළෙඳ සංගම් කැඳවා එක් දින වැඩමුළුවක් පවත්වා ඔවුන්ට නව දැනුම ලබා දෙන වැඩසටහන් පවත්වා සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි වැඩසටහනක් සකස් කිරීමට අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡා කළ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙම පාරිභෝගික පනත පිළිබඳව පාසල් සිසුන්, මහජනතාව, රාජ්‍ය නිලධාරීන්, යුධ හමුදාව, නාවික හමුදාව සහ පොලීසිය දැනුවත් කිරීම් සිදු කරමින් පවතින බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු සහ තොරතුරු) විසින් දැනුම් දෙන ලදී.

දැනට ක්‍රියාත්මක වන්නේ නීතිරීති පිළිබඳව වෙළෙඳ ව්‍යාපාරිකයින් දැනුවත් කිරීම පමණක් බවත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු සහ තොරතුරු) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සම්බන්ධ කරගනිමින් මේ පිළිබඳව සාකච්ඡා කළ බවත් වාණිජ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සම්බන්ධ කරගෙන මෙය ක්‍රියාත්මක කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සතියකට පැයක කාලයක් වෙන්කර උචිත කාලරාමුවක් නිර්මාණය කරගෙන වැදගත් අන්තර්ගතයක් සහිතව මෙය ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව පෙ.ව. 11.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමු රැස්වීම - 2022 නොවැම්බර් 16**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (සභාපති)
ගරු ප්‍රසන්න රණවීර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු චාමර සම්පත් දසනායක මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් මහතා
ගරු මධුර විතානගේ මහතා

**1.** **වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1** 2019 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව
**1.2** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.3** 2019 වර්ෂය සඳහා ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.4** 2017/2018 වර්ෂය සඳහා ලංකා ලේලන්ඩ් (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව
**1.5** 2017/2018 සහ 2018/2019 වර්ෂ සඳහා මන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තා
**1.6** 2019 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව
**1.7** 2018/2019 වර්ෂය සඳහා බී.සී.සී. ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.8** 2020 වර්ෂය සඳහා මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.9** 2020 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව
**1.10** 2014 වර්ෂය සඳහා මන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.11** 2015 වර්ෂය සඳහා බී.සී.සී. ලංකා ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.12** 2016 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**1.13** 2018 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**1.14** 2016 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව
**1.15** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව
**1.16** 2016, 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා ලංකා පිඟන් සංස්ථාවේ වාර්ෂික වාර්තා
**1.17** 2017 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව
**1.18** 2019 සහ 2020 වර්ෂ සඳහා සීමාසහිත ලංකා ලේලන්ඩ් පෞද්ගලික සමාගමේ වාර්ෂික වාර්තා
**1.19** 2019/2020 වර්ෂය සඳහා බී.සී.සී ලංකා ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව

අමාත්‍යාංශ විෂයපථය යටතේ පවතින සමහර රාජ්‍ය ආයතනවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. එබැවින් මුදල් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය ආයතන සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වන වගන්තිය ප්‍රකාරව, අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව කාරක සභාව, ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර, ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව 2022 නොවැම්බර් මස 30 වන දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යැයි ද තීරණය කරන ලදී.

## 2. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජනා

### 2.1 වත්තල, අප්පුගෙවත්ත, අංක 59 හි පදිංචි එච්.ඒ. චුන්දික සුමතිපාල මහතා විසින් ඔහුගේ ව්‍යාපාරය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස ලබා ගන්නා ද්‍රව්‍ය ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙන් ලබා ගැනීමේදී පැන නැගී ඇති ගැටලු සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම - ගරු විජිත හේරත් මහතා (යෝජනා අංක 22)

ඉහත යෝජනාව සම්බන්ධයෙන් කාරක සභාව වෙත යොමු කරන ලද වාර්තාවේ පිටපතක් ගරු විජිත හේරත් මහතා වෙත යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

## 3. වෙනත් කටයුතු

### 3.1 ඔප දමා අපනයනය කිරීම සඳහා ආනයනය කරනු ලබන මැණික් සඳහා අයකරනු ලබන සමාජ ආරක්ෂණ බද්ද ඉවත් කිරීම - ගරු ජානක වක්කුඹුර මහතා

රත්නපුර "නාලන්ද එල්ලාවල" කර්මාන්තපුරයේ මැණික් ආනයනය කොට ඔපදමා අපනයනය කිරීම ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන බවත් එම කර්මාන්තය සඳහා ආනයනය කරනු ලබන මැණික් වෙනුවෙන් 2.5 % ක සමාජ ආරක්ෂණ බද්දක් අය කරනු ලබන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමඟින්, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා එම කර්මාන්තය පවත්වාගෙන යාමට කර්මාන්තකරුවන්ට අපහසු වී ඇති බැවින් ආනයනය කරනු ලබන මැණික්වල වටිනාකමට නොව මැණික් ඔප දැමීමේ අගය එකතු කිරීම මත (value addition) පමණක් බදු පැනවීම සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉහත ගැටලුව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් සමඟ සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

## 3.2 ඩොලමයිට් කර්මාන්තය ආශ්‍රිත ගැටලු - ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ඩොලමයිට් කර්මාන්තය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පුපුරණ ද්‍රව්‍ය ලබාදෙන ලෙසත් ඩොලමයිට් කර්මාන්තයට අවශ්‍ය ඉඩම් ලබාගැනීමේදී ඇතිවන ගැටලු ඇතුළු බිම් මට්ටමේ සුළු ගැටලු විසඳීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඩොලමයිට් කර්මාන්තය සඳහා අවශ්‍ය පුපුරණ ද්‍රව්‍යය ලබාදීමේ ප්‍රමාදයක් පසුගිය කාලය තුළ පැවතිය ද ඉදිරියේදී ක්‍රමාණුකූලව එම ද්‍රව්‍යය ලබාදීමට කටයුතු කරනු ලබන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඉඩම් සම්බන්ධයෙන් ඇතිවන ගැටලු දිස්ත්‍රික් සංවර්ධන කමිටු හරහා ප්‍රාදේශීය ලේකම්වරුන් මාර්ගයෙන් විසඳා ගැනීමට කටයුතු කළ යුතු බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.3 ගරු මධුර විතානගේ මහතා

### 3.3.1 බතික් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

බතික් පුහුණු වැඩසටහන් මගින් පුහුණුව ලැබූ පුද්ගලයින් බොහෝ ප්‍රතිලාභ ලබා ඇති බැවින් බතික් පුහුණු වැඩසටහන් ඉදිරියේදී ද පැවැත්වීමට කටයුතු කරන ලෙසත් විශේෂයෙන් රාජගිරිය ඔබේසේකරපුර පුහුණු මධ්‍යස්ථානයේ බතික් පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉල්ලීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

### 3.3.2 සෙරප්පු, සබන් වැනි නිෂ්පාදන සඳහා පුහුණු කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සෙරප්පු, සබන් වැනි භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයාදිය හැකි බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පසුගිය කාලය තුළ විදේශ විනිමය හිඟවීම හේතුවෙන් කර්මාන්ත ඇරඹීම සඳහා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටලුවක් පැවති බවත් මේ වන විට එම ගැටලුව ක්‍රමානුකූලව විසඳෙමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය වැනි ආයතන මගින් පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා කටයුතු කරන බව ද ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

## 3.4 ගරු බුද්ධික පතිරණ මහතා

### 3.4.1 ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ප්‍රවාහනයේදී පොලිස් නිලධාරීන්ගෙන් මතුවන බාධා ඉවත් කර ගැනීම

ජාතික ශිල්ප සභාව යටතේ ලියාපදිංචි වී ඇති කර්මාන්තකරුවන්ට අවශ්‍ය මැටි, උණ බට, වේවැල්, ලී, පන් ආදී අමුද්‍රව්‍ය බාධාවකින් තොරව ප්‍රවාහනය කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කොට පහසු ක්‍රමවේදයක් සකසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට සංචාරක කර්මාන්තයේ වර්ධනයක් රට තුළ ඇතිවී තිබෙන බැවින් ඉහත අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා ඉහළ ඉල්ලුමක් ඉදිරියේදී ඇතිවිය හැකි බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මැටි ප්‍රවාහනය කිරීමේදී පැවති බාධා මේ වන විට ඉවත් කිරීමට කටයුතු කර ඇති බවත් ඒ අනුව ජාතික ශිල්ප සභාවේ හැඳුනුම්පත අයිති පුද්ගලයන්ට මැටි ප්‍රවාහනයේදී අදාළ අවසරපත් නිකුත් කරන ලෙස ශ්‍රී ලංකා පොලිසිය, ප්‍රාදේශීය ලේකම් හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය දැනුවත් කර ඇති බවත් ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ජාතික ශිල්ප සභාවේ හැඳුනුම්පත ඇති පුද්ගලයන්ට මැටි කියුබ් 03 ක් එකවර ද මාසයකට කියුබ් 06 ක් දක්වා ද ප්‍රවාහනය කිරීම සඳහා අවසර ලබා දී ඇති බව ද ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

වේවැල් සහ උණ බට ප්‍රවාහනය සම්බන්ධයෙන් ගැටලු පවතින බවත් උණ ගස් කැපීමට හා ප්‍රවාහනය සම්බන්ධයෙන් පවතින තහනම් නියෝග ඉවත් කොට විශේෂ අවසරයකින් තොරව උණ ගස් කැපීමට හා ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කර දෙන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.4.2 පිත්තල හිඟයක් පැවතීම හේතුවෙන් කර්මාන්තකරුවන් අපහසුතාවයට පත්වීම

පිත්තල හිඟයක් පැවතීම හේතුවෙන් විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් අපහසුතාවයට පත්වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ටෙලිකොම් ආයතනය, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ආරක්ෂක අමාත්‍යාංශය වැනි ආයතන මගින් සහන මිලට පිත්තල ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බවත් පිත්තල ලබාගත හැකි අනෙකුත් රජයේ ආයතන මගින් ද ඉල්ලීම් කළයුතු බවත් ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳ අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙරට තුළ ලෝහ අමුද්‍රව්‍ය සඳහා පවතින ඉල්ලුම හා මේ වන විට ආනයනය කර ඇති ලෝහ අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් දත්ත ගබඩාවක් සකස් කරන ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට උපදෙස් ලබා දී ඇති බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඉහත කරුණට අදාළ දත්ත රැස් කිරීමේ කටයුතු දැනට සිදුවෙමින් පවතින බවත් සාමාන්‍යයෙන් වසරකට ඩොලර් මිලියන 800 ක පමණ වටිනාකමකින් යුත් ලෝහ මෙරටට ආනයනය කර ඇති බවත් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

2020 වසරේදී කැබිනට් පත්‍රිකාවක් මගින් රජය විසින් අබලි ලෝහ අමුද්‍රව්‍ය ආනයනය තහනම් කර ඇති බැවින් ඊට අනුරූපීව මෙරට ලෝහ නිෂ්පාදනය කිරීමට අදාළ කටයුතු දැනට සකස් වෙමින් පවතින බවත් හම්බන්තොට ප්‍රදේශයේ ලෝහ නිෂ්පාදනය කිරිම සඳහා ආයෝජනය කිරීමට මෙරට පිහිටුවා ඇති සමාගමක් කැමැත්ත පළ කර ඇති බවත් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 3.4.3 දැනට පවතින ක්ලෝරීන් අමුද්‍රව්‍ය තොග ධාරිතාවයේ ප්‍රමාණය

පරන්තන් ප්‍රදේශයේ ක්ලෝරීන් අමුද්‍රව්‍ය නිෂ්පාදන කලාපයක් ආරම්භ කිරීමට කටයුතු පිළියෙල කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දින 50 කට ප්‍රමාණවත් වන පරිදි ක්ලෝරීන් අමුද්‍රව්‍යය තොග ප්‍රමාණයක් දැනට පවතින බව පරන්තන් කෙමිකල්ස් සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

### 3.4.4 ක්ලෝරීන් ප්‍රවාහනයට අදාළ කළමනාකරණ සැලසුම

පරිසර අධිකාරියට අදාළ අනතුරුදායක අමුද්‍රව්‍ය ප්‍රවාහනය (Hazardous Material Transportation) පරිසර සංරක්ෂණ බලපත්‍රය (EPL) මගින් ආවරණය වන බව පරන්තන් කෙමිකල්ස් සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

දැනට එම බලපත්‍රය තාවකාලිකව නතර කර ඇති බව රසායන ද්‍රව්‍ය මගින් සිදුවන අනතුරු ආපදා කළමනාකරණ සැලසුමට ඇතුළත් කිරීම සඳහා ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සාකච්ඡා පවත්වමින් පවතින අතර ඒ සඳහා අදාළ ලිපිලේඛන භාර දී ඇති බවත් පරන්තන් කෙමිකල්ස් සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ක්ලෝරීන් ප්‍රවාහනය කිරීමේදී කුරුණෑගල ගිරිඋල්ල මාර්ගයේදී යම් අනතුරක් සිදුවූ බවත් එවැනි අනතුරු සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශයට වගකීම භාර ගැනීමට සිදුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින් ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් ක්ලෝරීන් ප්‍රවාහනය ක්‍රමාණුකූලව සිදුකිරීම සඳහා විධිමත් පියවරක් ගතයුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම්දෙන ලදී.

රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කටයුතු මෙරට තුළ නිෂ්පාදනය කිරීම සඳහා ලබන වර්ෂයේ (2023) අයවැයෙන් රු. මිලියන 500 ක මුදලක් වෙන් කර ඇති බවත් මෙරට කර්මාන්ත සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා කර්මාන්තකරුවන්ට විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ද අදහස් ලබාගන්නා ලෙස දැනුම් දුන් බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට මෙරට තුළ මෝටර් රථ කොටස් එකලස් කිරීමේ කර්මාන්තයක් (Motor Vehicle Assembling Industry) දියුණු වෙමින් පවතින බවත් ඉදිරියේදී වාහන ආනයනය අනවශ්‍ය පරිදි සිදු නොකර එම කර්මාන්තය ආරක්ෂා කළයුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එසේම, නාන කාමර උපාංග නිෂ්පාදනකරුවන් (bathware manufacturers) මෙරට ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් අයුරින් නිෂ්පාදන සිදු කරන බවත් එම කර්මාන්තය ද ඉදිරියේදී ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගතයුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෝටර් රථවාහන කොටස් එකලස් කිරීමේ කර්මාන්තකරුවන් සමඟ සාකච්ඡා කිරීම සඳහා ඔවුන්ගේ තොරතුරු ලයිස්තුවක්, දුරකතන අංක ද සහිතව ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.4.5 කර්මාන්ත සඳහා වෙන් කරන ලද ඉඩම් වෙනත් කටයුතු සඳහා යොදවා ගැනීම

නිලධාරීන් සියලු කර්මාන්තපුරවලට පිවිස මෙම කරුණු පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කර්මාන්තපුර 16 කට පිවිසි බවත් ඒ අනුව ඉඩම් කැබලි 12 ක් පමණ වෙනත් කටයුතු සඳහා යොදවා ඇති බව හඳුනාගෙන ඇති බවත් කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම 2022 නොවැම්බර් මස අවසානයේදී සියලු කර්මාන්තපුර වෙත පිවිස එම ඉඩම් සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදෙනු ලබන බවත් ඉඩම් හඳුනාගත් පසු පවරා ගැනීමේ කටයුතු සිදුකරනු ලබන බවත් කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පේෂකර්ම දෙපාර්තමේන්තුවට හා සළුසල, ලක්සල ආයතනවලට වෙන්කරන ලද ඉඩම් ද වෙනත් කටයුතු සඳහා යොදාගෙන ඇති බවත් එම දේපල මගින් කිසිදු ආදායම් ඉපයීමක් සිදු නොවන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

එම ඉඩම් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් දෙන ලදී.

### 3.4.6 සළුසල මූලස්ථානය වෙනත් රජයේ ආයතනවල අවශ්‍යතා සඳහා යොදාගැනීම

සළුසල මූලස්ථානය ජනාධිපති ආරක්ෂක අංශයේ හා අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශයේ භාවිතය සඳහා පවරාගෙන තිබේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සළුසල මූලස්ථානය පොලිස් දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු සඳහා කලින් පවරාගෙන තිබූ බව සළුසල සභාපති විසින් දැනුම් දෙන ලදී.

තව ද, කොවිඩ් වසංගතය පැවති කාලය තුළ ජනාධිපති ආරක්ෂක අංශය මගින් ද සළුසල මූලස්ථානය කිසිදු පැවරීමකින් තොරව භාවිතයට ගෙන තිබූ බවත් එහි වෙනම කොටසක් අග්‍රාමාත්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් ද භාවිතයට ගෙන තිබූ බවත් සළුසල සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එම ඉඩමේ අයිතිය නැවත ලබාගැනීම සඳහා දැනට අදාළ පාර්ශව සමග සාකච්ඡා පැවැත්වෙන බව ද සළුසල සභාපති විසින් දැනුම් දෙන ලදී.

ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කොට නැවත සළුසල වෙත යලි එම ඉඩම පවරා ගැනීම සඳහා පියවර ගන්නා ලෙස ගරු රිසාඩ් බදියුදීන් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

යෝක් වීදියේ ලක්සලට අයත් වර්ග අඩි 40,000 ක ඉඩමක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින බව රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.

ඉහත කරුණ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

### 3.4.7 රයිගම කර්මාන්තපුරය ඉදිකිරීමේ වර්තමාන තත්ත්වය

ඉහත කර්මාන්තපුරය සඳහා පැවති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශය මගින් නව ඇස්තමේන්තුවක් ලබා දී ඇති බවත් ඒ සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බවත් කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

### 3.4.8 සම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම සඳහා රජය මගින් මූල්‍යාධාර ලබාදීම

2023 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවට රු. මිලියන 40 ක් ද සාම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 100 ක් ද වෙන් කර ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.4.9 කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කර්මාන්තපුර හා අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2023 වසරට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම

අමාත්‍යාංශය යටතේ පවතින කර්මාන්තපුර සඳහා රු. මිලියන 1200 ක් ද කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කර්මාන්තපුර සඳහා රු. මිලියන 100 ක් ද වෙන් කර ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැඩිපුර මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට අවධානය යොමු කරන ලෙස ගරු රිසාඩ් බදියුදීන් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.5 ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

### 3.5.1 මැටි ප්‍රවාහනය සඳහා අවසර ලබාදීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලිඛිත උපදෙස් ලබාදීම

සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම ලිඛිතව දැනුවත් කර ඇති බව ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඉහත කරුණ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇති ලේඛනයේ පිටපතක් ගරු මන්ත්‍රීතුමා වෙත ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

### 3.5.2 මැටි ප්‍රවාහනය සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අවසර ලබාදීම

ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් මැටි අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදන කටයුතු සිදුකෙරෙන බැවින් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ද මැටි ප්‍රවාහනය සඳහා අවසර ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මැටි කර්මාන්තකරුවන්ට අපහසුතාවයකින් තොරව මැටි ප්‍රවාහනය සඳහා අවසර ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

### 3.5.3 මිනිරන් පතල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන නවීකරණය කොට විදේශ විනිමය ඉපයීම සඳහා යෙදවීම

මිනිරන් පතල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සඳහා අගය එකතු කොට (value addition) අපනයනය කිරීම මගින් විශාල වශයෙන් විදේශ විනිමය ඉපැයීමට හැකිවනු ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් නව වැඩසටහන් දියත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මිනිරන් පතල්වල සේවය කරන සේවකයන් විසින් දිනකට නිෂ්පාදනය කරනු ලබන්නේ මිනිරන් මෙට්‍රික් ටොන් 60 ක පමණ ප්‍රමාණයක් බවත් මිනිරන් පතල පිහිටි ඉඩම සම්බන්ධයෙන් ද ගැටලු පැන නැගී ඇති බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් දැනුම් දෙන ලදී.

මිනිරන් පතල්වල සේවය කරන සේවකයන්ට ලබාදෙනු ලබන වැටුප්, දීමනා ආදිය වර්තමානයේ පවතින ජීවන වියදම් තත්ත්වයන් යටතේ ප්‍රමාණවත් නොවන බැවින් ඔවුන්ගේ සේවයට සරිලන වැටුප් ක්‍රමයක් සහිත නව වැටසටහනක් දියත් කිරීම සඳහා කටයුතු සංවිධානය කරමින් පවතින බව ද රාජ්‍ය අමාත්‍ය, ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් දැනුම් දෙන ලදී.

මිනිරන් සඳහා අගය එකතු කිරීමේ පියවර 3 ක් පවතින බව එනම්, කැනීම් කර ලබාගන්නා මිනිරන් පිරිපහදු කොට අගය එකතු කිරීමෙන් සංශුද්ධ මිනිරන් නිපදවා එම මිනිරන් භාවිතයෙන් අවසාන භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් කටයුතු සම්පාදනය කරනු ලබන බව කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව, පිරිපහදු යන්ත්‍රාගාරය හා ඇඹරුම් යන්ත්‍රාගාරය ස්ථාපනය කළ පසු මිනිරන් සඳහා අගය එකතු කිරීමේ කාර්යයේ 40% ක් 50 % ක් වැනි ප්‍රමාණයක් සම්පූර්ණ වන බවත් එමගින් අවසාන නිෂ්පාදනයකට ප්‍රමාණවත් ආකාරයේ ප්‍රමිතියෙන් යුතු මිනිරන් නිෂ්පාදනය කිරීමට හැකිවනු ඇති බවත් කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

2025 වසර වන විට ලංකාවේ මිනිරන් භාවිතයෙන් ලෝක වෙළෙඳපොලේ ඉල්ලුමක් තිබෙන අවසාන නිෂ්පාදනයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව ද කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මිනිරන් පිරිපහදු යන්ත්‍රය ස්ථානගත කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල ද ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති බවත් එම යන්ත්‍රය මිළදී ගැනීමේ කටයුතු සිදුකළ යුතු බවත් කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පසුගිය සති කීපය තුළ විශාල වශයෙන් ආයෝජකයන් පැමිණි බවත් මිනිරන් සඳහා විශාල ඉල්ලුමක් පවතින බවත් කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එබැවින්, මිනිරන් නිෂ්පාදන කටයුතු සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගතයුතු බවත් මිනිරන් නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ කටයුතු සිදුකළ යුතු බවත් කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මෙරට තුළ මිනිරන් කර්මාන්තයේ ප්‍රගතියක් ඇති කිරීම සඳහා කටයුතු කළයුතු බවත් කර්මාන්තය වැඩිදියුණු කිරීමට යම් ඉලක්කගත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනවල නිලධාරීන් විසින් නිසි පියවර ගතයුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ලංකාවේ මිනිරන් සඳහා පවතින ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීමේ ගැටලුවක් පවතින බැවින් 2023 වසරේදී මිනිරන් කර්මාන්තය සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට ද මිනිරන් කර්මාන්තය සංවර්ධනය කිරීමට අයෝජකයින් කැඳවීමට ද පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී

අගය එකතු කිරීමේ ක්‍රියාවලියට අමතරව මිනිරන් පතල්වල සේවය කරන සේවකයන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් නිලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බවත් ඔවුන් දිරිගැන්වීම සඳහා කටයුතු කළයුතු බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් දැනුම් දෙන ලදී.

නිෂ්පාදන ධාරිතාවය පදනම් කොටගත් දිරිදීමනා ලබාදීමේ ක්‍රමවේදයක් (Productivity based Incentive Scheme) සකස් කිරීම සඳහා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් දෙන ලදී.

පසුගිය වසර 18 ක් තිස්සේ මිනිරන් පතල් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ඉඩම් සම්බන්ධයෙන් පැවති නීතිමය ගැටලුවලට විසඳුම් ලැබී නොතිබුණු බවත් ඉතා කෙටි කාලයක් තුළ එම ගැටලුවලට විසඳුම් ලබාදීමට ක්‍රියාකළ බවත් කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මිනිරන් පතල් කර්මාන්තය නගාසිටුවීමට ආයෝජකයන් ආකර්ශණය කර ගැනීම සඳහා මිනිරන් නිධියේ සංචිතය කොපමණද යන්න පිළිබඳව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් මිනුම් කටයුතු සිදුකොට අනුමත කරන ලද වාර්තාවක් ලබාදෙන ලෙස කහටගහ ග්‍රැෆයිට් සමාගමේ සභාපති විසින් ඉල්ලීමක් කරන ලදී.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පවතින්නේ පරිසර අමාත්‍යාංශය යටතේ බැවින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස පරිසර අමාත්‍යාංශයට දැනුම් දී ඇති බවත් ග්‍රැෆයිට් පමණක් නොව ඉල්මනයිට්, රූටයිල්, මොනොසයිට් වැනි අනෙකුත් අමුද්‍රව්‍යවල සංචිත සම්බන්ධයෙන් ද වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලද බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.6 මාතලේ ඇලහැර ප්‍රදේශයේ මැණික් ගැරීමේ අවස්ථාව සාමාන්‍ය ජනතාවට ලබාදීම - ගරු නාලක කෝට්ටෙගොඩ මහතා

මාතලේ ඇලහැර ප්‍රදේශයේ බැකෝ යන්ත්‍ර යොදාගෙන මැණික් ගැරීමේ කටයුතු සිදු කරනු ලබන බවත් ඉහළ වටිනාකමින් හා ගුණාත්මක බවින් වැඩි මැණික් එම ප්‍රදේශයේ පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කෙසේ වුව ද, මැණික් ගැරීමේ කටයුතු මහා පරිමාණ වෙළෙඳුන්ට පමණක් සීමා වී ඇති බවත් එහි ප්‍රතිලාභ සුළු පිරිසක් අතර බෙදී යන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, සාමාන්‍ය ජනතාවට ද මැණික් ගැරීමේ කටයුතු සිදුකොට ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අවසර පත් ලබාදීමේ ක්‍රමවේදයක් (One Time Permit) සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පාරිසරික සාධක ද සලකා බලා ඉහත ඉල්ලීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

රාජ්‍ය අමාත්‍ය, ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් ද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

## 3.7 ගරු රිසාඩ් බදියුදීන් මහතා

### 3.7.1 පොල් කොහු කර්මාන්තයේ යෙදෙන ජනතාවට ප්‍රමාණවත් ප්‍රතිලාභ සපයා දීම

පුත්තලම මදුරන්කුලි ප්‍රදේශයේ පොල් කොහු කර්මාන්තයේ නිරත වන ජනතාවට වර්තමානයේදී ද ලබාදෙන්නේ දැනට වසර ගණනාවකට පෙර ලබාදෙන ලද දීමනාව පමණක් බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම කර්මාන්තයේ නිරතවන ප්‍රධාන අපනයනකරුවන් කැඳවා කර්මාන්තයේ යෙදෙන සේවකයන්ට ප්‍රමාණවත් සාධාරණ දීමනාවක් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පොල් කොහු කර්මාන්තය ආශ්‍රිත අපනයනකරුවන් සමඟ ඉහත කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කොට සාධාරණ මුදලක් ලබාදීමට කටයුතු කරන ලෙස දැනුම් දුන් බවත් මෙම කර්මාන්තයේ යෙදිය හැකි නව අපනයනකරුවන් සිටීනම් අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා කොට නව ආයෝජන අවස්ථා සලසා දියහැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.7.2 එලිෆන්ට් පාස් මාන්තායි ලුණු ලේවායන් රජයේ සහ පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ පවත්වාගෙන යාම

එලිෆන්ට් පාස් හා මන්තායි සෝල්ට් යන ආයතන දෙක ජාතික ලුණු සංස්ථාව යටතේ පවතින බවත් එම ලේවාය රජයේ සහ පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ පවත්වාගෙන යාම සඳහා කැබිනට් පත්‍රිකාවක් යොමු කරන අවස්ථාවේදී මෙම ලේවාය සංවර්ධනය කිරීම සඳහා මුදල් නොතිබූ බවත් ජාතික ලුණු සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

කෙසේ වුව ද, දැනට එලිෆන්ට් පාස් සහ මන්නාරම ලේවායන් මගින් උපයා ගන්නා ලද මුදල් මෙම ලේවාය සංවර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් බැවින් පෞද්ගලික හවුල්කාරීත්වයක් අවශ්‍ය නොවන බවත් මාස 06 ක් තුල අදාළ සංවර්ධන කටයුතුවල පළමු අදියර අවසන් කිරිමට හැකි වනු ඇති බවත් ජාතික ලුණු සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඉහත කී පරිදි, එම සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් දෙන ලදී.

### 3.7.3 පරන්තන් කෙමිකල්ස් සමාගම සංවර්ධනය කිරීම

පරන්තන් කෙමිකල්ස් සමාගම සඳහා වෙන්කරන ලද මූල්‍ය ප්‍රතිපාදන මගින් සිදුකිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතු සිදු කෙරෙන ආකාරය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එහි යටිතල පහසුකම් සංවර්ධනය කොට රජයේ හා පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ සමාගමේ කටයුතු කළමනාකරණය කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ප්‍රදේශයේ රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කලාපයක් ඇති කිරීමට කටයුතු කරන බවත් පරන්තන් කෙමිකල්ස් සමාගමේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කලාපය තුළ අයෝජන කටයුතු සිදුකිරීම සඳහා රසායන ද්‍රව්‍ය නිෂ්පාදනකරුවන්ට කැඳවීම් කිරීමට බලාපොරොත්තුවන බව ද අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

පරන්තන් කර්මාන්ත කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා උපදේශකයකු බඳවා ගැනීම සඳහා වන පුවත්පත් දැන්වීම මෙම

සතියේ පුවත්පතේ පළවන බව පරන්තන් කෙමිකල්ස් සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදි.

පරන්තන් කර්මාන්තය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබනු බවත් අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කළ පසු එම මුදල ප්‍රතිපූර්ණය කරනු ලබන බවත් පරන්තන් කෙමිකල්ස් සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

### 3.7.4 මිල්ලනිය කර්මාන්තපුරයේ වර්තමාන තත්ත්වය

මිල්ලනිය කර්මාන්තපුරය සම්බන්ධයෙන් පාරිසරික ගැටලුවක් මතු වූ බවත් පලාත් පාලන ආයතන මගින් බාධා කිරීමකට ලක් වූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කෙසේ වුව ද, දැනට එම කර්මාන්තපුරය ආරම්භ කිරීමට හැකියාව ඇති මට්ටමක පවතින බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට කර්මාන්තකරුවන් 14 දෙනෙකු තෝරාගෙන ඇති බවත් ප්‍රවිශ්ඨ මාර්ගයේ (Access Road) කටයුතු අවසන් කළ පසු කර්මාන්තපුරය ආරම්භ කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ඉඩම් ලබාදීමේදී පුවත්පත් දැන්වීම් මගින් මහජනතාව දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී

කර්මාන්ත ආරම්භ කිරීම සඳහා වෙන් කරන ලද ඉඩම්වලින් දැනට හිස්ව පවතින ඉඩම් සහ ඌණ උපයෝජිත ඉඩම් පිළිබඳ විස්තර ලබාගෙන ඒවා පුවත්පත් දැන්වීමක් මගින් මහජනතාව දැනුවත් කොට නැවත ලබාදීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

### 3.7.5 වැලිඔය සහ මන්නාරම කර්මාන්තපුරවල වර්තමාන තත්ත්වය

එම කර්මාන්තපුර සම්බන්ධයෙන් වාර්තාවක් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කර්මාන්තපුරවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් සකස් කරන ලද වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

## 3.8 ගරු වරුණ ලියනගේ මහතා

### 3.8.1 ඇහැලියගොඩ මැණික් වෙන්දේසියේ ලාභය

2021 වර්ෂයේ ඔක්තෝබර් මස පැවති වෙන්දේසිය මගින් රු. මිලියන 12 ක පමණ ලාභයක් ලබාගැනීමට හැකිවූ බව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 3.8.2 කඩුවෙල ප්‍රදේශයේ පවතින මැණික් කැපීමේ පුහුණු මධ්‍යස්ථානය සුදුසු ප්‍රදේශයක ස්ථාපිත කිරීම

ඉහළ පිරිවැයක් දරා පවත්වාගෙන යනු ලබන කඩුවෙල ප්‍රදේශයේ පවතින මැණික් කැපීමේ පුහුණු මධ්‍යස්ථානය රත්නපුර හෝ බේරුවල ප්‍රදේශයේ ස්ථාපිත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ලබන වසරේ සිට බේරුවල, නිවිතිගල, මාතලේ ලග්ගල ඇතුළු ප්‍රදේශ ගණනාවක මැණික් කැපීමේ පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් දැනුම් දෙන ලදී.

2022 වර්ෂයේ අයවැය යෝජනා මගින් මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය හා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යන ආයතන 02 ඒකාබද්ධ කිරීම සඳහා යෝජනා කර ඇති බවත් එමගින් දැනට පවතින ගැටලු බොහොමයක් විසඳෙනු ඇති බවත් කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දැනට ශ්‍රී ලංකාවේ අවුරුදු 10 - 20 අතර ජනගහනය ලක්ෂ 35 ක් වන බවත් ඉදිරි වසර කීහිපය තුළ එම ජන කොට්ඨාශය රැකියා වෙළෙඳපොලට එකතු වන බැවින් ඔවුන් රැකියා ලබාගැනීම සඳහා අවශ්‍ය පුහුණු කටයුතු සපුරාලීම සඳහා වෘත්තීය පුහුණු ආයතන මගින් අවශ්‍ය පියවර ගතයුතු බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.8.3 අපනයනය කරනු ලබන මැණික්වල වටිනාකමින් 5% ක මුදලක් වැයකර මැණික් ගල්වල ප්‍රමිතිය මැනබැලීම සඳහා යන්ත්‍රයක් මිලදී ගැනීම

මැණික් අපනයනකරුවන්ගෙන් 5% ක මුදලක් මැණික් ගල්වල දැඩිභාවය (Hardness) පිළිබඳ ප්‍රමිතිය මැන බැලීම සඳහා රසායනාගාර යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලබාගැනීම සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඒ සම්බන්ධයෙන් 2011 වසරේදී පමණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ සංගමය අතර එල්.ජී. එල් නම් සමාගමක් ඇති කරනු ලැබුව ද නීතිපති විසින් දෙන ලද උපදෙස් පරිදි එම සමාගම පවත්වාගෙන යාමට නීතිමය ගැටලුවක් පැනනැගුණු බවත් මැණික් හා ස්වර්ණාභරන අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඉහත කාර්යය සඳහා වෙන් කරන ලද රු. මිලියන 200 ක පමණ මුදලක් ඉහත සමාගම සතු ගිණුමේ පවතින බවත් නීතිමය ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බවත් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඉහත සමාගම ඇවර කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන එකී තැන්පත් මුදල මැණික්වල ප්‍රමිතිය මැනීම සඳහා වන රසායනාගාරයක් ඉදිකිරීම සඳහා යෙදවීමට අවශ්‍ය කඩිනම් පියවර ගෙන ඒ පිළිබඳව දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

ඉහත සමාගම ඈවර කිරීම හා සමාගම සතු මුදල නිදහස් කරගැනීම සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ හා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ උපදෙස් ලබාගෙන රසායනාගාරයට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය මුදලේ ඇස්තමේන්තුව ද ඇතුළත් කොට ඉදිරි කාරක සභාවට ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසටත් මාස 03 කාලයක් තුළ ඉහත යන්ත්‍රය මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසටත් ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

## 3.9 ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා

### 3.9.1 ආර්ථික අර්බුදය අතරතුර කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් (SMEs) මුහුණ දෙන ගැටලු

මෙරට දළ දේශීය නිෂ්පාදිතයට 50% ක පමණ දායකත්වයක් දක්වනු ලබන හා ලක්ෂ 45ක පමණ යැපෙන්නන් සිටින මෙරට කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වර්තමානයේ මෙරට පවතින ආර්ථික අර්බුදය තුළ මහත් දුෂ්කරතාවයන්ට පත්වන බව ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා සහනයක් වශයෙන් ලබාදුන් මූල්‍ය ප්‍රාග්ධනය සඳහා ඉහළ පොලියක් ගෙවීමට සිදුවීමෙන් ඔවුන්ගේ ණයගැතිභාවය තවදුරටත් උග්‍රවී ඇති බව ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

ඔවුන්ගේ ගැටලු විසඳීම සඳහා ගනු ලබන පියවර සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

මහබැංකුවේ අධිපති විසින් ප්‍රකාශ කර ඇති ආකාරයට උද්ධමනය ක්‍රමයෙන් අඩුවන විට ලබන වර්ෂයේ මාර්තු මාසය පමණ වන විට පොළී අනුපාත 15 % - 20% අතර ප්‍රමාණයට අඩුකර ගැනීමට හැකි වනු ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අයවැයෙන් රු. බිලියන 2කට අධික මුදලක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය කටයුතු නගාසිටුවීම සඳහා අඩු පොළී අනුපාතයක් යටතේ ව්‍යවසායකරුවන්ට ලබාදීමට වෙන් කර ඇති බව ද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

බැංකු පද්ධතිය හරහා අයදුම්කරනු ලබන ව්‍යවසායකයින්ට බැංකුකරුවන්, භාණ්ඩාගාර නියෝජිත හා අමාත්‍යාංශ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් මගින් එම අරමුදල් ලබාදිය යුතු ව්‍යවසායකරුවන් තෝරාගෙන ණය අරමුදල් ලබාදෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ව්‍යවසායකයින් තෝරාගැනීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතුව සිදු කරන ලෙසට ගරු විපක්ෂනායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

විවිධ අමාත්‍යාංශ යටතේ රජයේ ව්‍යාපෘති සිදුකරන ලද කොන්ත්‍රාත්කරුවන්ට අදාළ බිල්පත් ගෙවීම සඳහා රු. බිලියන 200 ක් වෙන් කර ඇති බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මුදල් අමාත්‍යාංශය මගින් ඉහත වෙන් කරන ලද මුදල් කොන්ත්‍රාත්කරුවන්ට ලබාදීමේ ක්‍රමවේදය විනිවිදභාවයෙන් යුතුව සිදු කරන ලෙසට ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කර්මාන්තවල නිරත නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් යන දෙපාර්ශවයම ආරක්ෂාවන මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් රජය විසින් අනුගමනය කළ යුතු බව ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

නාන කාමර නිෂ්පාදන සඳහා මිල පාලනයක් සිදු කළයුතු බවත් පාරිභෝගික සේවා අධිකාරිය විසින් ඒ සඳහා මැදිහත්වීමක් සිදු කළයුතු බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

එසේ නොමැති වුවහොත් වර්තමානයේ ඇති ආර්ථික අර්බුද තත්ත්වය හේතුපාදක කරගෙන අනවශ්‍ය අයුරින් මිල ඉහළ නංවන බවත් පිරිවැයට සරිලන සාධාරණ පාලන මිලක් නියම කිරීමට කටයුතු කළ යුතු බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.9.2 මෙරට ක්‍රියාත්මක සම්ප්‍රදායානුකූල කර්මාන්ත ගම්මාන

මෙම කර්මාන්ත සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ආයතනවල තොරතුරු ඇතුලත් ලැයිස්තුවක් ලබාදෙන ලෙස ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙරට ක්‍රියාත්මක සම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන පිහිටි දිස්ත්‍රික්ක හා ප්‍රදේශය ඇතුළු තොරතුරු ඇතුළත් ලැයිස්තුවක් හා සම්ප්‍රදායානුකූල කර්මාන්ත සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබන ආයතනවල නිලධාරීන්ගේ නම් සහ දුරකථන අංක ඇතුළත් වාර්තාවක් ගරු විපක්ෂ නායකතුමාට ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

### 3.9.3 ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ලක්සල හා සළුසල යන ආයතන ඒකාබද්ධව සංවිධානය වී මෙරට කර්මාන්ත නගාසිටුවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ලක්සල හා සළුසල යන ආයතන ඒකාබද්ධව සංවිධානය වී මෙරට කර්මාන්ත නගාසිටුවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළයුතු බව ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ආයතන සාම්ප්‍රදායිකත්වයෙන් බැහැරවී නව නිෂ්පාදන හඳුන්වා දී නව දැක්මකින් ඉදිරියට යාම සඳහා කටයුතු කළ යුතු බව ද ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට ඒ සම්බන්ධයෙන් විදේශ රටවල වෙළෙඳ කටයුතු පිළිබඳ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වන බව රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

කොළඹ සෞන්දර්ය විශ්වවිද්‍යාලය, මොරටුව මෝස්තර මධ්‍යස්ථානය, තොරතුරු තාක්ෂණ ආයතනය මගින් ලෝක වෙළෙඳපොලට යොමු කළ හැකි ප්‍රමිතියෙන්

යුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස දැනුම් දී ඇති බව ද රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

ජාතික ශිල්ප සභාවෙන් "ක්‍රාෆ්ටින් සිලෝන්" නමින් දීප ව්‍යාප්ත වැඩසටහනක් පවත්වාගෙන යන බවත් අවම අමුද්‍රව්‍ය භාවිතයෙන් ලෝක වෙළෙඳපොළට නව නිෂ්පාදන හඳුන්වා දියයුතු ආකාරය පිළිබඳ වැඩසටහනක් දියත් කරන බවත් ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

එමගින් මෙම වසර අවසානය වන විට ලෝක වෙළෙඳපොළට අපනයනකරුවන් 100 දෙනෙකු පමණ බිහි කිරීමට අපේක්ෂා කරන බව ද ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඉන්දුනීසියාව හා තායිලන්තය වැනි රටවල සාම්ප්‍රදායික නිෂ්පාදන සඳහා ඉහළ වෙළෙඳපොළක් පවතින බව ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

එම රටවල වෙළෙඳපොළ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ජාතික ශිල්ප සභාව, ලක්සල ඇතුළු ආයතන කීපයක නිලධාරීන් තායිලන්තයේ පැවති වෙළෙඳ ප්‍රදර්ශනයකට මෑතකදී සහභාගී වූ බවත් එහිදී පැවති සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් මෙරට නිෂ්පාදන තායිලන්තයේ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා මණ්ඩපයක් ලබා ගැනීමට හැකි වූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තවදුරටත් මෙරට ශිල්පීන්ගේ නිර්මාණ තායිලන්තය තුල අලෙවි කිරීම සඳහා සහනදායී මිලක් යටතේ වෙළෙඳ කුටි මිලදී ගැනීම සඳහා සාකච්ඡා පවත්වමින් පවතින බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

භාණ්ඩ අලෙවිකරණයේදී අතරමැදියන් විසින් වැඩි වාසි ලබාගන්නා බවත් එමගින් නිෂ්පාදකයින් අසාධාරණයට ලක්වන බවත් ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින් භාණ්ඩ නිෂ්පාදකයන් හා පාරිභෝගිකයින් ඍජුව සම්බන්ධ කළ හැකි ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා කටයුතු කරන ලෙස ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා පහසුකම් සපයන්නා ලෙස ජාතික ශිල්ප සභාව කටයුතු කළ යුතු බව ද ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (National Enterprises Development Authority – NEDA) හා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් වෙබ් අඩවි 2 ක් නිර්මාණය කරන ලද බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ජාතික ශිල්ප සභාව මගින් "ලක් ශිල්ප ඩොට් කොම්" නමින් ලොව පුරා සිටින පාරිභෝගිකයන් සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඇති බවත් ඒ හරහා දැනට මිලදී ගැනීම් සිදුවන බවත් ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව "ෆෙයා ට්‍රේඩ්" සංකල්පය යටතේ කර්මාන්තකරුවන්ගෙන් නිෂ්පාදන මිලදී ගෙන ජාතික ශිල්ප සභාවේ ප්‍රදර්ශනාගාර හරහා විකිණුම් කටයුතු සිදු කරන බව ද ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

"මේඩ් ඉන් ශ්‍රී ලංකා ඩොට් ඕආර්ජී" (madeinsrilanka.org) නමින් වෙබ් අඩවියක් නිර්මාණය කරන ලද බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

දැනට ඒ සඳහා ව්‍යවසායකයන් 700 පමණ පිරිසක් සම්බන්ධ වී ඇති බව ද ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

භාණ්ඩ ප්‍රවාහන කටයුතු සිදුකිරීම සඳහා ලොව ප්‍රමුඛ ආයතන සම්බන්ධ වී ඇති බවත් ලබන වසරේ (2023) සිට වෙළෙඳ කටයුතු සිදුකිරීම සඳහා සියලු අන්තර්ජාල වෙළෙඳ පහසුකම් සහිත ප්‍රමුඛ වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට අපේක්ෂා කරන බවත් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඉහත වෙබ් අඩවිය සම්බන්ධයෙන් කාන්තා ව්‍යවසායකයින්ට දැනුම ලබාදීම සඳහා යුනිඩෝ ආයතනයේ ආධාර යටතේ වැඩසටහන් දියත් කරන ලද බවත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කළ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

කාන්තා ව්‍යවසායකයින් සඳහා රු 250,000/- බැගින් ලබාදීමට මුදල් වෙන් කර ඇති බැවින් ඔවුන් පුහුණු කිරීම සඳහා ද යුනිඩෝ ආයතනයේ සහාය ලබාගන්නා ලෙස ද ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.9.4. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරකම්

කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් රටෙහි ස්ථානගත කර ඇති ක්‍රමවේදය පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

එක් දිස්ත්‍රික්කයක් සඳහා නිලධාරීන් 05 දෙනෙකු බැගින් අනුයුක්ත කර ඇති බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට එක් ව්‍යවසායකත්ව කළමණාකරුවෙක් බැගින් පත් කර ඇති බවත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ආසන්න වශයෙන් එක් නිලධාරියා බැගින් පත් කර ඇති බව ද කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ඩයලොග් ආයතනය හා මිලේනියම් ඉන්ෆොමැටික්ස් ආයතනය සමඟ එක්ව ඊබේ (e-bay) ඇමසන් (Amazon) වැනි වෙළෙඳ ආයතන හරහා ලොව සිටින සියලු පාරිභෝගිකයන්ට නිෂ්පාදන හඳුන්වාදීමේ වැඩසටහනක් කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් දියත් කරනු ලබන බව කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

භාණ්ඩ නිෂ්පාදනකයන්ට තම තමන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙනම වෙබ් අඩවි නිර්මාණය කර ගැනීම සඳහා අවකාශ සලසා දී ඇති බවත් ඒ සඳහා

පුහුණු කිරීමේ කටයුතු ඉදිරි සතිය තුළ ආරම්භ කිරීමට කටයුතු කරන බවත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

"විදාතා" වැඩසටහන මගින් ද කර්මාන්තකරුවන් පුහුණු කිරීමේ කටයුතු සිදුවන බවත් පුහුණු කටයුතු සිදුකරනු ලබන සියලු ආයතන අතර සම්බන්ධීකරණයක් පැවතිය යුතු බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

එසේ නොමැති වුවහොත් සියලු පුහුණු වැඩසටහන් සඳහා එකම ව්‍යවසායකයන් පිරිසක් සහභාගී වන ප්‍රවණතාවයක් පවතින බව ද රාජ්‍ය අමාත්‍ය, ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 04.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2022 නොවැම්බර් 25**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (සභාපති)
ගරු ලොහාන් රත්වත්තේ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු එම්. රාමේෂ්වරන් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු එම්. එස්. තවුෆික් මහතා
ගරු එම්. උදයකුමාර් මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1** 2013 සහ 2014 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සීනි සමාගමේ වාර්ෂික වාර්තා
**1.2** 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා
**1.3** 2015 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව
**1.4** 2017 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.5** 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
**1.6** 2019 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව
**1.7** 2019 වර්ෂය සඳහා පොල් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.8** 2019 වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව
**1.9** 2019 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.10** 2019 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව
**1.11** 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව
**1.12** 2020 වර්ෂය සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තාව
**1.13** 2020 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

සලකා බැලීමෙන් අනතුරුව, වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**2. ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත යෝජනා**

**2.1** තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයෙහි ඡායාරූප ශිල්පී රාජිත නිරෝෂන් ගමගේ මහතාගේ තනතුර හා උසස්වීමේ ක්‍රියාවලිය අහිමි වීම සම්බන්ධව එම මහතා විසින් කරන ලද නැවත ඉල්ලීම - ගරු සංජීව එදිරිමාන්න මහතා (යෝජනා අංක 26 )

ගරු මන්ත්‍රීතුමා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 ගරු උදයකාන්ත ගුණතිලක මහතා**

**3.1.1 පොල් වගාවන්ට හානි කරන සුදු මැස්සාගේ සීඝ්‍ර ව්‍යාප්තිය**

සුදු මැස්සාගේ කෘමි හානියට ලක් වී ඇති පොල් ගස්වල 50%ක් පමණ අතු කඩා වැටී ඇති අතර එලදාවේ ද සැලකිය යුතු අඩුවක් දක්නට ලැබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට අමතරව, පොල් වගාවන් වඳුරන්ගේ හානියට සහ මයිටාවාගේ හානියට ද ලක්ව ඇති බැවින් එලදාවේ අඩුවීම තවදුරටත් උග්‍ර වී ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සුදු මැස්සාගේ කෘමි හානිය සඳහා හඳුන්වා දී ඇති ඇතැම් කෘමිනාශක වගාවන්ට යෙදීමේදී විවිධ ප්‍රායෝගික ගැටලු ඇතිව තිබෙන බැවින් මේ සඳහා කඩිනම් විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම රෝගයේ තීව්‍රතාවය පසුගිය වසරවලට වඩා වැඩි වී ඇති අතර මෙම කෘමි උවදුර පාලනයට අවශ්‍ය කෘමිනාශක ඉසින යන්ත්‍රවල පැවති හිඟතාව මඟහරවමින් මේ වන විට එම යන්ත්‍ර ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණය ආයතනය එක්ව මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

පළමුව මෙයට පිළියමක් ලෙස "ඇක්ටාරා" සහ "මාෂල් 20" යන රසායනික ද්‍රව්‍ය භාවිතා කළ නමුත්, ඉන් පරිසරයට සහ හිතකර කෘමීන්ට සිදුවන හානිය සැලකිල්ලට ගෙන මේ වන විට කොහොඹ තෙල් සහ සබන් වතුර මිශ්‍රණයක් මෙම කෘමින් පාලනයට යොදා ගන්නා බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එක් එක් දිස්ත්‍රික්කය තුළ සිදුව ඇති කෘමි හානිය සම්බන්ධව දිවයින පුරා දත්ත රැස් කිරීමක් සිදු කර ඇති බව ද පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

පොල් වගා කිරීමේ මණ්ඩලය සතුව දිවයින පුරා කෘමිනාශක ඉසින යන්ත්‍ර 200ක් විසිර පැවති අතර අවශ්‍යතාවය අනුව කෘමි උවදුර දරුණු ලෙස බල පැවැත්වෙන ප්‍රදේශ සඳහා එම යන්ත්‍ර මේ වන විට බෙදා හැර ඇති බවත් කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා මින් යන්ත්‍ර 11ක් ලබා දී ඇති බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

දිවයින පුරා පොල් වගා කර ඇති ඉඩම් අක්කර 26,000ක් පමණ ආවරණය වන පරිදි අදාළ ඉඩම් හිමියන් මෙම උවදුර මැඩපැවැත්වීම සම්බන්ධව දැනුවත් කර ඇති නමුත්, එම පිළියම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණවල හිඟයක් වෙළෙඳපොළ තුළ පවතින බව ද පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රදේශ පිළිබඳව නැවත පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය වෙත උපදෙස් ලබා දෙන ලදී.

වයඹ පළාත තුළ ද මෙම හානිය බරපතල ලෙස දැකිය හැකි බව ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් දැනුම් දෙන ලදී.

පොල් පර්යේෂණායතනයේ සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිවරුන්ට එම ප්‍රදේශ පිළිබඳව ද අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 3.1.2 පොල් පැළ අලෙවි කිරීම

පසුගිය කාලයේ පෞද්ගලික ව්‍යවසායකයින් අතර පොල් පැළ නිෂ්පාදනය කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පොල් තවාන්කරුවන් විසින් පොල් පැළ නිෂ්පාදනය කළ ද, මේ වන විට එම පැළ අලෙවි කර ගැනීමට නොහැකි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දිවයින පුරා පොල් පැළ තවාන් ව්‍යාප්ත කිරිමේ අරමුණ ඇතිව පොල් වගා කිරිමේ මණ්ඩලය විසින් ජනතාව වෙත පොල් බීජ ලබා දුන් නමුත්, එසේ නිෂ්පාදනය කරන ලද පොල් පැළ මිලදී ගැනීම සඳහා පවතින ආර්ථික අර්බුදය සමඟ රජයට නොහැකි වී තිබීම හේතුවෙන්, නිෂ්පාදකයින් මෙම ගැටලුවට මුහුණ දී ඇති බව ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, පෞද්ගලික අංශය හෝ සම්බන්ධ කර ගනිමින් මේ සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2020 වසරේ මිලියන 02ක් වූ පොල් පැළ නිෂ්පාදනය මෙම වසරේ අවම වශයෙන් මිලියන 6ක් දක්වා වැඩි කර ගැනීම සඳහා එක් ඒකකයකින් පැළ 5000ක් නිෂ්පාදනය කිරීමේ අරමුණ ඇතිව පෞද්ගලික ව්‍යවසායකයින් මඟින් මෙම පැළ තවාන් ආරම්භ කළ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එසේ නිෂ්පාදනය කරන පැළ මන්ත්‍රීවරුන්ට වාර්ෂිකව ලබා දෙන විමධ්‍යගත මුදල් මඟින් මිලදී ගැනීමට සැලසුම් කර තිබූ බව ද ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එහෙත්, පවතින ආර්ථික තත්ත්වය හමුවේ එම මුදල් මන්ත්‍රීවරුන්ට නොලැබීම හේතුවෙන් මෙම ගැටලුව ඇති වූ බවත් මේ වන විට කැබිනට් අනුමැතියක් මඟින් මෙම පොල් පැළ මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට අමතරව, පෞද්ගලික ගැනුම්කරුවන් හට මෙම පැළ අලෙවි කිරීමට නිෂ්පාදකයින් දිරි ගන්වා ඇති බවත් මෙම පොල් පැළ මිලදී ගැනීම සඳහා රු. මිලියන 296ක් අවශ්‍ය බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

රජය විසින් නව පොල් පැළ මිලදී ගැනීමේදී මෙලෙස නිෂ්පාදනය කරන ලද පොල් පැල මිලදී ගැනීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලෙසට ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම පොල් පැළ මිලදී ගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලැබුනහොත් මිලදී ගැනීමේ හැකියාව පවතින බවත් එසේ නොමැති නම් "කප්රුක සමිති" හරහා හෝ මෙම පොල් පැළ අලෙවි කිරිමට පවතින හැකියාව පිළිබඳ මේ වන විට සලකා බලමින් පවතින බවත් පොල් වගා කිරිමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

කෙසේ වෙතත්, මේ වන විටත් තම ආයතනය සතුව පොල් පැළ අතිරික්තයක් පවතින බැවින් මෙම පොල් පැළ මිලදී ගෙන ඇතත් නැවත බෙදා දීමේ

ක්‍රමවේදයක් සකස් කිරීමේ අවශ්‍යතාව ද පවතින බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ වන විට පොල් වගා කිරීමේ මණ්ඩලය යටතේ ඇති බීජ පොල් පැළ තවාන්වල පොල් පැළ කොතරම් ප්‍රමාණයක් තිබේද යන්න පිළිබඳව ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එක් තවානක ආසන්න වශයෙන් පොල් පැළ 5000ක් පමණ බැගින්, දිවයින පුරා පවතින පොල් පැළ තවාන් 100ක පොල් පැළ නිෂ්පාදන කර ඇති බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීම මත සී/ස හලාවත වැවිලි සමාගම විසින් ද පොල් පැළ ලක්ෂ 5ක් නිෂ්පාදනය කර ඇති බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පොල් පැළ මිලදී ගැනීම සඳහා රජයෙන් මුදල් වෙන් කර ගැනීමට උත්සාහ කරන අතරතුරදී, ඊට සමාන්තරව, මෙම පොල් පැළ වතු සමාගම් වෙත සහන මිලට හෝ ලබා දීමේ වැඩපිළිවෙලක් පිළිබඳව එම සමාගම් සමඟ සාකච්ඡා කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.1.3 පොල් පැල වර්ග සියල්ලම එකම දිනෙක අලෙවි නොකිරීම

පොල් පැළ වර්ග සියල්ලම එකම දිනෙක අලෙවි නොකර එක් එක් වර්ගය අලෙවි කිරීම සඳහා වෙන වෙනම දින වෙන් කර ඇති බවට වාර්තා වී ඇති බවත්, මේ හේතුවෙන් පාරිභෝගිකයන් අපහසුතාවයට ලක් වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එවන් තත්ත්වයක් මෙතෙක් වාර්තා වී නොමැති බව පොල් පර්යේෂණ ආයතනයේ සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිවරුන් විසින් දැනුම් දුන් අතර ඒ බව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

### 3.1.4 අපනයන භෝගවල තවාන් පැළ නොමැති වීම

අපනයනය සඳහා කුරුඳු, ගම්මිරිස් සහ පුවක් වගා කරන වගාකරුවන් වෙත නව තවාන් පැළ ලබා දීමේ අඩුවක් පවතින බැවින්, මෙම අපනයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පවතින ප්‍රතිපාදන අනුව මෙම වසරේදීත් කුරුඳු පැළ ඇතුළු අනෙකුත් පැළ වර්ග ලබා දී ඇති බවත් ලබන වසරේදීත් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙතෙක් කුරුඳු පැළ රජය මඟින් වගාකරුවන් වෙත නොමිලයේ ලබා දුන් නමුත්, කුරුඳු පැළ සපයන්නන් ඔවුන්ගේ විකුණුම් මිල වැඩි කිරීම හේතුවෙන් ලබන වසරේ සිට එක් පැළයක් සඳහා රු. 07ක මුදලක් ගැණුම්කරුවන්ගෙන් අය කිරීමට තීරණය කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එලෙසම පුවක් සහ බුලත් සඳහා ද විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් පැවතීම හේතුවෙන් එම දෙවර්ගයෙහි පැළ වැඩි වශයෙන් නිෂ්පාදනය කිරීමට ද ලබන වසරේ අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තම ප්‍රදේශයේ පවතින අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගස්නාවවත්ත ගොවිපළේ පවතින පැළ තවාන් ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීම හරහා රජය මඟින් නිෂ්පාදනය කෙරෙන පැල ප්‍රමාණය වැඩි කර ගනිමින් පෞද්ගලික අංශයෙන් මිලදී ගන්නා පැළ ප්‍රමාණය අඩු කර ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳව අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගස්නාවවත්ත පැළ තවාන ද ඇතුළුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් මධ්‍යම පැළ තවාන්වල පැළ ධාරිතාවය වසරෙන් වසර ඉහළ නංවමින් පවතින බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) විසින් දැනුම් දෙන ලදී.

## 3.2 ගරු ජගත් පුෂ්පකුමාර මහතා

### 3.2.1 දත්ත රැස් කිරීමේ ජංගම යෙදවුම (app) ක්‍රියාත්මක නොවීම

පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණායතනය, කුරුණෑගල වැවිලි සමාගම සහ හලාවත වැවිලි සමාගමේ අස්වැන්න සහ සේවක පැමිණීම දෛනිකව, නිවැරදිව ගබඩා කිරීමටත්, එම දත්ත අමාත්‍යාංශය වෙත එසැනින් වාර්තා කිරීමටත් හැකි වන පරිදි හඳුන්වා දුන් ජංගම යෙදවුම (app) මේ වන විට භාවිතා නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ජංගම යෙදවුම මඟින් රැස් කරන තොරතුරු ජාලගත ලෙස අමාත්‍යාංශය වෙත වාර්තා නොකළ ද, එක් එක් ආයතනය විසින් තම ආයතනයට අදාළ දත්ත මෙම ජංගම යෙදවුම භාවිතයෙන් රැස් කරන බව සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි, සී/ස හලාවත වැවිලි සමාගමේ සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති සහ පොල් පර්යේෂණ ආයතනයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

ජාලගත ක්‍රමවේදය ඔස්සේ මෙම දත්ත අමාත්‍යාංශ නිලධාරින් වෙත සහ විෂයභාර අමාත්‍යතුමා වෙත ලැබීමට සැලැස්වීමෙන්, වංචා දූෂණ අවම කර ආයතනවල විනිවිදභාවය පවත්වා ගැනීමට හැකියාව පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පෙර පැවති ක්‍රමවේදය නැවත ක්‍රියාත්මක කරමින්, මෙම ජංගම යෙදවුම හරහා තොරතුරු අමාත්‍යාංශ නිලධාරින් වෙත සහ විෂයභාර අමාත්‍යතුමා වෙත එසැණින් වාර්තා කිරීමේ ජාලගත ක්‍රමවේදය නැවත කඩිනමින් ස්ථාපනය කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

### 3.2.2 කප්රුක අරමුදලේ වත්මන් තත්ත්වය

පොල් සංවර්ධන අධිකාරිය, පොල් පර්යේෂණ ආයතනය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් මුදල් යොදා අරඹන ලද චක්‍රීය අරමුදලක් වූ කප්රුක අරමුදල සහ ඒ ආශ්‍රිතව පිහිට වූ කප්රුක සමිති සම්බන්ධ වත්මන් තත්ත්වය පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම අරමුදල යටතේ පවතින වත්මන් ශේෂය රු. මිලියන 80ක් බවත් එමඟින් කප්රුක සමිතිවල ප්‍රතිලාභීන් සඳහා අදාළ ප්‍රතිලාභ මේ වන විටත් ලබා දෙමින් පවතින බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම අරමුදල පසුගිය කාලයේදී මුදල් අමාත්‍යාංශය යටතේ පාලනය වූ බවත් 2020 වසරේ සිට මෙම අරමුදලේ යම් කඩාවැටීමක් දක්නට ලැබුණු බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට නැවත මෙම අරමුදල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය භාරයට පත් වී ඇති බවත් 2022 වර්ෂය සඳහා රු. මිලියන 36ක මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන මේ සඳහා අනුමත වී ඇති අතර ඉන් මෙතෙක් ලැබී ඇති රු. මිලියන 25ක මුදල් අවශ්‍ය කටයුතු සඳහා භාවිතා කර ඇති බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ග්‍රාමීය මට්ටමින් පැවති ප්‍රාථමික සමිති හරහා ප්‍රජා පැළ තවාන් ඇති කිරීම ඔස්සේ ක්‍රමිකව පොල් පැළ නිෂ්පාදනය වැඩි කිරීම මඟින් 2010දී ඇ. ඩො. මිලියන 46ක් වූ පොල් සංවර්ධන අධිකාරියේ ආදායම මේ වන විට ඇ.ඩො මිලියන 864 දක්වා වර්ධනය කර ගැනීමට හැකි වී ඇති බවත් එම සමිතිවලට මෙම අරමුදල හරහා චක්‍රීයව ණය ලබා දීම සිදු කළ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එම වැඩසටහන ඉතාම ඵලදායී වැඩසටහනක් බවත් ඒ ඔස්සේම යමින්, ප්‍රාදේශීය මට්ටමින් ඇති කරන ලද පොල් පැළ තවාන්වල පැළ 5000 බැගින් නිෂ්පාදනය කරමින් පොල් පැළ නිෂ්පාදනය වැඩි කිරීමට මෙම වර්ෂයේදී ද පියවර ගෙන තිබෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.2.3 සෙවණගල සහ පැල්වත්ත සීනි සමාගම්වලට නව සේවකයින් බඳවා ගැනීම

මෙම සිනි සමාගම් ද්විත්වය සඳහා සේවකයන් 1000ක් බඳවා ගෙන ඇති බවට සමාජ මාධ්‍ය ඔස්සේ පුවතක් සංසරණය වන බවත් පසුගිය කාලයේ මූල්‍යමය වශයෙන් අර්බුදකාරී තත්ත්වයක පැවති මෙම ආයතන වත්මන් තත්ත්වය දක්වා වැඩි දියුණු කරන ලද්දේ මුදල් නාස්තිය අවම කිරීමේ ක්‍රියාවලියන් අනුගමනය කිරීම මඟින් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වන සේවක බඳවා ගැනීම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ සවිස්තර වාර්තාවක් කඩිනමින් ලබා දෙන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.3 කුඩා තේ වතු කර්මාන්තය - ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

කුඩා තේ වතු කර්මාන්තයට අදාළව තාක්ෂණ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා වැඩසටහන් කිහිපයක්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හරහා සිදු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තේ කර්මාන්තයේ ශ්‍රම හිඟය අවම කිරීම, ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ වාර්ෂිකව අස්වැන්න අඩු වීම අවම කිරීම යන අරමුණු පෙරදැරිව මේ වන විට යාන්ත්‍රිකරණය දෙසට නැඹුරු වී ඇති බව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

අක්කරයක ඉඩමකට රු. දසලක්ෂයක ප්‍රතිපාදන ලබා දීම මඟින් සෑම තේ උපදේශක පරීක්ෂක කොට්ඨාසයකම "Double Hedge Raw Sysytem" ක්‍රමයට තේ පැළ සිටුවීම සඳහා ආදර්ශ තේ වගා බිම් ඇති කර ඇති අතර මේ වන විට එම වගාවන් අස්වැන්න නෙලීමේ අවධියට පත්ව ඇති බවත් තේ වගා කරන සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි මෙවැනි ආදර්ශ ස්ථාන 55ක් දිවයින පුරා විසිර පවතින බවත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

වියළි කාලගුණයක් සහිත තේ වගා බිම්වලට ජලය සැපයීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර තේ වගා බිම්වලට දියර පොහොර යෙදීමේදී නාස්තිය සහ මිනිස් ශ්‍රමය අවම කරමින් වගාවේ වර්ධනය ඉහළ නැංවීමට දායක වන බින්දු ජල තාක්ෂණයද (Drip Irrigation) මේ වන විට ප්‍රායෝගිකව භාවිතා වන බවත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

තව ද, තේ වතුවල යාන්ත්‍රික දළු නෙලීම සඳහා දැනට ආදර්ශ තේ වගා බිම්වල පැළ සිටුවා ඇති ආකාරයට පැළ පේළි දෙකක් අතර පරතරය අඩි 5ක් වන ලෙසට පැළ සිටුවිය යුතු හෙයින්, මේ වන විට වගාකරුවන්ව ඒ සඳහා දිරිමත් කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇති බව ද ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

පැරණි තේ වතුවල තේ දළු නෙලීම සඳහා බැටරි බලයෙන් ක්‍රියාත්මක වන කුඩා යන්ත්‍ර සහ එන්ජිම මඟින් ක්‍රියාත්මක වන කුඩා යන්ත්‍ර වෙනුවෙන් සහනාධාර ලබා දීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇති බවත් වැවිලි සමාගම් බොහෝමයක මේ වන විට එම ක්‍රමය ක්‍රියාත්මක වන බවත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.4 ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා

### 3.4.1 තේ වගාකරුවන් සතුව පවතින ඌණ උපයෝජිත ඉඩම් ප්‍රයෝජනයට ගැනීම

මෙරට තේ වගා කරන ඉඩම්වලින් 60%ක පමණක් හිමිකාරිත්වය දරන කුඩා තේ වතු හිමියන් විසින් මෙරට තේ නිෂ්පාදනයෙන් 70%කට දායකත්වය සපයන නමුත්, තේ වගා කරන ඉඩම්වලින් 40%ක පමණ හිමිකාරිත්වය දරණ මහා පරිමාණ තේ නිෂ්පාදන සමාගම් තේ නිෂ්පාදනයෙන් 29%කට පමණක් දායකත්වය සපයන බවත් ප්‍රතිශතාත්මකව සැලකූ විට මෙම තත්ත්වය ගැටලුකාරී බවත් ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම තත්ත්වය සඳහා හේතුවන කරුණු ද සමඟින්, එක් එක් මහා පරිමාණ තේ වගා කිරීමේ සමාගම් සතුව පවතින මුළු ඉඩම් ප්‍රමාණය සහ ඉන් වගා කර ඇති ඉඩම් ප්‍රමාණය ද ඇතුළත් තොරතුරු ලිඛිතව ලබා දෙන ලෙස ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

1992 වර්ෂයේ සිට වතු පෞද්ගලිකරණය කිරීමෙන් පසු මෙම වතු සමාගම් නැවත වගාව සහ අලුත් වගාව සම්පූර්ණයෙන්ම අතහැර, පවතින වගාවෙන් තේ දළු නෙලීම සහ ගස් කපා විකිණීමෙන් පමණක් ලාභ උපයන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම සමාගම් වෙත අවස්ථා ගණනාවකදී දැනුම් දීම් කළ නමුත්, ඌණ උපයෝජිත ඉඩම්වලින් නිසි ප්‍රයෝජන ගැනීමට ඔවුන් කටයුතු නොකරන අතර පොදු කටයුත්තක් සඳහා හෝ මෙම ඉඩම් ලබා ගැනීමේ නෛතික ගැටලුවක් ද පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, කැබිනට් මණ්ඩල අනුමැතිය ද සහිතව ඌණ උපයෝජිත ඉඩම් රජයට පවරා ගැනීමේ පනතට අදාළව නීති කෙටුම්පත් සම්පාදනය මේ වන විට සිදු කෙරෙමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පසුගිය වකවානුවේදී ඌණ උපයෝජිත ඉඩම් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධව තේරීම් කාරක සභාවක් පත් කරන ලද බවත් එමඟින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ මෙම ගැටලුවට අදාළ සියලු තොරතුරු සහ ඊට යෙදිය යුතු පිළියම් ද ඇතුළත්ව පවතින බවත් ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් දැනුම් දෙන ලදී.

එම වාර්තාවේ ඇතුලත් කරුණු ද මේ සම්බන්ධ තීරණ ගැනීමේදී සලකා බලන ලෙසට ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා නෛතිකමය ගැටලුවක් පවතින බැවින් ඉහත සඳහන් කළ පනත් කෙටුම්පත සකස් කළ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම නීති කෙටුම්පත් කඩිනමින් සම්පාදනය කර, පවරා ගන්නා ඌණ උපයෝජිත ඉඩම් කුඩා පරිමාණ තේ වගාකරුවන් වෙත වගා කටයුතු සඳහා ලබා දී තේ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට කටයුතු සලසන ලෙසට ගරු විපක්ෂ නායකතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

මෙම වතු සමාගම් පෞද්ගලිකරණය කරන අවස්ථාව වන විට සේවක සංඛ්‍යාව 450,000ක් පමණ වූ බවත් මේ වන විට එම ප්‍රමාණය 150,000ක් පමණ දක්වා අඩු වී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එම සේවක පිරිසට ද නිසි සැලකීමක් නොකෙරෙන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

වගා නොකරන මුඩු ඉඩම් වගා කිරීම සඳහා මෙම මහා පරිමාණ සමාගම් වෙතට ඉලක්ක ලබා දිය යුතු බව ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම වතු සමාගම් විසින් තම සේවක පිරිස පිළිබඳව කිසිදු සැලකීමක් නොදක්වනවා මෙන්ම රජය සමඟ ගනුදෙනු කිරීමේදී ද නොසැලකිලිමත්භාවයක් දක්වන බව ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

ඔවුන් විසින් අධික ලාභ ඉපැයීම පමණක් අරමුණු කර ගෙන ඇති බවත් හැකි ඉක්මණින් මෙම සමාගම් සමඟ සංවාදයක් ගොඩනැගිය යුතු බවත් ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මීළඟ උපදේශක කාරක සභා රැස්වීමට මහා පරිමාණ තේ වතු සමාගම්වල ප්‍රධානීන් ද කැඳවන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

තේ, පොල්, රබර් ආදී සියලු වගාවන්ට අයත් ඌණ උපයෝජිත ඉඩම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙස මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ද දැනුම් දෙන ලදී.

### 3.4.2 තේ කර්මාන්තය සඳහා අවශ්‍ය වන යෙදවුම්වල පවතින හිඟතාව

තේ වගාව නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වීමට නම් යම් ප්‍රමාණයකට හෝ නැවත වගාව ක්‍රියාත්මක විය යුතු වුව ද, මේ වන විට නැවත වගාව සඳහා අවශ්‍ය වන ටී 65 පොහොර, එප්සම් සෝල්ට් (Epsum Salt), සින්ක් සල්ෆේට් ($ZnSO_4$), මෙටම් සෝඩියම් සහ අවශ්‍ය පලිබෝධනාශකවල හිඟයක් පවතින බව ගරු විපක්ෂ නායකතුමා විසින් දැනුම් දෙන ලදී.

එම යෙදවුම් හිඟයකින් තොරව දැරිය හැකි මිලකට වෙළෙඳපොළෙහි ලබා ගැනීමට පවතින හැකියාව සහ නැවත වගාව සඳහා එම යෙදවුම්වල වාර්ෂිකව අවශ්‍යතාව පිළිබඳව ද ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය විසින් නැවත වගාව 03%ක ප්‍රතිශතයකින් සිදු කිරීමට නිර්දේශ කර තිබුණ ද, මේ වන විට ලංකාවේ එය සිදු වනුයේ 1% - 1.5%ක් ප්‍රමාණයකින් පමණක් බවත් රසායනික පොහොර ආනයනය තහනම් කිරීමත් සමඟ පසුගිය කාලයේ මෙම පොහොර හිඟයක් පැන නැඟි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම පොහොර වර්ග සියල්ලම අදාළ සමාගම් සතුව අලෙවිය සඳහා පවතින බවත් 50kg මිටියක මිල රු.20,500ක් පමණ වන බවත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (කෘෂිකර්ම) විසින් දැනුම් දෙන ලදී.

මෙම පොහොර වර්ගවල පෙර සහ වර්තමාන මිල ගණන් ද ඇතුළුව විමසන ලද අනෙකුත් තොරතුරු ලිඛිතව ලබා දෙන ලෙස ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තේ කර්මාන්තය සඳහා අවශ්‍ය වන U 709, T 200 පොහොරවල මිල ගණන් පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

U 709 පොහොර 50kg ප්‍රමාණයක මිල රු.18,500 - 20,500ත් අතර සහ T 200 පොහොර 50kg ප්‍රමාණයක මිල රු.20,000 අවට පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මාස දෙකකට පමණ පෙර T 200 පොහොර 50kg ප්‍රමාණයක මිල රු.30,000 සීමාවේ පැවතිය ද පොහොර ආනයනය කිරීමේ කටයුතු සඳහා පොහොර සමාගම්වලට අමතරව පෞද්ගලික ආනයනකරුවන් ද මැදිහත් වී ඇති බැවින් මේ වන විට එම මිල ගණන් ක්‍රමිකව අඩු වී ඇති බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පෙර පැවති ඉහළ සහනාධාර මිලට නොවූව ද, මෙම පොහොර වර්ග දැරිය හැකි සාධාරණ මිලකට ලබා දීම සඳහා මෙම ආර්ථික අර්බුධකාරී තත්ත්වයේදී හැකි පමණ කටයුතු කරන මෙන් ගරු විපක්ෂනායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ සල්ෆේට් ඔෆ් ඇමෝනියා පොහොර වර්ගය ඉදිරි දෙසතිය තුළ අඩු මුදලකට ගෙන්වා රු.10,000 - 12,000 අතර සහනාධාර මුදලකට ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට අමතරව, පසුගිය මාස 03ක කාලයේදී තේ ප්‍රවර්ධන අරමුදලට අයත් රු. බිලියන 2ක මුදලක් මාස 03ක් ඇතුලත ආපසු ගෙවීමේ පදනම මත පොහොර මිලදී ගැනීම සඳහා තේ කර්මාන්තශාලා වෙත ලබා දී ඇති බවත් ක්‍රමිකව වෙළෙඳපොළේ පොහොර මිල අඩු නොවුණහොත් ලබන වසරේදී යම් සහනයක් ලබා දීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.4.3 වල්නාශක ප්‍රමිතිගතකරණයකට ලක් කිරීම

ග්ලයිෆොසේට් තහනමත් සමඟ විවිධ වර්ගයේ විකල්ප වල්නාශක වෙළෙඳපොළෙහි දක්නට ලැබුණ ද ඒවා නිසි ප්‍රමිතියෙන් තොර බවට චෝදනාවක් පවතින බැවින් මෙම වල්නාශක ප්‍රමිතිගතකරණයකට ලක් කිරීමට ගෙන ඇති වැඩ පිළිවෙල සම්බන්ධව ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විට ග්ලයිෆොසේට් තහනම ඉවත් කර ඇති අතර ඉදිරි මාසය තුළදී එම වල්නාශකය වෙළෙඳපොළට පැමිණෙන බවත් මෙම කටයුතු නියාමනය සම්බන්ධ වගකීම කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 3.4.4 වගා කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීම

නව තාක්ෂණය වගා කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධ මාර්ග සිතියම (Road Map) ලිඛිතව ලබා දෙන ලෙස ලෙසට ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.4.5 තේ කර්මාන්තය ආශ්‍රිත ප්‍රවර්ධන කටයුතුවල ප්‍රගතිය

ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන අරමුදල (Sri Lankan Tea CESS fund) මඟින් තේ කර්මාන්තයේ දියුණුව සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සෑහීමකට පත් විය හැකිදැයි ගරු විපක්ෂ නායකතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙමඟින් සිදු කරන ලද ප්‍රවර්ධනමය කටයුතු පිළිබඳ පෞද්ගලිකව තමන් සෑහීමකට පත් නොවන බවත් වත්මන් ආණ්ඩුව බලයට පත්වන අවස්ථාවේ තේ ප්‍රවර්ධන අරමුදල සතුව රු. බිලියන 08ක මුදලක් පැවති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට තේ කර්මාන්තයේ සමස්ත දියුණුව සඳහා, මෙම අරමුදලින් 50%ක් තේ ප්‍රවර්ධන කටයුතු සඳහාත් ඉතිරි 50% තේ වගා කටයුතු සඳහාත් යොදා ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එම මුදල්වලින් රෝපණ ද්‍රව්‍ය (planting materials) නිෂ්පාදනය කරන පැල තවාන් දහසක් ඇති කර ඇති බව ද ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ලිඛිත වාර්තාවක් ලබා දෙන ලෙසට ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.4.6 පොල් කර්මාන්තයේ කේන්ද්‍රීය අපනයන අංශය ප්‍රවර්ධනය කිරිම

පොල් කර්මාන්තයේ කේන්ද්‍රීය අපනයන නිෂ්පාදන මෙරට ඩොලර් සංචිතය ඉහළ නංවා ගැනීම සඳහා ඉහළ විභවතාවක් දක්වන අංශයක් බැවින් එම අංශය ප්‍රවර්ධනය කිරිම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධව ලිඛිත වාර්තාවක් ලබා දෙන ලෙසට ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.4.7 වැසි ගිය තේ කර්මාන්තශාලා ප්‍රමාණය පිළිබඳ දත්ත ලබා ගැනීම

මෑත කාලයේදී මෙරට දිස්ත්‍රික් මට්ටමින් වැසි ගිය තේ කර්මාන්තශාලා ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙසට ගරු විපක්ෂ නායකතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.5 විශ්‍රාම ගිය වතු සමාගම් සේවකයින් වතු නිවාසවලින් ඉවත් කිරීම - ගරු රවුෆ් හකීම් මහතා

ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අයත් පාතදුම්බර ගල්පීල්ලවත්ත වතුයායේ සේවය කර විශ්‍රාම ගිය වතු සමාගම් සේවකයින් ඔවුන් පදිංචි වතු නිවාසවලින් ඉවත් කිරීමට කටයුතු කෙරෙමින් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම කටයුතු නැවැත්වීමට උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.6 ගවරවිල වතුයායේ ජනතාව වගා කර ඇති ඉඩම්වලින් ඔවුන්ව බලහත්කාරයෙන් ඉවත් කිරීම - ගරු වී. රාධක්‍රිෂ්ණන් මහතා**

හොරණ වැවිලි සමාගමට අයත් ගවරවිල වතුයායේ ජනතාව වගා කර ඇති ඉඩම්වලින් ඔවුන්ව බලහත්කාරයෙන් ඉවත් කිරීමට එම සමාගම් කටයුතු කරමින් පවතින බවත් එම ක්‍රියාවලිය නතර කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම කටයුත්ත නතර කිරීමට පියවර ගන්නා බවත් එසේ දීර්ඝ කාලයක සිට පදිංචිව සිටින ජනතාව එම ස්ථානවලින් ඉවත් නොකරන ලෙසට වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයට උපදෙස් ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වැවිලි සමාගම්වලින් ලැබෙන පැමිණිලි අනුව වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයට මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සම්බන්ධව රාජකාරිමය වශයෙන් නෛතික පියවර ගැනීමට ගැනීමට සිදු වුව ද, මානුෂීයව සලකා බලා හැකි පමණ එසේ ඉවත් කිරීමේ කටයුතු මේ වන විට නවතා දමා ඇති බව ද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බොගවන්තලාව වැවිලි සමාගමට අයත් කොටියාගල වත්තේ අවුරුදු 50කට වැඩි කාලයක සිට පදිංචිව සිටින පවුල් 35ක ජනතාව නඩු පැවරීම මඟින් එම ස්ථානයෙන් ඉවත් කර ඇති හෙයින්, ඔවුන් ගැටලුමය තත්ත්වයකට මුහුණ දී ඇති බව ගරු එම්. රාමේශ්වරන් මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම කටයුතු හැකි පමණ නැවැත්වීමට උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

රජයට අයත් ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත බදු දී ඇති අතර එසේ බදු දී ඇති ඉඩම්වල කවුරුන් හෝ බලහත්කාරයෙන් පදිංචි වී සිටින අවස්ථාවේදී ඊට එරෙහිව නීතිමය පියවර ගැනීම සිදු කරන බව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය) විසින් දැනුම් දෙන ලදී.

එසේ නෛතික පියවර ගැනීමට පෙර එම අනවසර පදිංචිකරුවන් වෙත "දෙසති දැන්වීම" නම් දැනුම් දීමක් සිදු කරන බවත් ඉඩම සම්බන්ධව එම පදිංචිකරුවන් හට කුමන හෝ අයිතිවාසිකමක් ඉදිරිපත් කළ හැකි නම් ඒ සඳහා ද අවස්ථාව සලසා ඇති බවත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එසේ අයිතිවාසිකම් ඉදිරිපත් කරන ඉඩම් බොහෝමයක් නීතිමය පියවර නොගෙනම නිදහස් කරන බව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

## 3.7 ගරු ජානක වක්කුඹුර මහතා

### 3.7.1 වගාවන් සඳහා පොහොර බෙදා දීම

පොහොර සඳහා මෙවර අයවැයෙන් ද රු. මිලියන 56,000ක් වෙන් කර ඇති අතර පෙරදී මෙන් වී ගොවිතැනට පමණක් ප්‍රමුඛතාව ලබා නොදී සියලු වගාවන්ට එක හා සමාන සාධාරණ මිලකට පොහොර බෙදා හැරීමට කටයුතු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය කාලයේ පැවති කාලීන අවශ්‍යතාව මත වී අස්වැන්න හිඟවීම හේතුවෙන් පොහොර ලබා දීමේ ක්‍රියාවලියේදී වී ගොවිතැනට ප්‍රමුඛතාව දුන් බවත් ලබන වසරේ සිට සියලු වගාවන්ට ප්‍රමුඛතාව ලබා දීම පිළිබඳ අවධානය යොමු වී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.7.2 හිඟුරාන සීනි කර්මාන්ත ශාලාවේ වත්මන් මූල්‍යමය ප්‍රගතිය විමසීම

හිඟුරාන සීනි කර්මාන්ත ශාලාව වෙනුවෙන් පසුගිය කාලයේ රු. බිලියන 11ක ණය ගෙවීමට තිබූ බවත් මෙතෙක් ගෙන එන ලද වැඩපිළිවෙල හේතුවෙන් එම ණය ප්‍රමාණය බොහෝ සෙයින් අඩුව ඇති අතර ලැබෙන මුදල්වලින් ඉතිරිව ඇති ණය ප්‍රමාණය ද කඩිනමින් පියවීමට කටයුතු කළ යුතු බවත් ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් දැනුම් දුන් අතර තවත් ඉතිරිව ඇති ණය ප්‍රමාණය පිළිබඳව විමසීමක් කරන ලදී.

තවත් ගෙවීමට ඇති ණය ප්‍රමාණය රු. මිලියන 4720ක් බව ගල්ඔය වැවිලි (පුද්.) සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ගරු රමේෂ් පතිරණ සහ ගරු ජානක වක්කුඹුර යන මහත්වරුන් පිළිවෙළින් වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ රාජ්‍ය අමාත්‍ය ධුරයන්හි කටයුතු කළ කාලවකවානුවේදී එතනෝල් සහ කළු සීනි ආනයනය නැවැත්වීම හේතුවෙන් වසර 15ක් පුරාවට පාඩු ලබමින් වැසී යන තත්ත්වයට පත්ව තිබූ මෙම ආයතනය මේ වන විට ලාභ ලබමින් පවතින බව ද ගල්ඔය වැවිලි (පුද්.) සමාගමේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තමන් මෙම ආයතනයේ සභාපති ධුරයට පත් වන විට 28%ක පොලී ප්‍රතිශතයකට තමන්ගේම ආයතනවලින් ලබා ගත් රු. බිලියන 9.5ක ණය ශේෂයක් පැවතී බවත් එම ණය පොලී ප්‍රතිශතය මේ වන විට 14% දක්වා අඩු කර ගැනීමට කටයුතු කර ඇති බවත් ගල්ඔය වැවිලි (පුද්.) සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මෙම ආයතනය පසුගිය මාස 07 තුළ රු. මිලියන 9681ක ආදායමක් ලබා ඇති අතර ඉන් ශුද්ධ ලාභය රු. මිලියන 4780ක් බව ද ගල්ඔය වැවිලි (පුද්.) සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

2023.03.31 වන විට දැනට ඉතිරිව පවතින සියලු ණය ගෙවා අවසන් කර රු. මිලියන 370කට වැඩි ලාභාංශයක් මහා භාණ්ඩාගාරය වෙත සම්ප්‍රේෂණය කිරීමට හැකි වෙතැයි තමන් බලාපොරොත්තු වන බව ද ගල්ඔය වැවිලි (පුද්.) සමාගමේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.8 ගරු වීරසුමන වීරසිංහ මහතා

### 3.8.1 නිසි ප්‍රමිතියෙන් යුත් පොහොර බෙදා දීම

තේ වගාවන්ට පොහොර ලබා දීමේදී අවශ්‍ය සියලු සංඝටක නිසි පරිදි මිශ්‍ර නොකර, කොම්පෝස්ට් සමඟ යූරියා පමණක් මිශ්‍ර කර බෙදා හරින බවත් එමඟින් තේ වගාවට විශාල හානියක් සිදුවන බැවින් එම ක්‍රියාවලිය නවතන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සහනාධාර ලෙස ලැබෙන යූරියා පොහොර අනෙකුත් අවශ්‍ය පොහොර මිශ්‍රණ සෑදීමට යොදා ගෙන අවශ්‍ය සියලු සංඝටක සහිත පොහොර මිශ්‍රණ බෙදා හැරීමට කටයුතු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් යෝජනා කරන ලදී.

මේ වන විට සියලු පොහොර සමාගම් එලෙස අවශ්‍ය මිශ්‍රණ නිෂ්පාදනය කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.8.2 මූලටියන ප්‍රදේශයේ කුරුඳු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම

කුරුඳු අපනයන සංවර්ධන මණ්ඩලයේ මැදිහත්වීමෙන් මාතර දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රදේශයේ කුරුඳු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම ආරම්භ කළ නමුත් මේ වන විට එහි වැඩකටයුතු නැවතී ඇති බැවින් එම කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.8.3 කළුබෝවිටියාන තේ සමාගමේ අතිරික්ත තේ නිෂ්පාදිතය පිළිබඳ විමසීම

කළුබෝවිටියාන තේ සමාගම විසින් පසුගිය කාලයේදී අතිරික්ත තේ නිෂ්පාදිතයක් සිදු කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දුන් අතර ඒ සම්බන්ධ වත්මන් තත්ත්වය පිළිබඳ විමසීමක් කරන ලදී.

පසුගිය මාස කිහිපයේම තේ වෙන්දේසිවලදී මෙම අතිරික්ත නිෂ්පාදිත ප්‍රමාණයෙන් කි. ග්‍රෑ. 29,000 බැගින් නිකුත් කළ බවත් තවත් කි.ග්‍රෑ. 52,000ක් ඉතිරිව ඇති බවත් සී/ස කලුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට පරණ තොග විකුණා අවසන් කර ඇති බවත් තත්ත්වය කළමනාකරණය කර ගෙන ඇති බවත් සී/ස කලුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තේ දළු කිලෝවක මිල සැලකිය යුතු ලෙස ඉහළ ගිය පසුගිය කාලවකවානුවේදී තේ වතු හිමියන් වැඩි වැඩියෙන් තේ දළු කළුබෝවිටියාන තේ සමාගම වෙත ලබා දී ඇති අතර සමාගම ද නිසි කළමනාකරණයකින් සහ නිසි පාලනයකින් තොරව මෙම තේ දළු මිලදී ගැනීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බවත් එම තත්ත්වය දුර්වල පරිපාලනයේ ප්‍රතිඵලයක් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට තේ දළු කිලෝවක (CTC Tea) මිල රු. 257ක් වන බව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

පසුගිය කාලයේ තේ දළු සඳහා පැවති ඉහළ මිල ව්‍යතිරේකයක් බවත් මේ වන විට එම මිල සාමාන්‍ය අගයක් දක්වා අඩු වී ඇති බවත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

නමුත් ඕතඩොක්ස් තේ (Orthodox Tea) දළු කිලෝවක මිල රු. 275 - 300ත් අතර මුදලක් ගන්නා බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තේ දළු සඳහා ශ්‍රී ලංකාව තුළ ඉහළම මිලක් ගෙවනුයේ මාතර දිස්ත්‍රික්කයේ බවත් එක් එක් තේ කර්මාන්තශාලාවේ ශුද්ධ විකුණුම් සාමාන්‍ය (Net Sale Average) මත මෙම මිල වෙනස්වීම් තීරණය වී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.8.4 දෙනියාය ප්‍රදේශයේ තේ කෞතුකාගාරයක් ඇති කිරීම

සංචාරක කලාපයක් වන දෙනියාය ප්‍රදේශයේ තේ කෞතුකාගාරයක් ඇති කිරීම සම්බන්ධ යෝජනාවේ වත්මන් ප්‍රගතිය පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එම කෞතුකාගාරය වෙනුවෙන් 2023 වර්ෂය සඳහා රු. මිලියන 20ක මුදලක් වෙන් කිරීමට මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලා සිටිය ද එම අනුමැතිය ලැබී නොමැති බව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම සම්පාදන) විසින් දැනුම් දෙන ලදී.

මෙය තේ ප්‍රවර්ධනය හා සම්බන්ධ බැවින් ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධන අරමුදලේ (Sri Lankan Tea CESS fund) සහ තේ කර්මාන්තය ආශ්‍රිත අනුග්‍රාහකයින්ගේ සහයෙන් මෙම කෞතුකාගාරය ඉදිකළ හැකි බවට ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා එවැනි මුදලක් වැය නොවන බවත් ප්‍රදේශයේ සමුපකාර සමිතිය විසින් මේ සඳහා ලබා දුන් ඉඩම සහ ගොඩනැගිලි පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම කාර්යය ඉටු කිරීම සඳහා පවතින හැකියාව පරීක්ෂා කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරින් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 3.9 වැවිලි සමාගම්වල පොල් ගස් වෙන්දේසිය - ගරු සමන්ප්‍රිය හේරත් මහතා

වැවිලි සමාගම්වල පොල් ගස් වෙන්දේසිය සම්බන්ධව මාෆියාවක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා එම වතු සමාගම්වල පාලනාධිකාරිය වගකිව යුතු බව දැනුම් දුන් ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව දැඩි අවධානයක් යොමු කරන ලෙසට ඉල්ලීමක් කරන ලදී.

අක්කරයකට අඩු ඉඩම් පමණක් වෙන්දේසි කරන ලෙසට සීමා පැනවීමට ගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇති බවත් පසුගිය තෙවසරක කාලය තුළදී

අත්‍යාවශ්‍ය මානුෂීය කාරණා මත පමණක් පොල් හෙක්ටයාර 05කට අඩු ඉඩම් පමණක් බෙදා වෙන් කිරීම සඳහා අවසරය ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, පොල් ශාකය, ගස් හෙලීමේ පනතට ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති බැවින් පොල් ගස් 02ට වඩා ප්‍රමාණයක් කපා දැමීමේදී අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගේ අවසරය ලබා ගත යුතු බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගස් වෙන්දේසි කිරීම සම්බන්ධව වැවිලි සමාගම්වල පාලනාධිකාරිය විසින් දක්වන ඒකාධිකාරිය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අවුරුදු 65ට වැඩි පොල් ගස් විවෘත ටෙන්ඩර් පටිපාටියක් මඟින් රු. 7,000 - 15,000 අතර මුදලකට වෙන්දේසි කරන බවත් ගස් කැපීමට පෙර වන වගා කළමනාකරණ සැලසුමක් (Forestry Management Plan) සහ යටි වගාව ද ක්‍රියාත්මක වන බවත් සී /ස හලාවත වැවිලි සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

කුරුණෑගල වැවිලි සමාගම ඇතුළු වැවිලි සමාගම් සෑම වෙන්දේසියකදීම මෙම ටෙන්ඩරය එකම පුද්ගලයෙකුට ලබා දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳ පරීක්ෂා කර අදාළ නිලධාරීන්ට විරුද්ධව අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.10 ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

### 3.10.1 ඇත්ගාල ප්‍රදේශයේ පවතින කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කාර්යාලය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම

මහනුවර දිස්ත්‍රික්කයේ ඇත්ගාල ප්‍රදේශයේ පවත්වා ගෙන ගිය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කාර්යාලය, මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ට තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා මහනුවර කාර්යාලයට යාමට සිදු වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම කාර්යාලය සතියක් ඇතුලත යථාවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 3.10.2 වතුවල වල්පැළ ගහණය බහුල වීමේ ගැටලුව

මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුවල වල්පැළ ගහණය බහුල වීම හේතුවෙන් එම වතුවල සේවකයින් රැකියා සඳහා පැමිණීමට බියක් සහ මැලිකමක් දක්වන බැවින් එම වල්පැළ මර්ධනය සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය කාලයේදී වල්නාශකවල හිඟයක් පැවති බැවින් මෙම ගැටලුව මතු වී ඇති බවත් ඉදිරි කාලයේදී වල්නාශක වෙළෙඳපොළට පැමිණීමත් සමඟ මෙම ගැටලුව විසඳිය හැකි බවත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 3.10.3 පෞද්ගලික වතු සමාගම්වල අනිසි ක්‍රියාවන් සම්බන්ධව දැනුම් දීම

පෞද්ගලික වැවිලි සමාගම් රජයේ ඉඩම් නිසි පරිදි පවත්වා ගැනීම සහ නිසි කළමනාකරණයක් සිදු නොකරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නැවත තේ සිටුවීම පැහැර හැරීම, කළමනාකරණ ගාස්තු වශයෙන් අධික මුදල් ලබා ගැනීම, කුඩා ප්‍රමාණයේ ජල විදුලි බලාගාර නඩත්තුව, සංචාරක ව්‍යාපාර, ගස් කැපීම යන අනවශ්‍ය විෂයයන්ට යොමුව ඇති බවත් අධික ලාභ ලැබුව ද සේවක සුභසාධනයට යෙදිය යුතු කුඩා ප්‍රතිපාදනයන් ද පැහැර හරින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම වතු පවරා ගැනීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය පියවර මේ වන විට ගනිමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.11 අම්පාර උක් වතු භූමි - ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

අම්පාර උක් වතු භූමිවල කිසිදු වගා සැලැස්මක් දක්නට නොමැති බවත් වල්පැළවලින් එම භූමි ගහණ වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අනෙක් වගාවන් මෙන්ම මෙම වගා භූමිවලද යටි වගාවන්, සත්ත්ව නිෂ්පාදනය, භෝග විවිධාංගිකරණය ඇතුළු ඵලදායී ක්‍රම උපයෝගී කර ගනිමින්, ඒවා උපරිම ආදායම් ලැබෙන ලෙස අලංකාරව පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම උක් වතුවලින් අදාළ ආයතන අධික ලාභ ලැබුව ද උක් ගොවියන්ට එම ප්‍රතිලාභ නොලැබෙන බවත් ඔවුන් අධික ණය බරින් මිරිකී සිටින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දුන් අතර මෙම නව සැලසුම්වල ප්‍රතිලාභ ඔවුන්ට ලැබීමට සලස්වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උක් පර්යේෂණ ආයතනය සමඟ සාකච්ඡා කර උක් වගාව සමඟ මිශ්‍ර කළ හැකි පොල් වැනි වෙනත් භෝග වගාවන් පිළිබඳ අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලද අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ නිලධාරීන්ට ද මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

ලැබෙන ලාභවලින් ගොවීන් සඳහා ගම් කුකුළන්, කිරි හරක් ආදිය නොමිලයේ ලබා දීම හරහා ඔවුනගේ ජීවන මට්ටම ද උසස් කරමින් පෝෂණ අවශ්‍යතාද සපුරා ගත හැකි බැවින්, එවැනි ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

සෙවණගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලා මඟින් උක් ගොවීන්ට ගෙවන මුදලම, හිඟුරාන සීනි කර්මාන්තශාලාවට අදාළ ගොවීන්ට ද ගෙවිය යුතු බවට ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම කරුණ ලිඛිතව අදාළ සමාගමට දන්වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පැල්වත්ත සහ සෙවණගල සීනි කර්මාන්තශාලාවල සියලු දෙනාට රු. 8500ක දුෂ්කර දීමනාවක් පසුගිය සතියේ ලබා දුන් බවත් එම ක්‍රමය අනෙක් සීනි සමාගම්වල ද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු ලොහාන් රත්වත්තේ මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.12 පැල්වත්ත සහ සෙවණගල සීනි සමාගම්වල සිදු වන වංචා දූෂණ - ගරු ගයාශාන් නවනන්ද මහතා

පැල්වත්ත සහ සෙවණගල සීනි සමාගම්වල සිදුවන වංචා දූෂණ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සීමාසහිත ලංකා සීනි සමාගමට අයත් උක් ටොන් 3000ක් ඇඹරිය හැකි පැල්වත්ත බුත්තල කර්මාන්තශාලාවේ ටොන් 700ක් පමණක් අඹරන තත්ත්වයක් තුළ වංචනික ලෙස සෙවණගල උක් අස්වැන්න හිඟුරාන වෙත යැවීම, පැල්වත්ත සීනි කර්මාන්තශාලාව සඳහා අනිසි ලෙස සේවකයින් 1000ක් බඳවා ගැනීම, සෙවණගල ආයතනයේ විගණන අංශය සහ ප්‍රසම්පාදන අංශය සඳහා හිතවත් නිලධාරින් පත් කර පෙර වංචාවලට අදාළ ලේඛන වෙනස් කිරීම, රාජ්‍ය ආයතන තුළින් ලබා ගත යුතු රු. බිලියනයක පමණ පොහොර ටෙන්ඩරය වංචනික ලෙස සිව් වතාවකට වඩා කැඳවා තිබීම, නිලධාරීන් විසින් ආයතනයට අදාළ භෞතික සම්පත් අවභාවිතා කිරීම, වංචා සහගතව උසස්වීම් ලබා දීම, රැකියා ලබා දෙන මුවාවෙන් අල්ලස් ලබා ගැනීම, රාජ්‍ය මුදල් අවභාවිතය, වංචනික ප්‍රසම්පාදන ක්‍රියාවලීන් තුළින් සිදු කරන මිලදී ගැනීම් ආදී වංචා දූෂණ රැසක් සෙවණගල සහ පැල්වත්ත සිනි සමාගම් ආශ්‍රිතව සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

සෙවණගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවල අතිරේක උක් අස්වැන්න ඇඹරීම සඳහා වැලිඔය කර්මාන්තශාලාව ඇති කිරීමට තමන් යෝජනාවක් ගෙන එන ලද්දේ ද මෙම අතිරේක අස්වැන්න ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ප්‍රධාන විධායක නිලධාරි, විගණන විමර්ශන නිලධාරි සහ ප්‍රසම්පාදන නිලධාරි ඇතුළු නිලධාරි මඬුල්ල මෙම වංචාවන් සඳහා වගකිවයුතු බවත් මේ සඳහා සාධාරණ පරික්ෂණයක් කඩිනමින් සිදු කළ යුතු නමුත්, මෙම නිලධාරින් සේවයේ සිටියදී එසේ කිරීම ඵලදායි නොවිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රදේශ ආශ්‍රිත ගොවි බලමණ්ඩල සියල්ලම පාහේ මෙම ආයතනවල ක්‍රියාකලාපය ගැන දැඩි අප්‍රසාදයක් පළ කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, මාස 8කට පමණ පෙර සීනිවලින් කොමිස් ගැනීමේ වංචාවක් ද ක්‍රියාත්මක වූ අතර එවකට සිටි රාජ්‍ය අමාත්‍ය, ගරු ජානක වක්කුඹුර මහතා විසින් එම ක්‍රියාවලිය නැවැත්වීමට අදාළ ක්‍රියාමාර්ග ගත් බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම වංචාවලට අදාළව ලිඛිත සාක්ෂි කිහිපයක් තමන් මෙම උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන බවත් සිදුව ඇති වංචා ප්‍රමාණය මෙලෙස ඉදිරිපත් කරන සාක්ෂිවලට වඩා බොහෝ වැඩි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

හැකි ඉක්මණින් මෙම කරුණු සම්බන්ධව සාධාරණ පරීක්ෂණයක් සිදු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2022 වර්ෂය සඳහා මෙම අපේක්ෂිත නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6000ක් වුව ද, කුමන හෝ හේතුන් මත මෙම වර්ෂය තුළ එම ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කඩිනමින් සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු ජානක වක්කුඹුර මහතා ද මේ සම්බන්ධව අදහස් දක්වන ලදී.

## 3.13 පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය - ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

පොල් ආශ්‍රිත නිෂ්පාදනවලට පවතින අධික විදේශීය ඉල්ලුම හේතුවෙන් එමඟින් ඩොලර් බිලියනයකට අධික විදේශ විනිමයක් ඉපැයිය හැකි බැවින් කුරුණෑගල සහ හලාවත වැවිලි සමාගම් ද්විත්වයේ පොල් අස්වැන්න ඒ ලෙසටම වෙන්දේසි නොකර අගය එකතු කිරීමක් (Value Addition) සිදුකර එම නිෂ්පාදනවලින් විදේශ විනිමය ඉපැයීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහිදී, පොල්, පොල්කටු හා පොල් කොහු ආශ්‍රිත කර්මාන්ත යන අංශ ත්‍රිත්වයටම ප්‍රමුඛතාව ලබා දෙමින් සමාගම්වල අනන්‍යතාව ද රැකෙන පරිදි මෙම නිෂ්පාදන සිදු කළයුතු බවට ගරු මන්ත්‍රීතුමා වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

හලාවත වැවිලි සමාගම විසින් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයක් (Public - Private Partnership) යටතේ පොල් ආශ්‍රිත අපනයන නිෂ්පාදන නිපදවන ඒකාබද්ධ කර්මාන්තශාලාවක් ඇති කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කළ නමුත් මෙතෙක් එය ලැබී නොමැති බවත් නැවතත් කැබිනට් පත්‍රිකාවක් මඟින් මේ සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ සූදානමක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එසේ කිරීම අනවශ්‍ය බවත් මෙම කටයුත්ත කඩිනම් කිරීමෙන් මෙම සමාගම් ද්විත්වය ශ්‍රී ලංකාවට ඩොලර් උපයා දෙන සමාගම් බවට කඩිනමින් පත් කළ හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. මේ සඳහා කඩිනම් පියවර ගන්නා ලෙසට වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

අභිලාෂයන් (Expressions of Interest / EOI) කැඳවා මේ වන විට මෙම රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය (Public - Private Partnership) සඳහා පුද්ගලික අංශය තෝරා ගෙන ඇති බව සී/ස හලාවත වැවිලි සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ආරම්භ කිරීමට නියමිත මෙම කර්මාන්තශාලාවේ කොටස්වලින් 65%ක හිමිකාරීත්වය හලාවත වැවිලි සමාගමටත්, 35%ක හිමිකාරීත්වය පෞද්ගලික අංශයටත් ලැබෙන පරිදි සැලසුම් කර ඇති බව සී/ස හලාවත වැවිලි සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම ලැබෙන ලාභයෙන් 60%ක් හලාවත වැවිලි සමාගමටත්, 40%ක් පෞද්ගලික අංශයටත් බෙදී යාමට නියමිත බව ද සී/ස හලාවත වැවිලි සමාගමේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සඳහා වූ කැබිනට් පත්‍රිකාවට මෙතෙක් අනුමැතිය ලබා දී නොමැති බැවින් නැවතත් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව සී/ස හලාවත වැවිලි සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පුද්ගලික අංශයේ දායකත්වයක් නොමැතිව හලාවත වැවිලි සමාගමේ සම්පූර්ණ මූල්‍යමය ආයෝජනයෙන් මෙම කර්මාන්තශාලාව ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

එසේ සිදු කිරීමට වඩා මෙම රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය (Public - Private Partnership) මඟින් වඩා වාසිසහගත මූල්‍යමය ප්‍රතිලාභ තම සමාගමට අත් වන බව සී/ස හලාවත වැවිලි සමාගමේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

අභිලාෂයන් (Expressions of Interest) කැඳවා මෙම ක්‍රියාවලිය කුරුණෑගල වැවිලි සමාගමේද ක්‍රියාත්මක කිරීමට යාමේදී විවිධ බාධකවලට මුහුණ දීමට සිදු වූ බැවින්, මේ වන විට සියයට සියයක්ම කුරුණෑගල වැවිලි සමාගමේ ආයෝජනයෙන් පොල් ආශ්‍රිත අපනයන නිෂ්පාදන සඳහා කර්මාන්තශාලාවක් ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින බවත් එළඹෙන වසරේ ජනවාරි, පෙබරවාරි මාස වන විට නිෂ්පාදන ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බවත් සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි විසින් දැනුම් දෙන ලදී.

## 3.14 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

### 3.14.1 පොල් ගස් කපා දැමීම අවම කිරීම

ගැසට් නිවේදනයට අනුව මෙය නීතියක් බවට පත් කර ඇති බවත් ඒ අනුව පොල් ගස් 02කට වඩා ප්‍රමාණයක් කපා දැමීමේදී අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගේ අවසරය ලබා ගත යුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.14.2 කුඩා ඉඩම් සඳහා වඩා යෝග්‍ය පොල් පැල ජනතාව වෙත ලබා දීම

වර්තමානයේ ජනතාව ජීවත් වන ඉඩම් කුඩා ඉඩ ප්‍රමාණයකින් යුත් ඉඩම් බැවින්, වටපිටාවට අනතුරුදායක උසක් සහිත ගස් ලෙසට සලකා පවතින පොල් ගස් බොහෝමයක් කැපීමට සිදුව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙයට පිළියමක් ලෙස උස අඩු ඉහළ ඵලදාවක් දරණ පොල් පැළ බෙදා දීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සඳහා සී 65 නමැති පොල් විශේෂයේ යෝග්‍යතාවය පිළිබඳව ගරු සභාපතිතුමා විසින් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනියගෙන් විමසීමක් කරන ලදී.

දෙමුහුම් විශේෂ කුඩා කාලයේදී පටන් ඵලදාව ලබා දෙන අතර වසර 40 - 60ක් දක්වා හොඳ ඵලදාවක් ලබා දෙන බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

වඩා යෝග්‍ය විසඳුම වනුයේ දෙමුහුම් විශේෂ (Hybrid Type) කෙරෙහි අවධානය යොමු කිරීම බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට දෙමුහුම් පොල් පැළයක විකුණුම් මිල රු. 400ක් බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

සෑම නිවසකම පොල් පැලයක් සිටුවීම අනිවාර්යය කිරීමේ හැකියාව සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් කරන ලදී.

එවැනි නීතියක් ගෙන ඒමේ හැකියාවක් නොමැති නමුත් එවැනි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙසට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන් සහ ප්‍රාදේශීය සභා සභාපතිවරුන් දැනුවත් කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පළාත් පාලන ආයතන සඳහා ක්‍රියාත්මක කෙරෙන "ශ්‍රී සම්පත දොරින් දොරට" නම් වැඩසටහන යටතේ නව නිවසක් සාදන සෑම පුද්ගලයෙකුටම නොමිලේ සහ යම් මුදලකට යන ක්‍රම ද්විත්වය යටතේම පොල් පැල 02ක් බැගින් ලබා දෙන බවත් තවදුරටත් එවැනි වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන බවත් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

### 3.14.3 පොල් ඉඩම් කැබලි කිරීම

පොල් ඉඩම් කැබලි කිරීම සම්බන්ධව කිසිඳු වගකිවයුතු නිලධාරියෙකු වග නොකියන බවත් හෙක්ටයාර හතරකට අඩු පොල් ඉඩම් කැබලි කිරීම සඳහා අනුමැතියක් අවශ්‍ය නොවන බවට අදාළ පනතේ සඳහන් වීම ගැටලුවක් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනට පවතින නීතිය අනුව තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ අනුමැතියකින් තොරව හෙක්ටයාර හතරකට අඩු පොල් වතු කැබලි කිරීමට හැකියාව පවතින නමුත් පසුගිය අයවැයෙන් එසේ කැබලි කළ හැකි පොල් වතුවල අවම ප්‍රමාණය හෙක්ටයාර 4 සිට අක්කර 1 දක්වා අඩු කර, අක්කර එකට අඩු ඉඩම් පමණක් වෙන්දේසි කරන ලෙසට සීමා පැනවීමට උපදෙස් ලබා දී ඇති බව පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, ඉදිරියේදී පනත සංශෝධනය කිරීමෙන් පසුව සියලුම කැබලි කිරීමට නියමිත පොල් වතු සඳහා තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වන හෙයින් මෙම ගැටලුව තවදුරටත් පැන නොනඟින බව ද පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තව ද, අක්කර 50ට අඩු රබර් සහ තේ වතු මෙසේ අනුමැතියකින් තොරව කැබලි කිරීමට හැකියාව පවතින බැවින් එය ද ගැටලුවක් බවත් ඉදිරියේදී එම ප්‍රමාණය ද

අඩු කිරීමට පියවර ගත යුතු බවත් තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

පසුගිය තෙවසරක කාලය තුළදී අත්‍යවශ්‍ය මානුෂීය කාරණා මත පමණක් පොල් ඉඩම් බෙදා වෙන් කිරීම සඳහා අවසරය ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.14.4 අත්තනගල්ල ප්‍රදේශය සඳහා තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරියෙකු පත් කිරීම

අත්තනගල්ල ප්‍රදේශය මීත් පෙර තේ වගා කළ ප්‍රදේශයක් නොවුණ ද, මේ වන විට එහි විශාල ලෙස තේ වගාවන් ආරම්භ වී ඇති බැවින් එම ප්‍රදේශය සඳහා තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරියෙකුගේ අවශ්‍යතාව පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

රුවන්වැල්ල, වරකාපොල, අත්තනගල්ල යන ප්‍රාදේශීය තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාස සියල්ල සඳහා එක් තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරියෙකු සිටින බවත් එම නිලධාරි මහතාව මේ සම්බන්ධව දැනුවත් කරන බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි විසින් දැනුම් දෙන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයට තේ වගාව ව්‍යාප්තව ඇති බැවින් මේ වන විට සිටින ගොවීන් සංඛ්‍යාව අනුව රුවන්වැල්ල, වරකාපොල, අත්තනගල්ල තේ පරීක්ෂක ව්‍යාප්ති කොට්ඨාසය කොට්ඨාස 02ක් බවට පත් කිරීමට අවශ්‍ය සාකච්ඡා සිදු වෙමින් පවතින බව ද කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

රුවන්වැල්ල, වරකාපොල සහ අත්තනගල්ල යන ප්‍රදේශ සියල්ල එක්ව ගත් කළ විශාල ප්‍රදේශයක් බැවින් එම කටයුත්ත කඩිනම් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 3.14.5 කුරුඳු වගාව සම්බන්ධව පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

අත්තනගල්ල ප්‍රදේශයේ මහා පරිමාණයෙන් කුරුඳු වගාව සිදුකළ ද ඒ සම්බන්ධව ගොවීන් සතුව ප්‍රමාණවත් දැනුමක් නොමැති බැවින් හැකි ඉක්මණින් එම ගොවීන් වෙනුවෙන් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම පුහුණුව පැවැත්වීම සඳහා වේයන්ගොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉඩපහසුකම් ලබා දිය හැකි බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

හැකි ඉක්මණින් දිනයක් යොදා ගෙන, ගරු මන්ත්‍රීතුමා සමඟ ද සම්බන්ධීකරණය කරමින් මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පැවැත්වීමට පෙර මෙම පුහුණුව පවත්වා අවසන් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

### 3.14.6 කහ අස්වැන්න විකුණා ගැනීමට නොහැකි වීම

තම කහ අස්වැන්න විකුණා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ගොවීන් විශාල ගැටලුවකට මුහුණ දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කහ ආනයනය නතර කළ ද තවමත් නීත්‍යානුකූල නොවන මාර්ගවලින් ඉන්දියාවේ සිට කහ ආනයනය සිදුවීම හේතුවෙන් මෙම ගැටලුව මතුවී ඇති බව ගරු ජානක වක්කුඹුර මහතා විසින් දැනුම් දෙන ලදී.

තත්ත්වය මෙසේ වුව ද, වෙළෙඳපොලේ පවතින කහ කුඩුවල මිලෙහි පහත වැටීමක් දක්නට නොමැති බව ගරු සුදර්ශන දෙනිපිටිය මහතා විසින් දැනුම් දෙන ලදී.

අත්තනගල්ල ප්‍රදේශයේ කහ වගාකරුවන් වෙත අමු කහ අස්වැන්න සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාදාමය සම්බන්ධව ද පුහුණුවක් කඩිනමින් ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

මිල අඩු වුව ද, කහ අපනයනකරුවන් වෙත විදේශවලින් යහපත් ඉල්ලුමක් පවතින බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තම ප්‍රදේශයේ ද කහ වගාකරුවන් මෙම ගැටලුවට මුහුණ දී ඇති බව ගරු සුදත් මංජුල මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.14.7 බුලත් වගාව ආශ්‍රිතව අපනයන ගම්මාන ඇති කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ සෑම නිවසකම පාහේ අපනයන භෝගයක් වන බුලත් වගාව සිදු කෙරෙන බැවින් මෙම ප්‍රදේශවල අපනයන ගම්මාන ඇති කර බුලත් ගොවීන්ව ආරක්ෂා කෙරෙන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බුලත් වගාව ආශ්‍රිතව ඇති වෙන රෝගය හේතුවෙන් ඇතැම් කාලවලදී මෙම වගාවන් සම්පූර්ණයෙන්ම විනාශ වන බවත් එම කාලවලදී මෙම ගොවීන් දැඩි අසරණභාවයට පත් වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු සමන්ප්‍රිය හේරත් මහතා අදහස් දක්වන ලදී.

මෙම රෝගය සම්බන්ධව සහ අනෙකුත් කටයුතු පිළිබඳ සොයා බැලීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ගරු මන්ත්‍රීතුමා සමඟ ද සම්බන්ධීකරණය කරමින් මේ සඳහා යොදවන ලෙසට ගරු සභාපතිතුමා විසින් එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) වෙත උපදෙස් ලබා දෙන ලදී.

තව ද, ලබන වසරේදී බුලත් කණු වැනි අවශ්‍ය භෞතික සම්පත් ලබා ගැනීම සඳහා අවශ්‍ය ආධාර ලබා දීමටද බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අපනයන ගම්මාන ඇති කිරීමේ වැඩසටහන යටතේ මෙම ප්‍රදේශයේ ද බුලත් අපනයන ගම්මාන ඇති කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක වූ නමුත් මේ වන

විට එම වැඩසටහන නතරව ඇති බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තම ප්‍රදේශයේ බුලත් ගොවියන්ට ද බුලත් අස්වැන්න විකුණා ගැනීමට නොහැකි වීමේ ගැටලුවට මුහුණ පෑමට සිදුව ඇති බව ගරු සුදත් මංජුල මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.14.8 සී/ස කුරුණෑගල වැවිලි සමාගමට අයත් ඉඩම්වල පොල් පැණි නිෂ්පාදනය කිරීම අඩාල වීම

අත්තනගල්ල ප්‍රදේශයේ ඇති සී/ස කුරුණෑගල වැවිලි සමාගමට අයත් ඉඩම්වල පොල් පැණි නිෂ්පාදන කිරීම මේ වන විට ක්‍රියාත්මක නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

වර්ෂාව කාලයේ මෙම වැඩසටහන සඳහා යම් බාධාවක් පැවතිය ද මේ වන විට එම කටයුතු නැවත ආරම්භ කර ඇති බව සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි විසින් දැනුම් දෙන ලදී.

අත්තනගල්ල ප්‍රදේශයේ මෙම ක්‍රියාවලිය නිසි ලෙස සිදු නොවන බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන බැවින් ඒ පිළිබඳව විශේෂයෙන් පරීක්ෂා කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

### 3.14.9 පොලිස් ස්ථානයක් පිහිටුවීම සඳහා ඉඩමක් ලබා ගැනීම

තම ප්‍රදේශයේ පොලිස් ස්ථානයක් පිහිටුවීම සඳහා සී/ස කුරුණෑගල වැවිලි සමාගමට අයත් ඌරාපොල නාගොඩ ප්‍රදේශයේ ඇති ඉඩම් කැබැල්ලක් ලබා දෙන ලෙසට වසර කිහිපයක සිට ඉල්ලීම් කළ ද මෙතෙක් එය ඉටු වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ඉඩම් කොටස පරීක්ෂා කර බලා කඩිනමින් වෙන් කර දෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

## 3.15 ගරු සුදත් මංජුල මහතා

### 3.15.1 කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් නව කාර්යාලයක් සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම

ගරු කනක හේරත් මහතාගේ යෝජනාවකට අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අයත් ප්‍රාදේශීය කාර්යාල සංකීර්ණයක් සිය මැතිවරණ කොට්ඨාසයේ ඉදි කර මෑතකදී විවෘත කළ නමුත් මෙතෙක් ඒ සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ ලැබී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් මිලදී ගැනීම් පමා වීමත් සමඟ මෙම තත්ත්වය උද්ගත වූ බවත් මේ වන විට මෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර මුදල් අමාත්‍යාංශයෙන් මෙම භාණ්ඩ ලබා දීම සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් ඉදිරි සතිය තුළ මෙම උපකරණ ලබා දිය හැකි බවත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි විසින් දැනුම් දෙන ලදී.

### 3.15.2 රබර් මිල පහළ යාම

පසුගිය වකවානුවේ රු. 750/-ක් පමණ වූ රබර් මිල මේ වන විට රු. 300/-ක් පමණ දක්වා පහත වැටී ඇති බවත් මෙයට ප්‍රධාන හේතුව රබර් ආනයනය කිරීම බවට සමාජ මතයක් පැතිර යන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එහි සත්‍යතාවක් පවතී නම් රබර් වගාකරුවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඩොලර් බිලියනයක පමණ ආදායමක් මෙරටට රැගෙන එන ඇතැම් නිෂ්පාදන කර්මාන්තශාලා විසින් ආයෝජන මණ්ඩලයට (BOI) අයත් සමාගම් හරහා මෙලෙස දීර්ඝ කාලයක සිට රබර් යම් ප්‍රමාණයක් ආනයනය කර ඇති බවත් මෙම ඇතැම් ආයෝජන මණ්ඩලයට (BOI) අයත් සමාගම් මෙරටට සම්බන්ධයක් නොමැති විදේශ සමාගම් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඊට අමතරව මෙම වසරේ හතරවන කාර්තුවේදී ලෝක වෙළෙඳපොළේ රබර් ඇතුළු සෑම අපනයන භෝගයකම මිල අඩු වී ඇති අතර මේ වන විට එම රබර් මිල පවතිනුයේ රු. 350 - 400 අතර බවත් එය ලබන වසර වන විට රු. 500ක් පමණ දක්වා ඉහළ යා හැකි බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගැටලුව පිළිබඳ දීර්ඝ ලෙස සලකා බැලීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලයේ නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර එමඟින් මෙරට රබර් අවශ්‍යතාව, මෙරට රබර් නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කළ යුතු ප්‍රමාණය පිළිබඳ මාසිකව සමාලෝචනයක් සහ පුරෝකතනයක් සිදු කර ඒ අනුව ඉදිරි පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පසුගිය කාලයේ පැවති ඉහළ රබර් මිලට හේතු වූයේ කොරෝනා වසංගතයත් සමඟ රබර් අත්වැසුම් ආදී නිමි භාණ්ඩවලට පැවති අධික ඉල්ලුම සහ ලොව පුරා රබර් සැපයුම් ජාලය බිඳ වැටීම බව ද ගරු සභාපතිතුමා වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ වන විට වගාකරුවන් සතුව පැවති රබර් ප්‍රමාණය සමාගම් විසින් මිළදී ගෙන ඇති බවත් රබර් ආනයනය දැනට නතර කර ඇති අතර මෙරට වෙළෙඳපොළෙන් රබර් මිලදී ගැනීමට අදාළ සමාගම් එකඟතාව දැක්වූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද ඉල්ලුම, සැපයුම සහ වෙළෙඳපොළ මත රබර් මිල තීරණය වන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නමුත් ලොව අන් රටවල රබර් මිළ අඩු වූ පසු මෙරටින් ඉහළ මිලකට රබර් මිලදී ගැනීම තුළින් එම සමාගම්වලට තම නිමි භාණ්ඩ ලෝක වෙළෙඳපොළේ තරඟකාරී මිළකට අලෙවි කිරීමට නොහැකි වීම ගැටලුවක් බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අනවශ්‍ය ලෙස රබර් මෙරටට ආනයනය කිරීම නැවැත්වීමට ඒ සඳහා පත් කළ කමිටුව සමඟ එක්ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දෙන ලදී.

මේ වන විට මේ සම්බන්ධව කරුණු විමර්ශනය කරමින් පවතින බව ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

### 3.15.3 මී මැසි පාලන ගම්මාන ඇති කිරීම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් පවත්වන ලද මී මැසි පාලනය පිළිබඳ පුහුණුව ලැබූ තම ප්‍රදේශයේ ගම්මාන කිහිපයක් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ලෙස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද මෙතෙක් එය ආරම්භ වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මී මැසි පෙට්ටි 5000ක් මිලදී ගැනීම සඳහා පසුගිය වකවානුවේදී ප්‍රතිපාදන වෙන් කරන ලද බව ගරු ජානක වක්කුඹුර මහතා විසින් දැනුම් දෙන ලදී.

එම ප්‍රතිපාදන ඇත්නම් මෙම කාර්යය සඳහා කඩිනමින් යොදවන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.15.4 කුරුඳු තැලීම සම්බන්ධව පුහුණු වැඩසටහනක් ලබා ගැනීම

තම ප්‍රදේශයේ කුරුඳු වගා කරුවන්ට කුරුඳු තැලීම සඳහා වෙනත් ප්‍රදේශවල කුරුඳු තලන්නන්ගේ සේවාව ලබා ගැනීමට සිදුව ඇති බැවින් තම ප්‍රදේශයේ ජනතාවට කුරුඳු තැලීම සම්බන්ධව පුහුණු වැඩසටහනක් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම පුහුණුව ඉදිරි මාසයක කාලය තුළ පවත්වන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.15.5 වැවිලි සමාගම් විසින් ඉඩම් නිදහස් නොකිරීම

නිවාස සාදා ගැනීම සඳහා ඉඩම් නොමැති පුද්ගලයින් මෙන්ම නායයාම්, ගංවතුර වැනි තත්ත්වයන් හේතුවෙන් නව ඉඩම් අවශ්‍ය වන විශාල පුද්ගලයින් ප්‍රමාණයක් තම ප්‍රදේශයේ සිටින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ජංගම සේවා පවත්වා මෙම පුද්ගලයින් හඳුනා ගෙන ඇතත්, කැලණිවැලි වැවිලි සමාගම සහ මල්වත්ත වැවිලි සමාගම මඟින් මොවුන්ට ලබා දීම සඳහා ඉඩම් නිදහස් කිරීම නිසි පරිදි සිදු නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ඉඩම් රජයට පවරා ගැනීමට අවශ්‍ය නීති කෙටුම්පත් මේ වන විට සම්පාදනය කෙරෙමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.16 ගරු සුදර්ශන දෙනිපිටිය මහතා

### 3.16.1 මී මැසි පාලනය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය නොවීම

බණ්ඩාරවෙල පිහිටි ශ්‍රී ලංකාවේ පවතින එකම මී මැසි පාලන පුහුණු ආයතනයේ පුහුණුව ලද ජනතාව සඳහා මී මැසි පාලනය ආරම්භ කිරීමට අවශ්‍ය මී මැසි පෙට්ටි

ඇතුළු උපකරණ ලබා දෙමින්, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.16.2 කඳු පන්තිවල නිවාස සංකීර්ණ ඉදි කිරීම

බණ්ඩාරවෙල ප්‍රදේශයේ වතු සමාගම්වලට අයත් කඳුවල තැනින් තැන නිවාස සංකීර්ණ ඉදිකර ඇති අතර එමඟින් පරිසර අලංකරණයට ද දැඩි බලපෑම් එල්ලවී ඇති බැවින්, ඒ පිලිබඳ නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.16.3 කඳුකර ප්‍රදේශයේ ජල පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම

වතු සමාගම් විසින් කඳුකර ප්‍රදේශයේ ජල පෝෂිත ප්‍රදේශ තමන්ට අයත් සේ සලකා කටයුතු කරන බවත් එම ප්‍රදේශවල පවතින ගස් කපා බිම හෙලන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය හරහා මේ පිළිබඳව අදාළ වැවිලි සමාගම් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.16.4 කඳුකර ප්‍රදේශයේ පයිනස් ගස් වෙනුවට ටර්පන්ටයින් ගස් සිටුවීම

නමුණුකුල වැවිලි සමාගම විසින් කඳුකර ප්‍රදේශයේ පයිනස් ගස් ඉවත් කර ඒ වෙනුවට ටර්පන්ටයින් ගස් සිටුවීමට කටයුතු කරන බවත් මෙමඟින්, ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් පයිනස් ගස් ඉවත් කිරීමට ගත් ක්‍රියාමාර්ගය එල රහිත වී වඩාත් බරපතල හානියක් සිදු වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම ක්‍රියාමාර්ගය නැවැත්වීමට අවශ්‍ය පියවර ගෙන ටර්පන්ටයින් ශාක වෙනුවට මෙරටට ආවේණික ශාකයක් යොදා ගන්නා ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ටර්පන්ටයින් පැළ නිෂ්පාදනය කරනුයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් බැවින් ඔවුන්ව ද මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව අදාළ අංශ දැනුවත් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

### 3.16.5 කඳුකර ප්‍රදේශයේ වැවිලි සමාගම් සතු ඉඩ ප්‍රමාණයේ මායිම් නිරවුල් කර ගැනීම

කඳුකර ප්‍රදේශයේ පවතින වැව් ද වතු සමාගම් විසින් අයිති කර ගෙන ඇති නමුත් නිත්‍යානුකූලව ඔවුන්ට අයිතියක් නොමැති බවත් මෙම සමාගම් විසින් මෙම වැව්

ආශ්‍රිතව කිසිදු කාර්යයක් සිදු කිරීම සඳහා අවසර නොදෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, වතු සමාගම් වෙත නිත්‍යානුකූලව ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය ඔවුනට නැවතත් මැනුම් කර හෝ වෙන් කර දීමට ඇති හැකියාව පිළිබඳ පරීක්ෂා කරන ලෙසට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය කාලයේ කැඩැස්තර මිනුම් මඟින් මෙම මායිම් සිතියම්ගත කළ ද, නිරවුල් නොවන ප්‍රශ්නගත මායිම් එම අවස්ථාවේදී සිතියම්ගත නොකළ බැවින් එම කැඩැස්තර මිනුම් මඟින් මේ සඳහා නිවැරදි අවබෝධයක් ලබා ගත නොහැකි බව තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 3.16.6 දෙමෝදර තාක්ෂණ උද්‍යානයක් ඉදිකිරීම සඳහා භූමියක් ලබා ගැනීම

දෙමෝදර තාක්ෂණ උද්‍යානයක් ඉදිකිරීම සඳහා නමුණුකුල වැවිලි සමාගමේ දෙමෝදර කර්මාන්තශාලාවට අයත් ගොඩනැගිල්ලක් ලබා ගැනීමට ඉල්ලුම් කළ ද, මෙතෙක් ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලද අතර එම ගොඩනැගිල්ල ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ද ඉල්ලීමක් කරන ලදී.

**4.** කාරක සභාව ප.ව. 01.15 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.